# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.03.17

වර්ෂ 2021 ක් වූ මාර්තු මස 17 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ මාර්තු මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රිනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>01) 2021-02-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021-02-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2021-02-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** 2021-02-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

සංශෝධන නැතිබවයි පෙනෙන්නේ.

2021-02-16 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාපතිවරයා විදියට මට විශේෂ කාරණයක් කියන්න තියෙනවා. මොකද අපිට සේවකයන් කිහිපදෙනෙක්ගේම අඩුපාඩු තියෙනවා. විශේෂයෙන්ම රියදුරන් දෙදෙනෙක්ගේ. ඒ වගේම ළඟදී සරත් මහත්මයා විශ්‍රාම යනවා. ඉතිං ඒ ආකාරයෙන් ගත්තම නව බඳවා ගැනීම්වලට තවම පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය දෙන්නේ නැහැ. පෙර පාසල් පාලිකාතුමියකුත් විශ්‍රාම යනවා. නමුත් මේ නව බඳවාගැනීම් වලට අනුමැතිය තාම හිමි වෙලා නැහැ. ඒ නිසා මෙතන එදිනෙදා කටයුතු කර ගෙන යාමේ යම් කිසි අඩුපාඩුවක් සමහර වෙලාවට මතු වෙනවා. ඒ වගේම කවුරුත් දන්න කාරණයකුත් තියෙනවා. වීදි පහන් නඩත්තුවේදී අපේ අභ්‍යන්තර ගැටළුවක් වෙලා එක්කෙනෙක්ව මම විදුලි අංශයෙන් අයින් කරා. ඒක හින්දා අපිට හසන්ත මහතා විතරයි විදුලි කාර්මිකයෙක් විදියට ඉන්නේ. ඔහු නිවාඩු ගියපු වෙලාවට ඒක ආවරණය කිරීමේ ගැටළුවක් තිබුණා. ඒ වගේම සෙනසුරාදා සහ ඉරිදා දිනවල සේවය කිරීමේ ගැටළුව තිබුණා. අපි උප කාර්යාලයේ හිටපු රෝහණ මහතාව නැවත මෙහෙට ගෙන්නුවා. හසන්ත මහතා නිවාඩු දිනවලට ඒ වැඩ කරන්න තමයි අපි එයාව යෙදෙව්වේ. ඉතිං ඒ ආකාරයෙන් ගත්තම පරිපාලනය පිළිබඳව ගැටළු තියෙනවා.

දැන් තවත් ගැටළුවක් මතු වෙලා තිබුණා වීදි පහන් නඩත්තුවේදී. සතියේ දින පහම මන්ත්‍රීවරුන්ට වෙන වෙනම යොදවලා තිබුණා. ඉතිං ඒක මම වෙනස් කරන්න කටයුතු කරනවා ඉදිරියේදී. දවස් හතරකට එක දවසක් ඉඩ තියාගෙන, ඒ වගේම සෙනසුරාදා දිනය අනිවාර්යයෙන්ම පොතේ වැඩ කරවන්නත් තමයි යොදවන්න හිතන් ඉන්නේ. ඉතිං ඒක ගැන මන්ත්‍රීවරු දැනුවත් වෙන්න ඕන. දවස් හතරකට එක දවසක් එහෙම යොදවනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඇයි සභාපතිතුමා දවස් හතරකට එක දවසක් නිදහස් කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිදහස් කරන්න හේතුව උදාහරණයකට ගත්තම, අද දිනය තියෙන මන්ත්‍රීවරයාට මේ අය නිවාඩුවක් ගත්තම හරි, වෙනත් කාරණයකට වාහනය යෙදෙව්වම හරි ඒ දිනය නැවත එනකම් දෙන්න වෙන්නේ නැහැ. දැන් ඉඩක් තිබ්බොත් ඒ අතර මැද මොකක් හරි ප්‍රශ්නයක් වුණාම ඒක වෙනස් කරන්න පුළුවන් ඒ ඉඩ තියෙන දිනයට. නැත්නම් හැමදාම උදේට අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ඒක බලාපොරොත්තු වෙනවා. උදේට මෙතනට ඇවිල්ලා ඉන්නවා. එතකොට නිවාඩු අරගෙන හරි වෙනත් කාරණයකට යෙදෙව්වම ඒ අදාළ කොට්ඨාශයට ඒ දිනය යෙදවෙන්නේ නැහැ. පහුගිය ටිකේම ඒ ප්‍රශ්නය තිබුණා. උදාහරණයකට අද වෙනකම් මට එක දිනයක් වෙන් කර ගන්න බැරි වුණා. ලයිට් ගෙනල්ලා දැන් සති තුනකට වැඩියි. අද වෙනකම් මට එක දිනයක් වෙන් කර ගන්න බැරි වුණා ඔය ප්‍රශ්නය හින්දා. මගේ දිනය මට වෙන කාට හරි දෙන්න සිද්ධ වෙනවා අර වගේ අඩුපාඩුවක් වෙච්ච ගමන්. ඒක හින්දා පොතේ ඉතුරු වෙන වැඩ වලටයි, අනෙක් ඒවා කරන්නයි සතියකට එක දිනයක් ඉතුරු කරන්න සිදු වෙනවා.

(ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අද දවසේ මමත් මේ සම්බන්ධව කතා කරන්න ඕන ගරු සභාපතිතුමනි. ඇත්ත වශයෙන්ම මම පහුගිය මැතිවරණයේදී මේ ප්‍රාදේශීය සභාවට කොට්ඨාශ මන්ත්‍රීවරයෙක් වශයෙන් තේරුණා. මන්ත්‍රීවරු 11 ක් පාලක පක්ෂයෙන් තේරුණා. මම විතරක් විරුද්ධ පක්ෂයෙන් තේරුණා. ඇත්තටම මම හරිම කණගාටු වෙනවා සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව. පහුගිය දවස්වල සංවර්ධන යෝජනා ගැන කියන කොට කිවුවා 2015 දී මම සංවර්ධන යෝජනා ගෙනල්ලා වැඩ කරා කියලා. දැන් එදා ඉඳලා මේ වන තෙක් අවුරුදු හතරක්, පහක් පහු වෙලා තියෙනවා. ගිංතොට ප්‍රදේශයට මේ සභා අරමුදල් වලින් වැඩ කරලා තියෙන්නේ ලක්ෂ 10 යි. ගිංතොට කොට්ඨාශයට එච්චරයි වැඩ කරලා තියෙන්නේ. එතකොට දැන් අපිත් පිට පළාත් වලට යනවා. සභා අරමුදල් වලින් ඒ ප්‍රදේශවල විශාල සංවර්ධන යෝජනා කරලා තියෙනවා. නමුත් කොට්ඨාශ මන්ත්‍රීවරයෙක් වශයෙන් මගේ කොට්ඨාශයට දීලා තියෙන්නේ තවම ලක්ෂ 10 යි. මම වෙන කවුරු හරි ලවා වැඩ කරන්න ඕනනේ කොට්ඨාශයට. එතකොට මෙතනදී අපිට පේන්නේ අර ජාතිවාදී විදියට හැසිරෙනවා වගේ. වෙන මුකුත් නෙමෙයි හේතුව කුරුඳුවත්ත කොට්ඨාශය මුස්ලිම් ජනතාව ජීවත් වෙන කොට්ඨාශයක්. උඹලට මොකටද කරන්නේ කියන තත්ත්වයට තමයි දැන් පත්වෙලා තියෙන්නේ. උඹලට මොකටද කරන්නේ, උඹලට අපි

කරන්නේ නැහැ කියන මට්ටමක් තියෙන්නේ. අපි මෙහේ කරනවා කියනවා. එතකොට මම දැන් පහුගිය දවස් වලදී ගත්තා මේ සභාව පත් වුණ දවසේ ඉඳලා නොවැම්බර් මාසය වෙනකම් සභා අරමුදල් වලින් කරපු සංවර්ධන යෝජනා. හැම කොට්ඨාශයකටම විශාල යෝජනා ප්‍රමාණයක් කරලා තියෙනවා. නමුත් කුරුඳුවත්ත කොට්ඨාශයේ කරලා තියෙන්නේ එක යෝජනාවයි. ඒ වගේම වීදි ලාම්පු සවි කිරීම ගැන මම මේ සභාවේදී අනන්ත වාරයක් කතා කරලා තියෙනවා. කැඩිච්ච වීදි ලාම්පු කිහිපයක් තියෙනවා කියලා තියෙනවා. ලයිට් පත්තු වෙන්නේ නැහැ ඒවාගේ. ස්විච් එකයි, මේවා එකයි විතරයි තියෙන්නේ. කොච්චරවත් මම කතා කරලා සභාවට කියනවා ඒ ලයිට් ටික මාරු කරලා දෙන්න කියලා. කෝටි ගාණක ලයිට් ගෙනල්ලා තියෙනවා පහුගිය කාලයේදී. මට හිතන්නේ මේ සභාවට මම ආපු දවසේ ඉඳලා මේ කොට්ඨාශයේ ටියුබ් ලයිට් ගලවලා ලයිට් දහයක් උපරිම දාලා ඇති. මාරු කරලා ඇති උපරිම 10 ක් මේ අවුරුදු ගාණටම. ඊට අමතරව එල්.ඊ.ඩී. ලයිට් සෙට් ගෙනල්ලා තියෙනවා. ඒවා හයි කරන කොට කොට්ඨාශ මන්ත්‍රීවරයා විදියට මම ඉන්නවා. අපේ කොට්ඨාශයේ අපේක්ෂකයෙකුත් නොවන, අපේක්ෂකයෙකුගේ පුතෙක් ඉන්නවා. එයා ගිහින් කියනවලු සංවිධායකතුමාට මෙහෙමයි කියලා. සංවිධායකතුමා මම හිතන්නේ බුද්ධිමත් කෙනෙක්. වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා බුද්ධිමතෙක්. එතුමා ඒ ආකාරයට හැසිරීම ගැන මම කණගාටුවට පත්වෙනවා. හේතුව වඩුඩ් හිටපු මන්ත්‍රීතුමාගේ පුතා ඉන්නේ කොළඹ. එයා ගමට එන්නේ සතියට දවසයි. ගමේ ඉන්නේ සතියට එක දවසයි. ඉරිදට විතරයි ඉන්නේ. ගමේ සිද්ධ වෙන මෙලොව දෙයක් එයා දන්නේ නැහැ. නමුත් එයා ගිහිල්ලා රමේෂ් පතිරණ ඇමතිතුමාට කිවුවම එතුමත් බය වෙනවා. ඒ නිසා අපිට දෙන්නේ නැහැ. වීදි ලාම්පු හදන්න කියලා එක දවසක්වත් අපිට අවස්ථාව දෙන්නේ නැහැ. ඔබතුමා අද රෑට යන්න බලන්න ගිංතොටට. මාස හතරක් තිස්සේ මුකුත් කරලා නැහැ. ගිංතොට තියෙන කැඩිච්ච වීදි ලාම්පු ගණන් කරලා කියන්න පුලුවන්. වීදි ලාම්පු 100 කට වැඩිය පිච්චිලා තියෙනවා. මම ගණන් කරලා තියෙනවා 100 කට වැඩිය. මහ හපුගල පල්ලිය ඉස්සරහ ප්‍රධාන පාරේ ලයිට් එක පිච්චිලා තියෙනවා. ඊට මෙහා පැත්තේ එකත් පිච්චිලා තියෙනවා. මම මාස ගාණක් තිස්සේ ඇවිල්ලා සභාවේදී මේ ගැන කියනවා. අද එවන්නම්, හෙට එවන්නම් කියලා කියනවා. නමුත් හෙට තුසිත මන්ත්‍රීතුමා ඉල්ලලා තියෙනවා, අද මෙතුමා ඉල්ලලා තියෙනවා කියලා කියනවා මිසක් වැඩක් කෙරෙන්නේ නැහැ. ඇත්තටම මේ විදියට කුරුඳුවත්ත කොට්ඨාශයට සලකන්න එපා. මේ අනෙක් කොට්ඨාශවල මිනිස්සු වගේම තමයි කුරුඳුවත්ත කොට්ඨාශයේ ඉන්නෙත් මිනිස්සු. අනිත් එක තමයි සභාපතිතුමා කුරුඳුවත්ත කොට්ඨාශය තමයි ලොකුම කොට්ඨාශය. ඡන්ද දායකයෝ පන්දාහකට වැඩිය ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමාට බලන්න පුලුවන් අද දිනයේ කුරුඳුවත්ත කොට්ඨාශයේ වීදි ලාම්පු අලුත්වැඩියා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** ඔබතුමා අද යවලා ඇති. අද සභාව තියෙනවා කියලා දන්නවා. ඒ නිසා යවලා ඇති. මම මේක ගැන සභාවේ කතා කරනවා කියලා දැන ගත්තම යවන්න ඇති. දැන් ගරු සභාපතිතුමා මෙහෙම තව එකක් තියෙනවා. ගිංතොට ප්‍රදේශයේ මිනිස්සු දැන් ලයිට් එකක් පිච්චුණාම ඒක ලියන්න මෙහෙට එන්නේ නැහැ. ඔයගොල්ලොත් ඒක දන්නවා. මුස්ලිම් මිනිස්සුන්ට එහෙම ගිහිල්ලා කියන්න තේරෙන්නේ නැහැ. එහෙම මිනිස්සු ඉන්නේ. ඒ මිනිස්සු ඒක ඇවිල්ලා කියන්නේ අපිට. අපිට ඒක ලිය ලිය ඉන්න වෙලාවක් නැහැ. ඒ නිසා අපි වීදි ලාම්පු හදන්න කියලා තැන් ටික කිවුවම ඒ අය ගිහින් ඒක හදනවා. දැන් මාස ගාණක් තිස්සේ හදන්න එවන්නේ නැහැ. ඒක කරන්න දෙන්නේ නැහැ. අනෙක් එක තමයි සභාපතිතුමා දැන් කම්කරුවෝ ලවා පාරවල් සුද්ධ පවිත්‍ර කරනවා. බලන්න ගිංතොට මොන පාරද, සුද්ධ කරලා තියෙන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැන් එතකොට ඔබතුමාම කියන්න අද සභාවේ න්‍යාය පත්‍රයේ තියෙනවා යෝජනාවක්. ඒකත් මම දැම්මේ ඔබතුමා කියාවි කියලා හිතපු හින්දද. දැන් අද න්‍යාය පත්‍රයේ තියෙනවා මගේ යෝජනාවක් , හතරවෙනි යෝජනාව බලන්න. "කුරුඳුවත්ත, ගිංතොට හාඩ්වෙයාර් අසළ ඇති ඇළ මාර්ගය සහ වැලිපිටිමෝදර භාරද්වාජ මාවතේ කාණුව කුලී පදනම මත ලබාගත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් සහ අප සභාවේ කම්කරුවන් යොදා සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි." දැන් මේක දැම්මේ ඔබතුමා කියාවි කියලද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** සභාවට මන්ත්‍රීවරයෙක් ගෙනාපු යෝජනාවක් මාස හයක් යනකම් තව කෙනෙකුට ගේන්න බැහැ. දැන් ඔබතුමාට මතක ඇති මම මේ සභාවට යෝජනාවක් ගෙනාවා එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවලා ගිංතොට ප්‍රදේශයේ ඇලවල් ටික සුද්ධ පවිත්‍ර කරලා දෙන්න කියලා. ඒ යෝජනාව ගෙනාවට එක දවසක්වත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් දුන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක තමයි මේක පැහැදිළිවම බදු පදනම මත ගන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** මම සභා යෝජනාවක් ගෙනාවා කුලී පදනම මත එක්ස්කැවේටර් යන්ත්‍රයක් ලබා ගන්න කියලා. පොඩ්ඩක් වැස්ස ගමන් ගිංතොට ප්‍රදේශය යට වෙනවා. කොච්චර කිවුවත්, ඒ ඇළවල් ටික සුද්ධ කරලා දෙන්නේ නැහැ. මේ දවස් වල සුද්ධ කරන්න ලේසියි. හේතුව වතුර නැති නිසා ඒක සුද්ධ කරන්න පුලුවන්. ඒ ටික කරන්නේ නැහැ. සභාපතිතුමනි, මම ඇත්තටම

කණගාටු වෙනවා. මම කොට්ඨාශ මන්ත්‍රීවරයෙක්. මම වැඩිම මනාප ප්‍රතිශතයක් අරගෙන පත් වෙච්ච මන්ත්‍රීවරයා. රමේෂ් පතිරණ ඇමතිතුමාටත් මම කතා කරා. ඔබතුමන්ලා කොට්ඨාශ දීනලා ආපු මන්ත්‍රීවරු විදියට පිටින් වෙන කවුරුහරි ඇවිත් කොට්ඨාශයේ වැඩ කරනවාට ඔබතුමන්ලා කැමතිද, මෙහෙම කරන්න බැහැනේ. කෙලින්ම ඔයගොල්ලෝ ඒක කිවුවානේ. ලියනගේ මන්ත්‍රීතුමත් ඒක කිවුවානේ. එහෙම කියන කොට කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට මම ඉන්නවා. එතකොට මම ඉන්දෙද්දී මාව දැනුවත් කරන්නේ නැතුව වැඩ කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමා මෙහෙමයි. අපිට මේ සභාවේ බලය මිනිස්සු විසින් දුන්නා. බහුතරය තියෙන නිසා අපි ඒ විදියට වැඩ කරනවා. ඒක එක කතාවක්. ඔබතුමන්ලගේ සමගි බලවේගයද, මොකක්ද මගුලක් තියෙනවානේ. ඒකෙන් විරෝධතාවයක් කරන්න ගිහිල්ලා මන්ත්‍රීවරු ටික එකතු කර ගන්න බැරුව අද මේ වෙන කොට මෙතනට ඇවිත් බොරු විරෝධයක් පාන්න එපා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා එහෙම කියලා අපිට කතාව රෝල් කරන්න එන්න එපා. දැන් වර්තමාන ආණ්ඩුවේ එහෙම එකක් නැහැ. අපි සීනි සම්බන්ධව, කැලෑ කපන එක සම්බන්ධව කතා කරන්නේ නැහැ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ෆේල්. ඒ විදියට කතා කරන්න එන්න එපා. අපි ඒවා වෙනම කතා කරමු.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පරමියාගොඩ පාරට හැරෙන තැන ලයිට් එක කැඩිලා දැන් අවුරුද්දකට ළඟයි. උක්වත්ත හන්දියට හැරෙන තැන ටියුබ් ලයිට් එක පිච්චිලා දැන් අවුරුද්දකට වැඩියි. මම ඒක කොච්චරවත් කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි මම ඒකට උත්තරයක් දෙන්නම් ඔබතුමා දැන් වාඩි වෙන්නකෝ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකට ඔබතුමා දැනුවත් කරන්න මේ ලයිට් ටික හදලා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන වෙලා තියෙන්නේ වෙන ප්‍රශ්නයක් නෙමෙයි. මම පිළිගන්නවා ඔබතුමා ඒ කොට්ඨාශයේ මහජන නියෝජිතයා කියලා. ඔබතුමාට විශාල බලයක් ඒ කොට්ඨාශයේ ගොඩනැගිලා තියෙනවා. ඒක මම බොහොම පැහැදිළිව පිළිගන්න කාරණාවක්. ඔබතුමත් එක්ක තමයි ඒ කොට්ඨාශයේ විශාල පිරිසක් ඉන්නේ. ඒක මම නැහැයි කියන්නෙත් නැහැ. නමුත් ඔතන තියෙනවා ලොකු අර්බුදයක් මනාප සටන පිළිබඳව. එහෙම ලොකු අර්බුදයක් නිර්මාණය වෙච්ච තැනක් ඔතන. මෙතනින් වාහනය ගියාම ඔබතුමත් යනවා, බබා රියාසුත් යනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම යන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැත්තේ නැහැ. ඔබතුමා වාහනයේ නැගලා යනවා. බැහැයි කියන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම යන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ ඒක වැරදියි කියන එක නෙමෙයි. ඔබතුමා ලයිට් වාහනයේ නැගලා ගියා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එක දවසක් හරි මම ඒ වහනයේ නැගලා ගියා කියලා ඔප්පු කරොත් මම මේ සභාවෙන් අයින් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි වාහනයෙන් හරි බයිසිකලයෙන් හරි ඔබතුමා ගියා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** බයිසිකලයෙන්වත් යන්නේ නැහැ මම.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අර කෝබ්‍රා ලයිට් සවි කරන කොට ගියානේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමාට කිවුවා එල්.ඊ.ඩී. ලයිට් තුනක් ගිංතොට ප්‍රදේශයේ සවි කරන්න කියලා. සවි කරන්න ඕන තැන් තුනත් මම කිවුවා. මම ගියේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ ලයිට් තුන හයි කරා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ ලයිට් තුන සවිකරන්න ගියාම වඩුඩ් මන්ත්‍රීතුමාගේ පුතා ඇවිල්ලා කිවුවලු එයාට එකක් ඕන කියලා. බබා රියාසුත් ඇවිල්ලා එයාටත් එකක් ඕන කිවුවලු. එතනදී ඒ ප්‍රශ්නය විසඳන්න ඕන නිසා මම එතනට ගියා. ප්‍රශ්නය විසඳන්න ගියාට මම ලයිට් සවිකරන තැනට ගියේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉතාමත්ම වගකීමෙන් මේක කියනවා. එහෙම නැත්නම් ඔබතුමාට ඊළඟ සභාවේ කතා කරන්න පුලුවන් මේක ගැන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක මම පිළිගන්නවා. ඔබතුමා මෙතනදී හිර වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට ඊළඟ සභාවේදී මේක ගැන කතා කරන්න පුලුවන් එහෙම නොවෙනවා නම්. මම මේකත් කියන්න ඕන. අනිත් කොට්ඨාශ වලට ලයිට් තුනක් දෙන කොට මේ කොට්ඨාශයට ලයිට් හතරක් දීලා තියෙනවා අලුතෙන් ගෙනාපු වොට් 150 එල්.ඊ.ඩී. ලයිට් සෙට්. ඊළඟට දැන් අටක් දෙනවා කොට්ඨාශයකට. අටක් නෙමෙයි දහයක් දෙනවා. ඒ දහයට ඔබතුමා මට නිශ්චිත තැන් දෙන්න. ඔබතුමාගේ කොට්ඨාශයේ තියෙන කැඩිච්ච ලයිට් වලින් අයින් කරන්න ඕන ලයිට් ටික දෙන්නකෝ. මම සම්පූර්ණයෙන්ම ලබන මාසය ඇතුළත ඊළඟ සභාවට කලින් ඒ ටික ඉවර කරනවා. මම හැබැයි ඉල්ලීමක් කරනවා ලයිට් වාහනයේ පිටිපස්සෙන් යන්න එපා කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම යන්නේ නැහැ. මම 2002 ඉඳලා දේශපාලනය කරනවා. මේ විදියට ලයිට් දැම්මා කියලා, පාරවල් හැදුවා කියලා ඡන්ද දිනන්න බැහැ. එහෙමනම් වැලිපිටිමෝදර කොට්ඨාශය සුගත් මන්ත්‍රීතුමා නෙමෙයි අමිල හිටපු මන්ත්‍රීතුමා දිනන්න ඕන. මොකද එහෙම දිනන්න බැහැ කවදාවත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් හරිනේ. දැන් ඔබතුමාට ගැටළුවක් නැහැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ලබන මාසයේ නෝම්බු පටන් ගන්නවා. ඒ නිසා නෝම්බු වලට කලින් ඔබතුමා ඒක කරන්න.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාසභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අයින් කරන්න ඕන ලයිට් 100 ද තියෙන්නේ, ඒ ලයිට් 100 විස්තර මට දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක නිසා එල්.ඊ.ඩී. ලයිට් සවිකරලා දෙන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් එතුමාගේ ඒවද ඔය. දැන් එතුමා පිටිපස්සෙන් යාවි, අනිත් අය ඉස්සරහින් යාවි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා මෙහෙමයි. ඔබතුමාට තව එකක් කියන්න තියෙනවා. සංවිධායකතුමාටත් වැඩිය ඉහළින් ඉන්න කෙනෙක් ඉන්නවා කියලා මට හිතෙනවා. එතුමා බලපෑම් කරනවා ඇති ඔබතුමාට. සංවිධායකතුමා ඒකට බලපෑම් කරන කෙනෙක් නෙමෙයි. සංවිධායකතුමා ගැන මම හොඳටම දන්නවා. රමේෂ් පතිරණ මැතිතුමා ගැන මම හොඳටම දන්නවා. එතුමා හොඳ බුද්ධිමත් නායකයෙක්. එතුමා කවදාවත් ඒ වගේ පහත් වැඩක් කරන්න යන්නේ නැහැ. ඒක මම පිළිගන්නවා. නමුත් මම හිතන්නේ එතුමාටත් වැඩිය ඉහළින් ඉඳගෙන බලපෑම් කරන කෙනෙක් ඉන්නවා ඇති. නමුත් ඔබතුමා කොට්ඨාශයේ මන්ත්‍රීතුමාගේ ගරුත්වය ආරක්ෂා කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගකීම මම ආරක්ෂා කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙම කරනවාට අපි විරුද්ධයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක කියාස් මන්ත්‍රීතුමාගේ කොට්ඨාශය වුණාට හැබැයි මේක අපේ සභාව. අපේ සභාව වුණාම වඩුඩ් හිටපු මන්ත්‍රීතුමා නැති වෙලාවේ අපි ඒ වැඩ කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ජනාධිපති කෙනෙක් පත්වුණාට පස්සේ ඒ ජනාධිපති ඔබතුමන්ලාගේ ජනාධිපති විතරක් නෙමෙයි. ඒ මුළු රටේම ජනාධිපති. ආණ්ඩුවක් පත් වුණාම ඒ ආණ්ඩුව ඔබතුමන්ලාගේ ආණ්ඩුව විතරක් නෙමෙයි. ඒක මුළු රටේම ආණ්ඩුව. මේ සභාව පත් වුණාට පස්සේ මේක ඔබතුමන්ලාගේ සභාව විතරක් නෙමෙයි මුළු බලප්‍රදේශයේ සභාව. මේ කාටත් සමානව සළකන්න ඕන.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔය කාරණය ඇති.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි මම දැන් කියන්නේ. ගරු සභාපතිතුමනි, මෙතුමා හැමදාම කියන්නේ අර කොට්ඨාශයට මම ප්‍රතිපාදන ගෙනල්ලා වැඩ කරපු එකනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** උදාහරණයක් මම කිවුවේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** හුසේන් මුස්නි සභාපතිවරයා මේ සභාවට පත් වුණේ 1994 වර්ෂයේදී. 1994 ඉඳන් 2002 වෙනකම් හුසේන් මුස්නි සභාපතිතුමා හිටියා. 2002 ඉඳලා මේ වන තෙක් සභාපතිවරු පත් වුණේ අපේ කොට්ඨාශයෙන් නෙමෙයි. සභාපතිවරු හැම කෙනෙක්ම පත් වුණේ පිට පළාත් වලින්. ඩික්සන් රාජා සභාපතිතුමා, පද්මසේන සභාපතිතුමා, මාදුගොඩ සභාපතිතුමා පත්වුණා. ඒ අය කොට්ඨාශ වලට වැඩ කරා. ඒ දවස් වලත්, අපේ කොට්ඨාශවල වැඩ කෙරුනේ නැහැනේ. නමුත් අපි කෑ ගැහුවේ නැහැ. එතකොට වැඩක් කෙරුණෙත් නැහැ. කියන්න කෙනෙකුත් නැහැ. නමුත් දැන් අවුරුදු කීයක්ද, අවුරුදු දහයකටත් වැඩියි. එහෙම අවුරුදු දහයකට වැඩි නිසා පාරවල් කීයක් හදන්න තියෙනවාද, ඉතිං හැමදාම ඒක කිය කිය ඉන්නවා. දැන් අතුරු පාරවලුත් කාපට් කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගමට එන ප්‍රතිපාදන හම්බ වුණේ නැද්ද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගමකට ආපු ලක්ෂ 20 ප්‍රතිපාදන හම්බ වුණේ නැද්ද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි මේ කියන්නේ. සභාවෙන් කරපුවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ ඔක්කොම අපේ දේවල්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මෙහෙමයි. මම පිළිගන්නවා ඔබතුමා කියන කාරණාව. කොට්ඨාශයේ පත්වෙලා ආපු මන්ත්‍රීවරයා වන්නේ ඔබතුමා. ඔබතුමාට ඒ ගෞරවය තියෙන්න ඕන කොට්ඨාශයේ මන්ත්‍රීවරයා හැටියට. ඒක මම කොයි වෙලාවකවත් නැති කරන්න උත්සාහ කරන්නේ නැහැ. අපිටත් විපක්ෂයේ ඉන්න කොට තියෙන ප්‍රශ්න තේරුම් ගන්න ඕන. ආණ්ඩු පක්ෂයේ සභාවක් යන කොටයි, විපක්ෂයේ සභාවක් යන කොටයි ඒක තේරුම් ගැනීමේ හැකියාවක් තියෙන්න ඕන. ඉතිං එතනදී ඔබතුමා පත්වෙන අපහසුතාවය පිළිබඳව මම හොඳටම දන්නවා. නමුත් සභාපතිවරයා විදියට ඔබතුමාගේ ගෞරවය ආරක්ෂා කරනවා කියන එක මම මේ අවස්ථාවේදී කියන්න ඕන. ඒක මම බොහොම පැහැදිලිව කියන කාරණාවක්. ඒකෙදි අනිවාර්යයෙන්ම ලබන සභාවට කලින් මම කිවුවා වගේම වීදි පහන් ටිකේ තියෙන අඩු පාඩු ටික හදනවා. ඒවගේම රජය විදියට සෑම ග්‍රාමසේවා වසමකටමත්, ඔබතුමාගේ කොට්ඨාශයේ තියෙන වසම් දෙකටත් ලක්ෂ 40 ක වැඩ කෙරෙනවා. අනිවාර්යයෙන්ම ඒ වැඩ ටික කෙරෙනවා. ඒකට මමත්, සුගත් මන්ත්‍රීතුමත්, තුසිත මන්ත්‍රීතුමත් ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් කරලා තියෙනවා පාරවල් කිහිපයකටම.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපෙනුත් ඒවාට යෝජනා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාවලුත් දාලා තියෙන්නේ. ඔබතුමා දුන්න යෝජනා දාලා තියෙන්නේ. එහෙම නොවෙනවා නම් කියන්න. මෙන්න මෙහෙම මම යෝජනා දුන්නා, ඒවා නොකෙරෙනවා කියලා කියන්න. ඉතිං ඒ ආකාරයෙන් මේ කොට්ඨාශයටත් සාධාරණයක් කරන එකේ වගකීම අපි කාටත් තියෙනවා. ඉතිං එතනදී මුල් අවුරුද්දේ ලක්ෂ 10 ක ප්‍රතිපාදන ලබා දුන්නා වඩුඩ් හිටපු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි.

(ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වඩුඩ් හිටපු මන්ත්‍රීතුමා එතකොට නැති වෙලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබ්දුල් අසීස් මාවතේ එක පාර ලක්ෂ 10 ක වැඩක් කරා. දැන් මේ සැරෙත් අපි වැඩ කීපයක්ම කරන්න තීරණය කරලා තියෙනවා. ලක්ෂ 20 වැඩ වලින් අතහැරෙන ඒවා සභාවේ කතා කරලා අපි කරමු. ඒක ගැටලුවක් නැහැ. ඒ කොට්ඨාශයට අසාධාරණයක් කරන්නේ නැහැ කියන එක ප්‍රකාශ කරන්න ඕන. ඒ වගේම තමයි හුසේන් මුස්නි සභාපතිතුමා ඉන්න කොට තමන්ගේ කොට්ඨාශයට විතරක් නෙමෙයි අනිත් කොට්ඨාශ වලටත් වැඩ කරා. එතුමා අදටත් ගරු කරන නායකයෙක් කියන එක කියන්න ඕන. එතුමා ජාති භේදයෙන් තොරව වැඩ කරපු නායකයෙක් කියන එකත්, කියන්න ඕන.

**<u>ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ත්‍රිරෝද රථ නතර කිරීමේ ස්ථාන විධිමත් කිරීම, පාලනය කිරීම, අධීක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභා සම්මත කිරීමට යෝජනා කරමි.

මෙක දීර්ඝ කාලයක් සාකච්ඡා වෙච්ච මාතෘකාවක්. මන්ත්‍රීවරු කිහිප දෙනෙකුත් දිගින් දිගටම මෙක ගැන මතු කරා. නමුත් අපිට මේකට ක්‍රියාත්මක වෙන්න බැරි වුණා. අපේ ආදායම් පරීක්ෂක අබේතුංග මහතාට දිගින් දිගටම මම මේ ගැන සඳහන් කරා. එතුමා අතුරු ව්‍යවස්ථාවක් පිළියෙල කරලා අද සභා සම්මුතිය ලබා ගන්න ඉදිරිපත් කරලා තියෙනවා. ඒකට ඔබතුමන්ලාගේ සභා සම්මුතිය අවශ්‍ය වෙනවා. මේ ත්‍රිරෝද රථ අතුරු ව්‍යවස්ථාව හැමෝටම ලබා දීලා තියෙන්නේ. ඒක හින්දා මේකෙ අඩුපාඩු තියෙනවා නම් ඒවා ඉදිරිපත් කරන්න. නැත්නම් අතුරු ව්‍යවස්ථාව විදියට මේක සම්මත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ස්ථිර සහ නීත්‍යානුකූල ත්‍රිරෝද රථ නැවතුම් පොළවල් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම පිළිබඳව පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. අපේ බල ප්‍රදේශයේ ත්‍රි රෝද රථ හිමියන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට ප්‍රායෝගිකව ඇති වෙලා තියෙන ගැටළුව තමයි සමහර නැවතුම්පොළවල් වල එක්තරා පිරිසක් පමණයි එතන පාලනය කරන්නේ. වෙනත් අයගේ ත්‍රිරෝද රථයක් ඒ තැන්වල නවත්තන්න ඉඩ දෙන්නෙත් නැහැ. හැම හන්දියකටම, ඒ නැවතුම්පොළවල් හැම එකකටම තියෙන ප්‍රධාන ගැටළුව තමයි මේක. මේ ත්‍රිරෝද රථ හිමියන් අපේ සභාවේ ලියාපදිංචි වුණාම ඒ ගැටළුවත් බොහෝ දුරට නිරාකරණය වේවි කියලා මම විශ්වාස කරනවා. ඒ වගේම මේකෙ සඳහන් පරිදි දැනට පවත්වා ගෙන යන සමහර නැවතුම්පොළවල් සඳහා ඒ මංසන්දියේ තියෙන ත්‍රිරෝද රථ ප්‍රමාණය නැවැත්වීමේ ඉඩ පහසුකම් මදි. ඒ නිසා මම යෝජනා කරනවා සුදු හෝ කහ පාටින් අඟල් 04 ක් පළල පටි යොදා ගෙන සීමාවල් වෙන් කරන්න කියලා. ඒක හොඳයි. එතකොට අපි උදාහරණයකට ගත්තොත් කහදූව වත්ත, පැලවත්ත, හපුගල මංසන්දිය වගේ තැන්, ඒ ස්ථානවල තියෙන ත්‍රිරෝද රථ සංඛ්‍යාව හුඟක් වැඩියි. ඒවා අපි මේ ක්‍රමයට කරන්න ගියාම පැලවත්ත හන්දියේ ඉඳලා නවත්වන්න වෙන්නේ අපේගම පාරේ. නමුත් අපිට මේ තීරු වෙන් කිරීම නොකර ඉන්න බැහැ. එහෙම තීරු බෙදන්න ඕන. ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී ඉතාමත් කරුණාවෙන් මේක ඉල්ලා සිටිනවා. පැලවත්ත මංසන්දියේ ත්‍රිරෝද රථ හිමියන් අපේ ගම පාරේ බස්රථ නැවතුම්පොළ ආසන්නයේ තමයි ත්‍රි රෝද රථ නවත්වන්නේ. මේවා නවත්වන්න එතන ඉඩක් නැහැ. එතකොට ඔවුන් දීර්ඝ කාලයක් තිස්සේ මේ ඉල්ලීම කරනවා. මේකට මමත් සභා යෝජනාවක් දාලා තියෙනවා. අඩි දෙකක් පළල තියෙන කාණුවට කොන්ක්‍රීට් ස්ලැබ් කැලි ටිකක් යොදලා දෙන්න. එතකොට ඔවුන්ට තව අඩි දෙකක් පාරෙන් මෙහායින් නවත්වන්න පුලුවන්. නමු ත් ඒ යෝජනාව ක්‍රියාත්මක වුණේ නැහැ. ඉතිං ඒ වුණත් ත්‍රිරෝද රථ හිමියන් පිළිබඳව යම් ක්‍රියාමාර්ගයක් ගන්න පුලුවන්වීම ගැන සතුටු වෙනවා. ඒ කාර්යයත් ඉෂ්ඨ කරලා දෙන්න කියලා කරුණාවෙන් මතක් කරනවා. ඒ වගේම අපි නිර්මාණය කරලා තියෙනවා මේකෙ ත්‍රිරෝද රථයේ ඉදිරිපස හෝ පිටුපස සවිකරන්න පුලුවන් සාමාන්‍යයෙන් ආදායම් බලපත්‍රයක හැඩය ගනිපු ඩිසයින් එකක්. ඒකෙ සඳහන් කරලා තියෙනවා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව, ඊට පස්සේ යටින් තියෙනවා ත්‍රිරෝද රථ නැවතුම්පොළ අවසර පත්‍රය, 2021 වර්ෂය, නම, වාහන අංකය, හැඳින්වීමේ අංකය සහ නිකුත් කළ දිනය, සභාපති, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා. එතකොට මෙතනදී ගරු සභාපතිතුමනි හැඳින්වීමේ අංකය කියලා සඳහන් කරන්නේ මොකක්ද කියලා දැන ගන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ රෙජිස්ටර් කරන අංකය. මම කාරක සභා අවස්ථාවක් කරලා ආදායම් පරීක්ෂක අබේතුංග මහතාට අදහස් දක්වන්න අවස්ථාව ලබා දෙන්නම්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඊගාවට සභාපතිතුමනි, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා අපි සඳහන් කරනවා. සාමාන්‍යයෙන් ත්‍රිරෝද රථවල සඳහන් කරන්නේ පොලිස් වසම. පෝද්දල පොලිස් වසම, ගාල්ල පොලිස් වසම ඒ වගේ. නමුත් ඒක කරන එක අපිට බාධාවක් නෙමෙයිනේ. ඒක හොඳයි. නමුත් මේකෙ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා තියෙන යට තීරුවේ හරි, ඒ විදියටම හරි අපිට ගාල්ල දිස්ත්‍රික්කය කියන එක හෝ පොලිස් වසම සඳහන් කළ යුතුයි. ඒක හඳුනා ගැනීමට පහසුයි. මේක අපිට දාන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේතුංග මහතා සමඟ අපි මේ ප්‍රශ්න සාකච්ඡා කරමු. කාරක සභා අවස්ථාවක් කරලා ආදායම් පරීක්ෂක අබේතුංග මහතාට සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව.</u>

කාරක සභා අවස්ථාවේදී ආදායම් පරීක්ෂක විජිත යාපා අබේතුංග මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- පොලීසිය සමඟ එකතු වී ත්‍රීරෝද රථ නැවතුම් පොළවල් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ස්ථාන නිරීක්ෂණය කරන බවත්, පොලීසියේ අවසර ලබා දීම මත අදාළ ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරන බව.
- පොලීසිය විසින් එක් එක් ත්‍රීරෝද රථ නැවතුම්පොළක නවතා තැබිය හැකි ත්‍රීරෝද රථ ප්‍රමාණය තීරණය කරන බව.
- ත්‍රීරෝද රථය වෙනත් ස්ථානයක නවත්වා ගෙන සිට තමන්ගේ අවස්ථාව පැමිණි විට ත්‍රීරෝද රථ නැවතුම්පොළට පැමිණිය හැකි බව.
- බලපත්‍රය සඳහා පළාත් පාලන ආයතන විසින් භාවිතා කරනු ලබන පොදු ආකෘති පත්‍රයක් යොදා ගෙන ඇති බව.
- පොලීසිය විසින් ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීමක් සිදු කරන විට අදාළ පොලිස් ස්ථානයේ නම ඔවුන් විසින් සඳහන් කරන බව.
- මීට අමතරව මේ සම්බන්ධව මන්ත්‍රීවරුන්ට ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ යෝජනාව මම ඉල්ලා අස්කර ගන්නවා. මේක මම ඊළඟ සභාවකට යොමු කරන්න කටයුතු කරන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** යෝජනාව ඉල්ලා අස් කර ගන්න එපා. ඒක කල් තියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 02.** හපුගල යුනිවර්ෂල් සිටි ඉඩමේ ප්‍රදේශවාසීන්ගේ නිෂ්පාදන අලෙවිසැලේ ඉතිරි වැඩ නිම කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** මහා සභා රැස්වීම් සඳහා ලබා ගන්නා සංග්‍රහ අත්තිකාරම් මුදල රු.25,000.00 ක් දක්වා වැඩි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට රුපියල් 20,000.00 ක මුදලක් ලබා ගන්නවා. ඒකෙ පොඩි මදිකමක් පේනවා සංග්‍රහ කටයුතු සඳහා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** කුරුඳුවත්ත, ගිංතොට හාඩ්වෙයාර් අසළ ඇති ඇළ මාර්ගය සහ වැලිපිටිමෝදර භාරද්වාජ මාවතේ කාණුව කුලී පදනම මත ලබාගත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් සහ අප සභාවේ කම්කරුවන් යොදා සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ යෝජනාව සංශෝධනය කරන්න සභාපතිතුමා. මහ හපුගල පල්ලිය ගාව කාණුවක් තියෙනවා. ඒ කොට්ඨාශය තුළ තිබෙන ඇළවල් සහ කාණු පද්ධති සුද්ධ කරන්න කියලා එම යෝජනාව සංශෝධනය කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ විතරක් නෙමෙයි. අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හඳුනාගෙන ඇති ඇළ මාර්ග සහ කාණු පද්ධති සුද්ධ පවිත්‍ර කිරීම සඳහා තාක්ෂණ නිලධාරි නිර්දේශයන් මත කුලී පදනම මත ලබා ගත් එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදවන ලෙස එම යෝජනාව මම සංශෝධනය කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

අපි බදාදා දවසේ මහා සභා රැස්වීම පවත්වන්න යොදා ගත්තේ මාධ්‍යවේදීන්ගේ ඉල්ලීම පරිදි. නමුත් ඒ අය ඇවිත් නැහැ.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගි වීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මාධ්‍යවේදීන් බයයි මේ දවස්වල එන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව නැවත වරක් සලකා බලන්න ඕන.

**05.** මිනිසුන්ගේ යහපැවැත්ම, ආර්ථිකය සහ සමාජීය දියුණුව අරමුණු කරගනිමින් දුම්කොළ සහ මධ්‍යසාර පාලනය තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනතට යෝජිත සංශෝධන (ඇමිණුම 1) ගෙන ඒමටත්, තනි සිගරට් අලෙවිය තහනම් කිරීමටත් අවශ්‍ය නීති සම්මත කර ක්‍රියාත්මක කරන ලෙස අදාළ ආයතන දැනුවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මේවා තහනම් කරන්න වැඩපිළිවෙලක් හදන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** පැකට් පිටින් විකුණන්න මේ හදන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල බලප්‍රදේශයේ කඩවල් වල සිගරට් විකුණන්න එපා කියමු. පොලීසියෙන් පන්නවමු කඩවල් වලට.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල බලප්‍රදේශය තුළ සිගරට් විකුණන එක තහනම් කරන්න බැරිද සභාපතිතුමා. මිනිස්සුන්ගේ ආදායම නැති වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 20 සහ අංක 40 හි ජනවාරි මාසයට අදාළ බදු මුදල් ගෙවීමට අප ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණියද කාර්යාලයේ නිලධාරීන් නිරෝධනයට ලක් කර තිබීම නිසා අදාළ බදු මුදල් ගෙවීමට නොහැකිවීම හේතුවෙන් එම කඩ කාමර දෙක සඳහා දඩ මුදල් රහිතව ජනවාරි මාසය සඳහා බදු මුදල් ගෙවීමට අවස්ථාව ලබාදීමටත්, එම දඩ මුදල් පොත්වලින් කපා හැරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒ වගේ අවස්ථාවලදී බදු මුදල් ගෙවන්න ප්‍රධාන කාර්යාලයට එන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රධාන කාර්යාලයේ තමයි මේක වුණේ. මෙහේ අය නිරෝධායනය වුණානේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාපතිතුමා මේක ප්‍රශ්නයක් නැහැ. මින් ඉදිරියට මේ අයට සභාවේ ගිණුමට මුදල් දාලා රිසිට් පත තියා ගන්න කියන්න. බදු මුදල් ගෙවන අයට ඒක තමයි කරන්න ඕන. එතකොට මෙවැනි ගැටළු ඇති වන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකට වැඩිය මන්ත්‍රීතුමා කලින් කෙරිලා තිබුණා එතනට ගිහිල්ලා බදු මුදල් එකතු කරන එකක්. නමුත් දැන් පහුගිය කාලයේදී ඒක වුණේ නැහැ. ඒවා එකතු කරන්න 10 වෙනිදාට ගියාම හරි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** 2014 වර්ෂයේදී ටෙන්ඩර් කර ලබා දුන් මහ හපුගල එළ හරක් ගව මස් කඩය අප ප්‍රාදේශීය සභාවට නොදන්වා එම වර්ෂයේදීම වසා දමා ඇත. මෙම කඩ කාමරය සභාව සතු නොවන බැවින් අධිකරණ ක්‍රියාමාර්ග හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ග ගත නොහැකි බැවින් සභාව වෙත බඳින ලද තෙමස් ඇප තැන්පත් මුදල වන රු. 240,450.00ක මුදල සභා අරමුදලට ලබා ගැනීමටත්, හිඟ බදු මුදල වන රු. 979,477.00ක මුදලින් එම තෙමස් ඇප තැන්පත් මුදල අඩුකළ පසු ඉතිරි හිඟ බදු මුදල වන රු. 739,027.00 ක මුදල පොත් වලින් කපා හැරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට සභාවේ තියෙන තැන්පත් මුදලට සටහන් හුවමාරු කිරීමක් විතරයි වෙන්නේ. මට තියෙන ප්‍රධාන කාරණය ඊළඟට එනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** බෝපෙ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට අනුබද්ධව බෝපෙ ඉදිකරන ලද නව සායන මධ්‍යස්ථානය සඳහා ප්ලාස්ටික් පුටු 25ක් මිලදීගෙන ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මහ හපුගල සායන මධ්‍යස්ථානයටත් පුටු දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දීලා තියෙනවා. කාලෙකින් ඒකට ගියේ නැතුව ඇති එහෙමනම්. ඒවා බලන්නේ නැහැ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** වැලිපිටිමෝදර සහ කුරුඳුවත්ත ප්‍රදේශ කේන්ද්‍ර කරගෙන කඩ කාමර දෙකක් කුලී පදනම මත අප ප්‍රාදේශීය සභාව වෙත ලබාගෙන එළ ගව මස් අලෙවිසැල් දෙකක් පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර්කර බදු දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගව මස් තහනම් කරන්න බැරිද සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම ඒකට විරුද්ධයි. වැලිපිටිමෝදර කරන එකට මම විරුද්ධයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා යෝජනාවක් දාලා තියෙනවා. අපි තව විශේෂ යෝජනාවකුත් ගෙනල්ලා තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පහුගිය දිනක ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ගව මස් තහනම් කරන්න යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව තුළ මම අද මේ අවස්ථාවේදී අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ගව මස් කඩ තහනම් කරන්න මේ සභාවේ යෝජනාවක් ගේනවා. මොකද ගරු අග්‍රාමාත්‍යතුමාට ඒ යෝජනාව ගේන්න පුලුවන් වුණා වගේම ප්‍රාදේශීය සභාව විදියට අපිටත් ඒ යෝජනාව ගේන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පිළිබඳව අදහස් දක්වනවා නම් ඒක බොහොම ජනප්‍රිය මාතෘකාවක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම ඒකට විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ජනප්‍රිය මාතෘකාවක්. මට ඕක මුල්ම සභාවේදී ගේන්න තිබුණා සභාපතිවරයා විදියට. නමුත් අපි මේ සියලුදේම ප්‍රායෝගික තත්ත්වයන් යටතේ විශේෂයෙන් සලකා බලන්න ඕන. අගමැතිතුමා ඒක ගෙනාවට තාම ඒකට ගැසට් එකක් නිකුත් කරේ නැහැ. ඉතිං එහෙම වුණාම අපිට යෝජනා කරලා මේකට කරන්න දෙයක් නැහැ. ඉබේම ගව මස් කඩ සියල්ල තහනම් වෙනවා. නමුත් ඒක එහෙම වුණේ නැහැ. මම කැමතියි ඒ යෝජනාව ගේන්න. නමුත් නියත වශයෙන්ම මේක නැවත ප්‍රශ්නයක් වෙනවා. ඔබතුමන්ලාට මතක ඇති මම උප කාර්යාලය මෙහෙට ගේන්න යෝජනා කරහම ඔබතුමන්ලා ඒකට කිවුවා බොහොම වැරදි, නරක පූර්වාදර්ශයක් වේවි කියලා තිබුණ එකක් වැහුවම. මෙතෙක් දීර්ඝ කාලයක් තිබුණ උප කාර්යාලය වැහුවා කියාවි. නමුත් අදටත් උප කාර්යාලයට සම්බන්ධ වෙන ගොඩක් අය ඇවිල්ලා කියනවා වැඩක් කර ගන්න ලේසියි ඕක මෙහෙට ගන්න කියලා. එහෙම මතයක් ගොඩක් මිනිස්සු අතර තියෙනවා. අපි ඒකෙදි බැලුවේ උප කාර්යාලය වහලා මෙහෙට ගන්න කියලා. ඒක චෝදනාවක් එන එකක්. මෙතෙක් මස් කඩ දීර්ඝ කාලයක් තිබිලා තියෙනවා බෝපෙ පෝද්දල. ඉතිං බෞද්ධාගමේ සහ සිංහල අය විදියට බහුතරයක් එකතු වෙලා එක විපක්ෂ මන්ත්‍රීවරයෙක් නියෝජනය කරන කොට්ඨාශයක මස් කඩ වහන්න කියලා තීරණය කරොත් ඒක වැරදියි. ඒ අයට ඒක සම්ප්‍රදායික අයිතියක්. ඒ වගේම තමයි සිංහල අය පවා ගිහිල්ලා එහෙන් මස් මිලට ගන්නවා. ඉතිං ඒක තුල මස්කඩ වැහීම පිළිබඳව අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්න ඕන. අනිත් එක මේක මෙතනදී කරන්න බැහැ. ඒකට විධිමත් සභා යෝජනාවක් අපි ගෙනල්ලා කරන්න ඕන දෙයක්. ඔය ගැටලු දෙකම තියෙනවා. ඒකට මගේ මෙහෙම අදහසකුත් තියෙනවා. අපිට මේ මට්ටමෙන් යන්න බැරිනම්, අපිට බැහැ අනුන් පවත්වාගෙන යන මස් කඩ වලට අයකිරීම් කරන්න. එහෙම හැකියාවක් නැහැ. මොකද ඒක අපිට විගණනයේදී ප්‍රශ්නයක් වෙලා තියෙනවා. අපිට ඒකට අය කරන්න හැකියාවක් නැහැ. එක්කෝ ස්ථානය අප සතු වෙන්න ඕන. ගොඩනැගිල්ල අප සතු වෙන්න ඕන. නැත්නම් අපි ගොඩනැගිල්ලක් බදු අරගෙන ඒ ස්ථානයේ මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කරන්න ඕන. ඔය කාරණා දෙක තමයි තියෙන්නේ. එහෙම නොවුණොත් කොහොමත් අපිට ඊළඟට තීරණයක් ගන්න වෙනවා. දැනට රු.13,500.00 ක් විතර අපි සභාවෙන් අතිකාල දීමනා විදියට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ට ගෙවනවා. ඉතිං ඒකෙදි අපිට ආදායමක් එන්නෙත් නැහැ. වැඩෙත් කරගෙන යනවා. අපි මෙහෙන් රු.13,500.00 ක මුදලක් හැම මාසයකම ගෙවනවා. ඉතිං ඒක

හින්දා අපිට එහෙම වුණොත් මේ තත්ත්වය ඉදිරියේදී කරගෙන යන්න බැරි වුණොත්, අඩු මුදලකට කඩ කාමර දෙකක් කුලියට අරගෙන ඒක කරගෙන යන්න බැරි වුණොත් කොහොමත් කරන්න වෙන්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීට සහ පොලීසියට දන්වලා ඔය කරගෙන යන ඒවා වහන්න තමයි. ඒක තමයි කරන්න සිද්ධ වෙන්නේ. ඒක තමයි ඇත්ත යථාර්ථය. මම ඊළඟ සභාව වෙනකොට බලාපොරොත්තු වෙනවා විධිමත් තීරණයක් මේ සම්බන්ධව ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් අපි මෙච්චර කාලයක් මස් කඩ කරගෙන ගිහිල්ලා නැහැනේ. අලුතෙන් අපි තව ස්ථානයක මස් කඩ කරගෙන යන්න ඕන නැහැ කියන එක තමයි අපේ මතය. අපිට විශේෂ යෝජනාවක් විදියට ගෙනල්ලා ඒක වහන්න බැරිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හත්දහසකට අධික ජනතාවක් එදිනෙදා ගව මස් පරිභෝජනය කරනවා. අපි මාලු කනවා වගේ තමයි ඒක. අපි ඒක වැළැක්වීම සාධාරණද, මම කියන්නේ ඒක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ යෝජනාව මම ඉස්සෙල්ලා සභා වාරයේදී ගෙනාවා. මම ඊළඟ සභාවට අලුත් යෝජනාවක් විදියට මේක රමේෂ් මහත්තයාට ගෙනත් දුන්නා ගව මස් කඩ තහනම් කරන්න කියලා න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න. රමේෂ් මහතා කිවුවා මේක සුදුසු නැහැ කියලා. මම ඒ පාර මේ යෝජනාව ඉල්ලා අස් කර ගනිපු අතර වාරයේදී ඔබතුමා දාලා තියෙනවා යෝජනාවක් මේකට. අන්න ඒකයි මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක සභාවට විශාල බලපෑමක් කරන කාරණා දෙකක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකෙන් අපිට ගමට යන්න බැරි වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගමට යන්න බැරි වෙන එක එකක්. මේක අදටත් කරනවා. දැන් ගියත් ඔය මස් කඩ දෙක කරනවා. කුරුඳුවත්තේ එක කරනවා. අපි රු.13,500.00ක් අතිකාල දීමනා ගෙවනවා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට. නමුත් අපිට රුපියලක ආදායමක් එන්නේ නැහැ. වෙනදාට මේකෙන් රුපියල් ලක්ෂ දහයක විතර වාර්ෂික ආදායමක් ආවා. මම මෙතනදී කියන්නේ ආදායම ගැන නෙමෙයි. අදායම් උපයනවා කියන්නේ එක කාරණාවක් විතරයි. නමුත් අපි ඒ මිනිස්සුන්ට සාධාරණයක් කරන්න ඕන. මෙතුමා දැන් සභාව පටන් ගනිද්දිම කිවුවා ජාතිවාදී විදියට, එතුමන්ලාගේ ජාතිය විදියට අපි හින්දා කරනවා කියලා. මෙතනදී මේක ඇවිලෙන ගින්නට පිදුරු දැම්මා වගේ වැඩක් වෙන්නේ. මෙතුමත් සමරවිට වක්‍රාකාරව කැමති වෙයි අපි එකතු වෙලා මේ මස් කඩ වහනවා නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමා කියන විදියට ඇත්තටම මස් කඩ සම්බන්ධව කතා කරන කොට කියන්න ඕන කලේගාන පොළ භූමියෙත් ගව මස් කඩයක් තිබුණා. කලේගාන පොළ භූමියේ මස් කඩය අවුරුදු ගාණක් කරගෙන ගියා. ඒකට මුස්ලිම් මිනිස්සුද ආවේ. ලබුදුවෙත් මස් කඩයක් තිබුණා. එතකොට ඔය ගොල්ලෝ ගිංතොට විතරක් මස් කඩ තහනම් කරන්න එන්න එපා. මේක වැහුවට ගිංතොට ප්‍රදේශයේ මස් කඩ තුනක් තිබුණා වැලිපිටිමෝදර, මහ හපුගල සහ කුරුඳුවත්ත ප්‍රදේශවල. නමුත් දැන් කරගෙන යන්නේ එකයි. කුරුඳුවත්තේ මස් කඩය විතරයි දැන් කරගෙන යන්නේ. ගව මස් කඩ වහන්න අගමැතිතුමා ගෙනාපු යෝජනාව ක්‍රියාත්මක වුණේ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි මෙතනදී ගව මස් කියන්නේ ආහාරයට ලබා ගන්නා දෙයක්. බලප්‍රදේශයේ තියෙන බාර් ටික මුලින් වහලා දාන්න. බාර් වහලා දාන්න කියලා යෝජනාවක් ගේන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එක බාර් එකක් දාන්න දීලා නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම යෝජනාවක් ගේන්නකෝ සභාවට. බාර් නැති වුණාට රෙස්ට්ටුරන්ට් වල වක්‍රාකාරයෙන් තියෙනවානේ. බාර් ලයිෂන් දීලා නැහැ. නමුත් අලුත් ක්‍රමයට චයිනිස් රෙස්ට්ටුරන්ට් දානවා. ඒකෙ බාර් එකක් තියෙනවා. ඉතිං එහෙමත් ගේන්නකෝ චයිනිස් රෙස්ට්ටුරන්ට් වල අරක්කු විකුණන්න බැහැ කියලා. එහෙමත් ගේන්නකෝ. ඒක නිසා ගරු සභාපතිතුමනි, මම මේකට විරුද්ධයි. ඔබතුමා බලන්න ගව මස් කඩ දාන්න බලප්‍රදේශයේ තැන් නැතුව නෙමෙයිනේ. තැන් ඕන තරම් තියෙනවා. දැන් මම එනකොට කතා වුණා අපි කඩ කාමර කුලී පදනම මත අරගෙන කරන එකට විරුද්ධයි කියලා. අපේ සභා බල ප්‍රදේශයේ පොඩි පොඩි ඉඩම් කෑලි තියෙනවා. එහෙම නැතුව නෙමෙයි. පොකුණක් තියෙන ඉඩමක් තියෙනවා අබ්දුල් අසීස් මාවතේ. ඒක සභාවට අරගෙන මස් කඩයක් හදන්න පුලුවන්. එහෙම කරන්න යන්නේ නැතුව තමයි සභාවට කුලී පදනම මත ගොඩනැගිල්ලක් අරගෙන කරන්න හදන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ ඉඩම් කොතනද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අබ්දුල් අසීස් මාවතේ තියෙනවා පොඩි එකක්. නමුත් අපි ටෙන්ඩර් පදනමට අරගෙන ඒක දෙමු. පොඩි ඉඩම් කෑල්ලක් තියෙනවා එතන. අබ්දුල් අසීස් මාවතේ

පොකුණ ගාවත් ඉඩ තියෙනවා. මහ හපුගල පොකුණ ගාවත් ඉඩ තියෙනවා. ඒකත් ඇති. එතනත් හදන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගව මස් පිළිබඳව සාකච්ඡාවක් ගියා. මම මගේ අදහස දක්වන්න ඕන. මොකද හේතුව ඇත්තටම මම දන්නේ නැහැ මෙච්චර දියුණු ලෝකයක මොකක්ද මේ කරන්න හදන වැඩේ කියලා. මට තියෙන ප්‍රශ්නය ඒක. ඒ කියන්නේ අද වෙනකොට වැඩියෙන්ම මස් කන්නේ මුස්ලිම් මිනිස්සුන්ට වැඩිය සිංහල මිනිස්සු. ඒක මම කනවද, ඒ අය කනවද කියන කතාව නෙමෙයි තියෙන්නේ. හැබැයි ඊළඟට සාමාන්‍ය සංඛ්‍යාලේඛන එක්ක ගත්තට පස්සේ අද දවස වෙනකොට නීත්‍යානුකූලව කරගෙන යන මස් කඩ තුන්සිය ගාණක් තියෙනවා. ඒක මෑත ආපු සංඛ්‍යාලේඛන අනුව කිවුවේ. දවසකට පන්දාහස් විතර ගවයන් මස් සඳහා මරණවා. ඊළඟට එකක් තියෙනවා නීත්‍යානුකූල නොවන විදියට කරන නිසා ඊට වඩා වැඩි ප්‍රමාණයක් තියෙනවා. එහෙම ගත්තම අර මුදලටත් වැඩිය මෙහෙට ගෙවන්න ඕන. දැන් මෙතුමන්ලා කැමති එහෙම කරන්න. එතකොට මෙහෙට ගෙවන්න ඕන නැහැ නේ. ඉතිං එකක් තියෙන්නේ මේකෙදී දැන් ඉන්දියාව වගේ රටවල් ගත්තම ශිව ආගම අදහන රටක්. හැබැයි ඒ අයගේ විදේශ වෙළඳපොළට සපයන දේවල් වලින් ප්‍රධාන ආදායම් මාර්ගයක් තමයි මේක. ඒ විතරක් නෙමෙයි මේකෙදී මේ සංඛ්‍යා ලේඛන ටික අරගෙන බලන්න. මේ එන ඒවායින් 20% ක් විතර තියෙන්නේ වස්සෝ. අනිත් අය සිරින්ජර ක්‍රමයට කරන්නේ. නිකං මේක ගණන් කරලා බැලුවම අවුරුදු පහක් යනකොට මිනිස්සුන්ට වැඩිය හරක් වැඩි වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනටත් එහෙමනේ. හරක් වැඩියි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක විතරක් නෙමෙයි. ඇත්තටම එකක් තියෙනවා වැඩෙන වයසට මම හිතන්නේ මස් ටිකකින් පෝෂණය ලැබෙනවා. හරස් මස් විතරක් නෙමෙයි මෙතුමන්ලා නොකෑවට ඌරු මස් වගේ ඒවත් හොඳයි. හැබැයි කුකුල් මස් ගැන නම් නෙමෙයි කියන්නේ. හැබැයි ඒ පෝෂක ගුණය ගන්න බැහැ. අපේ ගෙදරකින් ග්‍රෑම් 250 ක් ගෙනිච්චම පස් හය දෙනෙක් විතර ඒක උයා ගෙන කන එක කරන්නේ. එතකොට කජු ටිකක් කැවෙන්නෙත් නැහැ. වෙජිටේරියන් මිනිස්සු කන්න ඕන වෙනම කෑම ජාති තියෙනවා. ඒවා කන්න අපි හයියක් තියෙන මිනිස්සු නෙමෙයි. ඒ කියන්නේ එළවළු වගේ දේවල් වැඩියෙන් කනවා, ඒවා තම්බලා කනවා, කිරි බොනවා, කජු කනවා. මේවා කරන්න අපිට හයියක් නැහැ. ඉතිං ඒ හින්දා මම හිතන්නේ මේක පසුගාමී තැනකට ගෙනාපු යෝජනාවක්. ගරු අගමැතිතුමාට අපි සලකනවා. ඒක වෙනම කතාවක්. හැබැයි මේක කවුරු ගෙනාවත්, කොයි කාලයක ගෙනාවත් මම හිතන්නේ මේක එහෙම එල දරන්න පුලුවන් එකක් නෙමෙයි. දැන් ඇත්තටම අනිත් පැත්තෙන් නීතියක් තියෙනවා. මේවා අපි ටෙන්ඩර් කරලා දෙනවා කියලා එකක් නැහැ. කොහේ හරි හරක් මස් දාලා විකුණනවා නම් කඩවල්වල අපිට ඒක තහනම් කරන්න බැහැ. එහෙම නම් කුකුල් මසුත් තහනම් කරන්න ඕන. හරකා මරන්න තහනම් කියලා එකක් නැහැ. හරකාගේ නිරෝගීකම, බර ඒවා බලන එක කරන්නේ. ඒවා ඌරාටත් අයිතියි. ඉතිං ඒක නිසා මම හිතන්නේ මේක සංවාදයට යායුතු මාතෘකාවක්. ඒ කියන්නේ මොකද ඒකට හේතුව මේ සභාවේ ඉඳගෙන කෙලින් හෝ මාත් ඒකට විරුද්ධයි කිවුවා. සුගත් මන්ත්‍රීතුමන්ලා බොහොම සද්භාවයෙන් මේක ගෙනාවේ. නොකන කට්ටිය නොකයි, කන කට්ටිය කාවි. නමුත් එකක් තියෙන්නේ මේක බහු වාර්ගික, බහු ආගමික රාජ්‍යයක්. ඉතිං ඒක හින්දා අපි මේ හැම ජන කොට්ඨාශයක් ගැනම බලන්න ඕන. ජන කොට්ඨාශය ගැන නෙමෙයි මගේ ප්‍රධාන කතාව තියෙන්නේ. මගේ ප්‍රධාන කතාව තියෙන්නේ වැඩෙන ළමයින්ට පෝෂණය අත්‍යාවශ්‍යයයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හරි අබේසේකර මන්ත්‍රීතුමා වැඩෙන කෙනෙක් විදියට මස් කෑල්ලක් කාලා ඉන්න. මම කියන්නේ අපි සභාවෙන් දාන්නේ නැහැ. වෙනත් මට්ටමකින් ඒක කරගෙන යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කිසි තැනක නැති වැඩක්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට ඒකෙදිත් ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම විරුද්ධයි ඒකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම අද ඔබතුමාගේ ලියුමට අත්සන් කරාට මේකෙ ප්‍රශ්නයක් තියෙනවා. ඇත්තටම කවුරුහරි කිවුවොත් එහෙම සභාවෙන් ටෙන්ඩර් කරාට කවුරුවත් ගන්නේ නැහැ. නමුත් කඩවල මස් විකුණනවා. හැබැයි ඒක තහනම් කරන්න බැහැ. අද ඕනම කඩයක මස් තියෙනවානේ. සුපර් මාර්කට් එකකට යන්නකෝ මස් තියෙනවා. ඒ විතරක් නෙමෙයි අරක්කු ගැන කිවුවා. කාගිල්ස්, අරවා මේවාට දාන්න හැම තැනම තියෙන. බොන කෙනෙක් බොයි, නොබොන කෙනෙක් නොබී ඉදීවි. ඒක දැම්මා කියලා රටට ලොකු හානියක් වෙන්නේ නැහැ. ඒක දන්නේ නැත්නම් ඒකට කරන්න දෙයක් නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** කසිප්පු වලට ඔය මුකුත් ඕන නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මස් කඩ පවත්වාගෙන යන එක නවත්වන්න පුලුවන්නේ. ඒකෙ ගැටළුවක් නැහැ. අපිට ඒක සභාවේ යෝජනාවක් අනුව කරන්න පුලුවන්. නමුත් ෆාම් ෂොප් වල, ෆුඩ්සිටිවල මස් විකුණන එක අපිට නවත්වන්න බැහැ. අපේ සභාවට ආදායමක් ලබමින් යන මේ ක්‍රියාවලිය නතර කරොත් ගිංතොට තියෙන ෆුඩ්සිටිවල එළහරක් මස් විකුණාවි. කාගිල්ස් එකේ විකුණාවි. ඒකනේ ඇත්ත තත්ත්වය. අපි ගරු අගමැතිතුමාට යෝජනාවක් යවන්න ඕන කියලා මම යෝජනා කරනවා. අපි සභාවක් හැටියට අගමැතිතුමාට ඒ යොජනාව ක්‍රියාත්මක කරන්න කියලා යවමු. එතකොට මේක කරාවි. ඒක තමයි ඵලදායක.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අගමැතිතුමා යෝජනාවක් කරා හරක් මරණ එක තහනම් කරන්න. නමුත් ගෝල්ඩ් ආයතනයෙන් මස් එවනවා අපිට. අපේ කඩ වල මස් විකුණන්නේ නැහැනේ. අපි රු.1200.00 ක් දීලා බලපත්‍රය ගත්තොත් විකුණන්න පුලුවන්. අපිට හැම මස් ජාතියක්ම කඩෙන් ගන්න පුලුවන්. මස් මරණ එක බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ නවත්වන්න පුලුවන්. වෙන කොහෙ හරි ගිහින් මරලා මහජන සෞඛ්‍ය පරීක්ෂක කෙනෙක්ට පෙන්වලා ගේන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කොහේවත් මරන්නේ නැහැ. මෙහේ මරන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක තමයි කියන්නේ. දැන් ඔය කොච්චර තහනම් කරත් ඒක කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු හරක් දෙන්නෙක්ට බලපත්‍රය දුන්නොත් පස් දෙනෙක් මරණවා. ඇත්ත කතාව ඒකයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** දැනුත් කෝන්ගහ හන්දියට ගියාම ඕන විදියකට මස් ගන්න තියෙනවා. කිසිම බලපත්‍රයක් නැහැ. ඒ මස් පැකට් කරලා, ලේබල් කරලා, කඩවල් වලට එවනවා විකුණන්න. මෙහේ ඌරෝ ඇත්තෙත් නැහැ. ඌරු මස් විකුණන්න එනවා. එළු මසුත් විකුණන්න එනවා. ඒ නිසා බොරු වැඩක් මේක. කන කෙනෙක් කාවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව ගැන මොකද කියන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඔය යෝජනාවෙන් සභාවට ඇත්ත වශයෙන්ම වෙන්නේ මේකයි. හරක් මසුත් එක්ක තුනපහත් දාලා විකුණනවානම් ඒක තුනපහ කඩයක්.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** සභාවෙන් නැවත කඩ ඉදිකිරීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඕක නවත්වන්න ඕනත් නැහැ. ඔය යන විදියට ඕක යන්න අරින්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. යන විදියට යන්න දෙන්න බැහැනේ. අපිට සත පහක ආදායමක් නැතුව රු.13,500.00ක් මහජන සෞඛ්‍ය පරීක්ෂකට ගෙවාගෙනනේ යන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒක ගෙවන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලක්ෂ දහයක ආදායමක් එනවා වාර්ෂිකව එක කඩයකින්. කඩ දෙකෙන් ලක්ෂ විස්සක විතර ආදායමක් එනවා වාර්ෂිකව. ඒකත් අත ඇරලා, ඔක්කොම අතහැරලා අපි අතින් ගෙවාගෙන යනවා. එහෙම නැත්නම් කරන්න ඕන මහජන සෞඛ්‍ය පරීක්ෂකට දන්වලා, පොලීසියට දන්වලා මේක වහාම නවත්වන එක.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මෙහේ එක නවත්වන්න පුලුවන්. නමුත් අපේ බලප්‍රදේශය තුළ මස් විකුණන එක නවත්වන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ යෝජනාවේ තියෙන්නේ අපි කුලියට කඩ කාමරයක් අරගෙන කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. මගේ අදහස මෙච්චරයි. ඕක ජාතික ප්‍රතිපත්තියක් විදියට ඇවිල්ලා ගැසට් එකකින් ඇවිත් නවත්වනවා ඇරෙන්න අපි දැන් මෙහේ බෝපෙ පෝද්දල ජනප්‍රිය වෙන්න, අපේ මේක නැතෙයි කියන්න නැවැත්තුවොත් අපිට ජාතියක් විදියට ප්‍රශ්නයක් වෙනවා. ඒක වළක්වන්න බැහැ. නමුත් මේ වැඩේ නවතින්නෙත් නැහැ. මේ වැඩේ කෙරෙනවා. මේ වැඩේ අපිට ආදායමකුත් නැතුව, මුකුත් නැතුව කෙරෙනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ මාර්කට් එක ඉහළ යාවි. අර පොලීසියේ අයට දඩය ඉහළ යනකොට එන වාසිය වගේම මේක නැවැත්තුවම එන වාසිය අපි දන්නවා. වැඩේ කෙරේවි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිතුමා මෙහෙමයි. මේකෙ තියෙන්නේ අපිට බදු පදනම මත ලබා ගන්න කියලා. ඒකෙ තියෙන නීත්‍යානුකූල තත්ත්වය මොකක්ද, ගොඩනැගිල්ලක් අරගෙන අපි බදු දෙනවා කියන එකේදී අපිට කරන්න වෙන්නේ අතරමැදි කාර්යයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නැත්නම් අපිට අයිතිය තියෙන ඉඩම් කැලි දෙකක් බලලා කඩ කාමර දෙකක් හදනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි සාමාන්‍යයෙන් ව්‍යාපාර වලින් ආදායම් ගන්නවානේ කොන්දේසි මත. ව්‍යාපාරයක් කරන කොට පිරිවැටුමට අදාළව ආදායම් බදු ගන්නවා. ඒ නිසා මස් කඩයක් සඳහා වෙනම බද්දක් නිර්මාණය කරන්න බැරිද, එතකොට ඒ ප්‍රමිතියෙන් පවත්වාගෙන යන්න ඒ අවස්ථාව දෙන්න ඕන මොකක් හරි කොන්දේසි මාලාවකට. එතකොට ඒක ප්‍රමිතියකින්, අපේ අධීක්ෂණය යටතේ කරන්න පුලුවන්. ඒකට අපි මුදලක් අය කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට වාර්ෂික බලපත්‍රයට රුපියල් තුන්දාහයි ගන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා. අලුත්ගම ප්‍රදේශයේ මස්කඩ පල්ලියෙන් තමයි ගන්නේ. පල්ලියෙන් අරගෙන ටෙන්ඩර් කරලා දෙනවා. එතකොට නීතිමය බාධාවක් නැහැ. එහෙම නැත්නම් අපිට තැනක් හොයා ගන්න එක මහා ලොකු දෙයක් නෙමෙයි. තැන් දෙකක් සොයා ගෙන කඩ කාමර දෙකක් හදා ගත්තා නම් කරන්න පුලුවන්. නැත්නම් තැන් දෙකක් බද්දට අරගෙන ඒක ටෙන්ඩර් කරලා දෙමු. ඒක ප්‍රශ්නයක් නෙමෙයි. සභාවට ගමු කුලියට කඩ කාමර දෙකක්. අපේ තැන හදා ගත්තට පස්සේ ටෙන්ඩර් කරලා දෙමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාව මේ අනෙක් ව්‍යාපාර වලට ගොඩනැගිලි සපයලා දෙනවා නම් සභාව මේ පහසුකම් සපයන එකේ ප්‍රශ්නයක් නෙමෙයි තියෙන්නේ. මම කියන්නේ මේකෙදී අපි ගැන විතරක් කල්පනා කරන්න හොඳ නැහැ. ඒ ජන කොට්ඨාශයේ ප්‍රශ්නයක් සහ ඒ සියල්ල තියෙනවා. ඒක අපිට බලපානවා. අපි කැමති දේ තහනම් කරොත් අපිට මොකද වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ තව එකක්. අනිත් එක අබේසේකර මන්ත්‍රීතුමා කිවුවා වගේ මෙහෙන් ගිංතොටට ගිහින් කොච්චර මස් ගේනවද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** රත්ගමත් තියෙනවා මස් කඩයක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි විවේචනය කරන එක මගේ පෞද්ගලික වුවමනාවකින් කරන තහවුරුවක් නෙමෙයි වෙන්න ඕන. අපි විවේචනයක් කරනවා නම් ඒක පොදු වැරැද්දක් වෙන්න ඕන. ඒකෙන් කාටහරි හානියක් සිද්ධ වෙනවා නම් ඒක කරන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම කරමු. අපි උත්සාහයක් දරමු. මේ විදියට මේක කරන්න බැරිනම් අපි මේක අතහැරලා දාමු.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වෙනදා ටෙන්ඩර් කරලා දෙනවා වගේ කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ කරන්නේ ගොඩනැගිල්ලක් බද්දට අරගෙන අපි අතුරු බදු දෙන එක. මේක ගැලපෙනවාද, අපි ගොඩනැගිල්ලක් කුලියට අරගෙන අතුරු බදු දීමකට මේ සූදානම් වෙන්නේ. සභාව ගොඩනැගිල්ලක් ඉදිකරලා කරත් විශාල මුදල් ප්‍රමාණයක් වැය වෙන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමනි, සභාවකින් කරන්න ඕන ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ඨ කරන එක. ඒ සම්බන්ධව සභාවට වගකීමක් තියෙනවා. ඒ නිසා ජනතාව ගැන හිතන්න ඕන. මෙවැනි අවස්ථාවකදී ඉඩම් කැල්ලක් අරගෙන හරි ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් පෙනී ඉන්න ඕන. ඒක කරන්න ඕන. එතකොට ඒකෙ ගෞරවය සභාවටනේ එන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඉඩම් තියෙනවාද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඉඩම් තියෙනවා. සභාවෙන් ඉඩම් කැල්ලක් අරගෙන හරි ඒක කරගෙන යන්න ඕන. ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් සභාව පෙනී ඉන්න ඕන. ප්‍රධාන පාරක් ආසන්නයේ තියෙන්න ඕන නැහැ. සභාවට අපි ඉඩම් කැල්ලක් ගමු. ලැලි ගහලා හරි කඩ කාමරයක් හදමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම කරමුකෝ. මේ යෝජනාව හරි, මේ යෝජනාවට සංශෝධනයක් එකතු කරලා හරි කරමු. තව ස්ථාන තියෙනවාද කියලා බලමු සභාව සතු ඉඩම් මෙහෙට කඩ කාමර දෙකක් හදන්න පුලුවන් විදියේ. එහෙම නැත්නම් ඔය කරගෙන යන කෙනාට සභාවට

බදු මුදලක් ගෙවලා කරගෙන යන්න පුලුවන්ද කියන අදහස මෙතනදී බලපානවා. අපි ඒ විදියට මේක යෝජනා කරගමු.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒක හොඳයි. සභාවට බදු මුදලක් ගෙවලා කරගෙන යන්න කියන්න. අලුතෙන් හදන්න එපා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාවේ ඉඩම් දෙකක හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම කරමුකෝ. මේකට අපි කලින් කියපු එක එකතු කරලා බලමු මොකක්ද කරනේනේ කියලා. එහෙම බැරි වුණොත් නවත්වනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ අතුරු බදු දීමේ ක්‍රියාවලිය කරන්න අපිට පුලුවන්ද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ජනතා අවශ්‍යතාවයන් වෙනුවෙන් සභාවට කරන්න පුලුවන් දේවල් ගොඩක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මස් කඩ යෝජනාවට මම විරුද්ධයි. ඒක ස්ථිර කරන්න බැහැ. අලුතෙන් කඩ සභාවෙන් ඉදිකරන්න එපා කියන තැන මම ඉන්නේ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** සභාපතිතුමා මටත් ඒ සම්බන්ධව කතා කරන්න ඕන. මම හිතන්නේ අපි සියළු දෙනාම ඒකට විරුද්ධයි. මොකද දැන් සභාපතිතුමාගේ තව යෝජනාවක් ඉදිරිපත් වුණා දුම්වැටි විරෝධයක් සම්බන්ධව. ඔබතුමාම ඊළඟ යෝජනාව දානවා මේකට. ඒ විදියට එනකොට ඇත්තටම අපිටත් ගැටළුවක් තියෙනවා. මම හිතන්නේ ඔබතුමා බලතල තියෙන නිලධාරියෙක් විදියට මේ සම්බන්ධව සම්පූර්ණයෙන්ම විරුද්ධ වීමේ අයිතිය ඔබතුමාට තියෙනවා. එහෙම කරනවා නම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන මට පුද්ගලික මතය ප්‍රකාශ කරන්න බැහැ මන්ත්‍රීතුමිය. ඔබතුමියට පුළුවන් ලබුදුවේ හින්දා තමන්ගේ පුද්ගලික මතය ප්‍රකාශ කරන්න. නමුත් මම බලප්‍රදේශය වෙනුවෙන් කතා කරන්නේ. මම මුළු බලප්‍රදේශයටම සභාපතිවරයා. අවුරුදු ගාණක්, සභාව එන්නත් කලින් ඉඳගෙන තිබිච්ච ඒවා මේ. මේ මස් කඩ මම ඇවිල්ලා නැතිකරන්න බැහැ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** සභාවට එන ආදායම වෙනුවෙන් ඔයිට වැඩිය දේවල් කරන්න වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදායම නෙමෙයි. ඔබතුමිය කඬේට ගිහිල්ලා කුකුල් මස් ගේනවද, ඔබතුමිය බලන්න ඔය මස් කඩ වලට ගිහිල්ලා හරක් මස් ගේන්නේ අපේ අය කුකුල් මස් ගේනවා වගේ තමයි.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** නමුත් අපේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. අපි විරුද්ධයි මේකට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි කියන්නේ සභාවක් විදියට ඒක කරන එක වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ මන්ත්‍රීතුමා. එහෙම නම් ඉතිං තීරණයක් ගන්න වෙනවා. ඒ තීරණය තමයි අපිට මස් කඩ නවත්වන්න වෙනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ඉතිං ඒ තීරණය ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාර කතාවක්නේ ඒක. මේ අනාදිමත් කාලයක ඉඳන් ආපු මස් කඩ නවත්වන්න කියලා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා අනාදිමත් කාලයක ඉඳන් සභාවෙන් මස් කඩ කරලා නැහැනේ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** මස් මොනවත් කන්න එපා. එතකොට හරිනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** සභාපතිතුමා, ප්‍රශ්නයක් ඇති කර ගත යුතු නැහැ. ඔබතුමා ප්‍රශ්නයක් ඇති නොවන ලෙස කටයුතු කළ යුතුයි. සභාපතිතුමා කියන එක අපි පිළිගන්නවා. හැබැයි අපි කියන්නේ අලුතින් මස් කඩ දාන්න එපා. තියෙන එක කරගෙන යන්න කියන්න. ඒවා නවත්වන්නත් එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාම ඔබතුමන්ලට පැහැදිළි නැහැනේ මන්ත්‍රීතුමා මම කියන එක.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** සභාවෙන් ආයේ මස් කඩ දාන්න යන්න එපා. හරක් මස් කඩ දාන්න යන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඔබතුමාට කියන එක තේරෙන්නේ නැහැ. මෙතෙක් සභාව මස් කඩ කරගෙන ගිහිල්ලා තියෙනවා. මස් කඩ තුනක් කරපු වෙලාවල් තියෙනවා. මස් කඩ හතරක් කරපු වෙලාවලුත් තියෙනවා. ඒ කරේ කාගේ හරි තියෙන කඩයකට ටෙන්ඩර් කරලා බදු ගන්න එක. මේක තේරුම් ගන්න ඕන. එයා කරන ව්‍යාපාරයට අපි මෙහෙන් ටෙන්ඩර් එකක් කරලා බදු ගත්තා. නමුත් දැන් විගණනයෙන් ඇවිත් දිගටම කියනවා එහෙම ගන්න බැහැ කියලා. අපේ යටතේ තියෙන මස් කඩයකට විතරයි එහෙම බද්දක් ගන්න පුලුවන්. තේරුණාද මේ කාරණය. දැන් අපි මේ අවුරුද්දක් විතර, මාස 08 ක් විතර බදු මුකුත් ගෙවන්නේ නැති නිසා අතහැරලා දාලා තියෙන කොට ඒ අය මස් කඩය කරගෙන යනවා. රු.13,500.00ක විතර අපි ගෙවනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂකට. ඔය විදියට තමයි දැන් මාස 08 ක් විතර ගියේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** හරි. ඒ මස් කඩ වලට කියන්න සම්පූර්ණයෙන්ම ඒ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ට දෙන මුදල සභාවට ගෙවන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒක විගණනයෙන් කරන්න බැහැ කියලා තියෙනවා. ඒ අය ගෙවන්නෙත් නැහැ, අපිට අය කර ගන්න ක්‍රමයකුත් නැහැ. ඒක තමයි මම මේ කලින් එකක් කපා හරින්නත් යෝජනාවක් ගෙනාවේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** විශේෂ යෝජනාවක් තියෙනවා ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ තියෙන්නේ ඒක මගේ හත්වෙනි යෝජනාව විදියට එහෙම කපා හරින එක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභා යෝජනාවක් කරනවා. අපේ සභා බලප්‍රදේශය තුළ ගව මස් කඩයක් කරනවා නම් මෙන්න මේක තමයි බදු මුදල කියලා ගන්න. එතකොට කරන්න පුලුවන්. ඒක ඉවරයි. අපි ඒකට අමතර මුදලක් එකතු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ස්ථානයකුත් නැතුව, අපිට මුකුත් නැතුව කරන්න පුලුවන්ද, මට මන්ත්‍රීවරු ඒක විවෘතව කියන්න මොකක්ද කරන්නේ කියලා. අපිට අපේ භූමියක් නැතුව අය කරන්න බැරිනම්, එක්කෝ නිකං අයාලේ යන විදියට කර ගෙන යන්න දෙන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ජන වර්ග කිහිපයක්ම ජීවත් වෙනවා. එක එක්කෙනාගේ ආගම් වලට අනුව ඒ කටයුතු සිදු වෙනවා. එතකොට මෙතෙක් පවත්වන ලද මස් කඩ ක්‍රමවේදය අපේ අගමැතිතුමා ගැසට් එකකින් නිකුත් කරහම සභාව විදියට අපි ඒ නීතිය ක්‍රියාත්මක කරමු. හැබැයි අපි කියන්නේ ඒ වෙනකම් ඔබතුමා මධ්‍යස්ථව කටයුතු කරන්න ඕනනේ මෙතන. මුස්ලිම් ජනතාවට, දෙමළ ජනතාවට, සිංහල ජනතාවට, ඒ සියලු ජනතාවට සාධාරණයක් වෙන විදියට සභාවෙන් ඒ අවශ්‍ය අවසරය අරගෙන කටයුතු කරන්න කියලා අපි යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මේක තහනම් කරොත් මස් කිලෝ එක රුපියල් දෙදාහට, තුන්දාහට යනවා. මේ වැඩෙත් කෙරෙනවා. නිලධාරීන්ටත් හොඳයි. අපිට චෝදනාවක් විතරයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේකට නීත්‍යානුකූලභාවයක් ඇති කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට කරන්න පුලුවන් මස් කඩ නොදා ඉන්න එක විතරයි. විකිණීම තහනම් කරන්න බැහැ. මම කොහොමද විකිණීම තහනම් කරන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** විකීම තහනම් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විකිණීම කිසිම විදියකින් තහනම් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා, ගිංතොට මස් කඩය පවත්වාගෙන යන ව්‍යාපාරිකයා ඉන්නවානේ. එයාගේ කඩයක් හැටියට කර ගෙන යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා, මෙතන අපි තීරණ දෙකයි ගන්න ඕන. එක්කෝ මේක අපේ පාලනයට අරගෙන කරනවද, එහෙම නැත්නම් මේක අතඇරලා දාලා පාඩුවේ ඉන්නවාද, ඔය දෙක විතරයි තීරණය කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාවේ ඉඩම් තියෙනවානේ ඔය ප්‍රදේශවල. ඕකට ලොකු තැනක් ඕන වෙන්නේ නැහැ. කඩ කාමරය බ්ලොක් ගල් වලින් බඳින්න පුලුවන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ලෑලි ගහලා හදලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන නෙමෙයිනේ ප්‍රශ්නය තියෙන්නේ. දැන් කියනවානේ මේක අපේ යටතේ කරන්න එපා කියලා. ලියනගේ මන්ත්‍රීතුමා එහෙම යෝජනා කරනවානේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මස් කඩ කීයක් අපි පවත්වා ගෙන ආවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හතරක් කරා. දැන් දෙකක් තියෙනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ පවත්වාගෙන ආපු ඒවාට දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මම හරි සතුටු වුණා අගමැතිතුමා ඒ යෝජනාව ගෙනාවම. එතකොට අපි ඉබේටම නිදහස් වෙලා මේක ලස්සනට වෙනවා. නමුත් ඒක දැනට යෝජනාවක් විතරයිනේ. එතුමා ගැසට් එකක් මඟින් ගේනවා නම් අපිට මෙතන කතා කරන්න දේකුත් නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අනිත් එක ගරු සභාපතිතුමනි, පනතේ තියෙනවා උත්සව, මඟුල් ගෙවල් වලට, භාරහාර ඔප්පු කරන ඒවාට අනුමැතිය. ඒවාට පනතින් අනුමැතිය තියෙනවා. එතකොට ඒ මිනිස්සුන්ට පුලුවන් ඒවාට අනුමැතිය අරගෙන කරන්න. ඒක අරගෙන ආවාට පස්සේ විකුණන්න තහනම් කරන්න බැහැනේ. ඒකෙන් සභාවට ආදායමක් නැති වෙන එක විතරයි වෙන්නේ. ඒක කරගෙන යාවී ඒ මිනිස්සු ලස්සනට. පර්මිට් එකක් දාලා ඒකට අවසර අරගෙන කවර වලට මස් දාලා විකුණනවා. මරන්නනේ දැන් බැරි. එතකොට මරන්න අවසර ගන්නවනේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** දැන් ගව මස් කඩය පවත්වා ගෙන යන ව්‍යාපාරිකයා එයාගේ ස්ථානයකනේ ඒක පවත්වා ගෙන යන්නේ. දැන් අපි සභාවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා යන නිසා අතිකාල දීමනා ගෙවීමක් කරනවා කියනවානේ. එතකොට අපි ඒ රු.13,500.00 ක් සභාවේ මහජන මුදල් වලින්නේ ගෙවන්නේ. එතකොට ගවමස් කඩයක් පවත්වා ගෙන යන කොට සභාවට කුලිය කීයක් ගෙවන්න ඕනද, සාමාන්‍ය ව්‍යාපාරිකයෙක් කරනවා නම්.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** රුපියල් එක් දහස් දෙසීයක් හරි, තුන්දාහක් හරි. තුන්දාහයි වැඩිම වුණොත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒත් අවුරුද්දකට රු.1000.00 යි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එතකොට අපිට සභා තීරණයක් මත එළ ගව මස් කඩයකින් අය කරන බද්ද වැඩි කිරීමේ ක්‍රමවේදයක් තියෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක පනතෙන් කරන්න බැහැ ඒ කියන්නේ. එතකොට අපි මේ කරන්නේ පාඩු වැඩක්. රු.13,500.00 ක් හැම මාසයකම පාඩුවක්. මේවා මහජන මුදල්. මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ අධීක්ෂණයක් නැතුව කිසිසේත්ම එළ ගව මස් විකුණන්න බැහැ. ඒවා ඉක්මනින් නරක් වෙනවා. හරක් මස් වල කුකුල් මස් වලට වැඩිය නරක් වීමේ හැකියාව වැඩියි. ඒ නිසා අධීක්ෂණයක් තියෙන්න ඕන. මේක ගැන සභාව විදියට බලලා තීරණයකට එනවා නම් හොඳයි. ඒ නිසා මම යෝජනා කරන්නේ නැවතත් ගරු අගමැතිතුමාට අපේ ලියනගේ මන්ත්‍රීතුමා අත්සන් කරවපු ලියුමට තව ලියුමකුත් අමුණලා සභාපතිතුමාගේ අත්සනින් යවන්න මේ එළ හරක් මැරීම නතර කරන්න කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක කෙරෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ආසියාවේ ලොකුම මස් කඩය තියෙන්නෙත් මෙහේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ආසියාවේ ලොකුම මස් සැපයුම් කරන ආයතනය තියෙන්නේ ලංකාවේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක තමයි අපි කියන්නේ මෙහේ නවත්වන්න කියලා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සභාපතිතුමා කරගෙන යන මස් කඩ දෙක නීත්‍යානුකූල තත්ත්වයකට පත් කරන්නකෝ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කඩ දෙකක් කුලියට අරගෙන ටෙන්ඩර් කරලා කරගෙන යන්න පුලුවන්නේ. ඒක කර ගන්න පුලුවන්නේ අපිට. මේක මහා ලොකු දෙයක් නෙමෙයි. කඩ කාමර දෙකක් අරගෙන ටෙන්ඩර් කරලා දෙන්න පුලුවන් සභාවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවට ආදායම් මුකුත් ඕන නැහැ. දැනට පවත්වා ගෙන යන විදියටම යනවා. මට තේරෙනවා වෙන දේ. දැනට පවත්වා ගෙන යන විදියට කරගෙන ගියාම ඉවරයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒකෙන් සභාවට තමයි පාඩුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං කරන්න දෙයක් නැහැනේ. වැඩේ ඉවර කරන්නත් බැහැ. කරගෙන යන්නත් ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා කියන කාරණය පැහැදිළියි. මට ප්‍රශ්නයක් තියෙනවා. සභාව හඳුනා ගනිපු තැනක මේ මස් කඩ ස්ථාපනය කරෝතින් අපිට කර ගෙන යන්න පුලුවන්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පුලුවන්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එහෙම පුලුවන් නම් සභාපතිතුමනි අපි කියන්නේ සභාවට ඒ ආදායමත් එන්න ඕන. මොකද ඒකේ අතුරු ප්‍රතිඵලය මම දන්න විදියට අපි හරක් මරණ එක තහනම් කරාට පස්සෙත් හරක් හොරාට මරනවා. එතකොට ඉල්ලුම වැඩි වෙනවා. එතකොට මස් මිල වැඩි වෙලා ජාවාරමක් විදියට ඒක කරනවා. එහෙම කරන කොට ලොකු ප්‍රශ්නයක් එනවා සභාවට. ඒ නිසා මම කියන්නේ සභාවට ආදායමක් එන්නත් ඕන නම් අළුතින් ස්ථාපනය කරන්න එපා. තියෙන මස් කඩ අපි සභාවෙන් හදලා දෙන තැනකට ගෙනිහිල්ලා ඒ ආදායම සභාවට ගමු.

(ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි කරන්න යෝජනා කරේ. මම දැන් ඒක හරියට දැක්කේ. මන්ත්‍රීවරු 13 දෙනෙක් අත්සන් කරලා ලියුමක් දීලා තියෙනවා. "ගව මස් අලෙවිසැල් අප ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යාම නොකළ යුතු බවටත්, ගව මස් අලෙවිසැල් සඳහා අනුමැතිය ලබා නොදිය යුතු බවටත්, යෝජනා කරමි." කියලා මන්ත්‍රීවරු 13 දෙනෙක් අත්සන් කරලා ලියුමක් දීලා තියෙනවා.

හරි කරගෙන යන විදියට යමුකෝ. එතකොට ඉවරයිනේ. සංශෝධනයක් ගේනවා මම දැන් කරගෙන යන විදියට යන්න කියලා. එතකොට සභාවට සත පහකවත් ආදායමක් නැහැ. වැඩේ කෙරේවි. එතකොට ඉවරයිනේ. ඒකනේ වුවමනාව තියෙන්නේ. එතකොට ප්‍රතිපාදනත් ඉල්ලන්න අපිට මෙච්චර ඕන, අච්චර ඕන කියලා. ලයිටුත් ඉල්ලන්න. අරකත් ඉල්ලන්න, මේකත් ඉල්ලන්න. ඔක්කොම ඉල්ලන්නකෝ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මෙතෙක් කර ගෙන ආපු ක්‍රමයක් තියෙනවානේ ගරු සභාපතිතුමනි,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ක්‍රමය අපිට සත පහක්වත් නොගෙවා කරන එක.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** නැහැ. නැහැ. අපේ සභාව සතු භූමියක ස්ථාපිත කරමු. අර දෙක අවලංගු කරලා සභාවේ භූමිවල ඒ ඉදිකිරීම් කරලා ඒ අවශ්‍යතාවය සම්පූර්ණ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බැහැනේ. මේ 13 දෙනෙක් අත්සන් කරලා දීලා තියෙනවානේ විරුද්ධයි කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපේ සභාව සතු ස්ථාන දෙකක ඉදිකිරීමක් කරලා ඒ බලපත්‍රය අළුත් කරන්න. එතකොට සභාවට අදායමකුත් එනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කරන්න එපාලුනේ ඉතිං.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපි මස් කඩ වැඩි කරන්නේ නැහැ. ප්‍රමාණය එකයි. අපේ සභා භූමියක ඉදිකරලා මේක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒත් බැහැලුනේ. මේකෙ බොහොම පැහැදිළිව කියනවානේ අපේ සභාව මගින් පවත්වා ගෙන යාම නොකළ යුතුයි කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේක විය යුතු දෙයක්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි ඒක ඉල්ලා අස් කර ගන්නවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම මේ යෝජනාව තාම සභාවට දැම්මේ නැහැනේ. මම සභාපතිතුමාගේ යෝජනාව ගැන කිවුවේ. ඒකෙදී අපි කියන්නේ සභාවෙන් මේවා කරන්න එපා කියලා. අලුතෙන් අපිට කඩ කාමර කුලියට අරගෙන කරන්න ගිහින් ඇඟේ ගා ගන්න එපා කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඒක තමයි කියන්නේ. සිංහල තේරෙනවානේ ලියනගේ මන්ත්‍රීතුමා. මම දැන් දිගින් දිගටම කිවුවා. කාරණා දෙකයි අපිට කරන්න පුලුවන්. එකක් ඔය විදියට කර ගෙන යන එක. එහෙම නැත්නම් අපි මේක අතට අරගෙන විධිමත් විදියට කරන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමනි, දැනට මේ මස් කඩ හිමියන් එක්ක කතා කරලා අපිට තීරණයකට එන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කතා කරන්න දෙයක් නැහැ. අපේ ස්ථාන දෙකක් හදලා දුන්නොත් ඒ අය එකඟයි අපිට මාසෙකට රුපියල් අසූ දාහක්, අනූ දාහක් ගෙවලා කර ගෙන යන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ විදියට ක්‍රියාත්මක කරමුකෝ මේ යෝජනාව. මේක හොඳ යෝජනාවක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ විතරක් නෙමෙයි මාසෙකට රුපියල් ලක්ෂ දෙකක විතර ආදායමක් එනවා. ඒකෙදී මෙහෙමයි. මේ ආදායම අතහැරලා දාලා කර ගෙන යන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අලුතෙන් මස් කඩ ඇති කරනවා නෙමෙයිනේ. පරණ එකම තමයි. ඊට වඩා වැඩි වෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එතකොට දැනට තිබෙන සියලුම පෞද්ගලික මස් කඩ අයින් වෙනවද.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒවා අයින් වෙනවා. ඒක හොඳ යෝජනාවක්. මම කියනවා ඒක ක්‍රියාත්මක කරන්න කියලා. ඇත්තටම ඒක නීත්‍යානුකූලව ක්‍රියාත්මක කරන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේ තියෙන මස් කඩ වලට අමතරව සභාවෙන් කඩ කරගෙන යන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. අපිට මතකයි අපි 2006 දී සභාවට පත් වෙලා ආපු වෙලාවේදී මස් කඩ හතරක් තිබුණා. ඒ මස් කඩ හතරෙන් ලක්ෂ 30 ක විතර ආදායමක් සභාවට එනවා. ප්‍රධාන ආදායමක් තිබුණා ඒකෙන්. දැන් මන්ත්‍රීවරුන්ගේ දේවල් කරන්නත් ඕන. ලයිට් එකක් දෙනවටත් මැරෙන්න හදනවා. ප්‍රතිපාදනත් ඕන. ඔක්කොමත් ඕන. ඒවා එපා කියලා කවුරුවත් කියන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිතුමා අපි ඒවාට නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොට්ඨාශ මන්ත්‍රීවරු කවුරුත් ඒවා එපා කියන්නේ නැහැ. මම මන්ත්‍රීවරුන්ටත් කියන්නේ මේකයි. මේක මම එක්කෙනෙක්ගේවත් අකමැත්තෙන් ගේන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ගෙන් අත්සන් කරපු අය මේක ඉල්ලා අස්කර ගත්තොත් ඇරෙන්න මේක දැන් යන විදියට යන්න අරිනවා. එතකොට ඉවරයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මම කියන්නේ සභාවට එන ආදායම වළක්වන්න එපා. ඒ නිසා මේක ඉල්ලා අස්කර ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, සභාවට යෝජනාවක් ගෙනාවම මන්ත්‍රීවරුන්ගේ අදහසට ගැලපෙන තීන්දුවක් ගන්න පුලුවන් ඕන කෙනෙකුට. ඒකට කැමති වෙන්න පුලුවන්, අකමැති වෙන්න පුලුවන්. සභාවට යෝජනාවක් දාන්න අවශ්‍ය මන්ත්‍රීවරු ප්‍රමාණයක් ඉන්නවානේ. ඒක හින්දා මම අපේ මතය කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මට ගොනා හැරෙන කොට කියන්න පුලුවන් හැරෙන්නේ කොහාටද කියලා. ඒක මට තේරෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේක ජනප්‍රිය වෙන්න හොඳ යෝජනාවක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙන මුකුත් නැහැ මම යෝජනාව සංශෝධනය කරනවා මේ කරගෙන යන විදියට යන්න කියලා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඉතාමත් ප්‍රායෝගික කාරණාවක් කියන්නම්. මම යම් අසනීපයකින් පෙළෙන කෙනෙක්. ඒ අසනීපයට මම දැන් ලංකාව හතර වටේටම ගිහිල්ලා බෙහෙත් ගන්නවා. ඒ බෙහෙත් කරන හැම තැනකින්ම මට කියන්නේ කුකුල් මස් කන්න එපා කියලා. කුකුල් මස් මොන හේතුවක් නිසාවත් කන්න එපා කිව්වා. කුකුල් මස් ඒ තරම් විෂයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** නමුත් එළු මස්, හරක් මස් කන්න කියලා කියනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එතකොට ඒක එකක්. මේක මට තියෙන ප්‍රායෝගික තත්ත්වය. අනිත් එක මෙතන තියෙන ෆාම් ෂොප් එකේ වගේම හැම ෆාම් ෂොප් එකකම ඌරු මස්, එළු මස් සහ අනෙකුත් මස් වර්ග තියෙනවා. අපේ යසරත්න මන්ත්‍රීතුමාගේ කඩෙත් ඒවා තියෙනවා. ඉතිං මේ හැම තැනකම මස් විකුණන්න පුලුවන්. දැන් තමුන්නාන්සේලා ඔය තත්ත්වය නිසා ඕක කරන එක අතහැරියොත් මේ අය එල්ලනවා ග්‍රිලන් එකේ මස් කරි පැකට් එකක්. ඒක එල්ලලා මස් විකුණනවා. හැබැයි ඒක මස් කරි විකුණන කඩයක්. නමුත් විකුණන්නේ මස්. එහෙම පුලුවන්. එතකොට ඒකට හේතුව වශයෙන් සභාපතිතුමා දිගින් දිගටම කියන විදියට තේරෙන්නේ මේ සභාවට තිබිච්ච ආදායමක් නැති වෙලා තියෙන්නේ. අනිත් එක විගණන අංශයෙන් මේකට කියලා තියෙනවා පැහැදිළිවම කරන ක්‍රමවේදය ගැන. මම දැන් උප සභාපතිතුමාටත් කිව්වේ මේක නීත්‍යානුකූලව කර ගන්න. ඒ විගණන අංශයෙන් කියපු අවවාද අරගෙන ඒ මාර්ගය ඔස්සේ ගිහිල්ලා මේක නීත්‍යානුකූල කර ගන්න. එහෙම නැතුව මේ අලුතෙන් මස් කඩ දාන්න දෙනවා නෙමෙයි. ඒ නිසා මේක තේරුම් ගන්න. මේකේ පාඩුව එන්නේ මේ සභාවට සහ මේ රටේ සමස්ථ ජනතාවට. අනිත් එක තමයි මම ගිහිල්ලා ගිංතොට ගෙවල්වලින් මස් ගෙනල්ලා තියෙනවා. මස් කඩ වහපු දවස් වලට මම ගිංතොට ගෙවල් වලින් මස් ගෙනල්ලා තියෙනවා. මස් විකුණන්න තියෙනවා ගෙවල් වල. දැන් ගිංතොටට මස් එන්නේ කටුගොඩින්. කාදර් මුදලාලිගෙන් මස් එන්නේ ගිංතොටට. මෙහේ කවුරුවත් හරක් මරන්නේ නැහැ. කාදර් මුදලාලි තමයි මස් සපයන්නේ ගිංතොටට. ඒක තමයි ඇත්ත කතාව. ඉතිං ඒක නිසා සභාවට මේ එන ආදායම නවත්වන්න එපා. මම යෝජනා කරන්නේ ඒක.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අනිත් එක තමයි මෙතන දැන් ජනප්‍රිය මාතෘකාව විදියට මස් කිව්වම හරක් මස් ගැන විතරයි කතා කරන්නේ. දැන් බලන්න කොළඹ ගිහින් එනකොට කොට්ටාව හන්දියේ දාලා තියෙනවා ලොකු මස් කඩයක්. මුස්ලිම් ප්‍රදේශයක්ද ඒක. මුස්ලිම් ජනතාව ජීවත් වෙන ප්‍රදේශයක්ද ඒක. හයිවේ එන්ට්‍රන්ස් එක ළඟ හන්දියේ තියෙන්නේ ඒක. ඌරු මස්, එළු මස්, කුකුලු මස්, හරක් මස් ඔක්කොම තියෙනවා. මේක ජනප්‍රිය වෙන්න කතා කරන දෙයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මමත් හරි කැමතියි මේකට. එහෙමනම් මමත් පළවෙනි සභාවට දානවා බෝපෙ පෝද්දල මත්පැන් තහනම්, අරක්කු තහනම්, සිගරට් තහනම් කියලා. හෙට දවල් වෙනකොට මුළු ලංකාවේම මේක ප්‍රසිද්ධ වෙනවා. නමුත් ජනප්‍රිය වෙන එකයි, මේක කරනවා කියන එකයි දෙකක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ජනප්‍රිය වෙන්න නෙමෙයි ඔය යෝජනාව මීට ඉස්සෙල්ලා සභාවේත් ගෙනාවානේ. අපි අයින් වුණා එතකොට. ඊළඟ සභාවේ මම මේක තහනම් කරන්න යෝජනාවක් ගෙනාවා. අහන්න රමේෂ් මහත්තයාගෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඕක නෙමෙයි අපි කතා කරන්න ඕන. මේ වෙලාවේදී ගරු අගමැතිතුමාට බලපෑම් කරන්න ඕන ඔය පනත ගෙනල්ලා ඉක්මනට මේක ඉවර කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විනාඩියක් ඇහුම්කන් දෙන්න. මේකෙ තියෙන නීතිමය තත්ත්වය ඔබතුමාට පැහැදිලි කරලා දෙන්න. මේක ගැන නීතිමය තත්ත්වයක් තියෙනවා. ඒ කියන්නේ අපේ කඩයකින් ඇරෙන්න අපිට වෙන එකකින් බදු ගන්න බැහැ. බද්ද ගන්න පුලුවන් අර රුපියල් තුන්දාහ විතරයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපිට සභාවෙන් ටෙන්ඩර් කරලා ගන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවට එකක් හදලා ටෙන්ඩර් කරොත් කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙමනම් සභාවට තැනක් හොයලා හදලා ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම කියන්නේ රුපියල් ලක්ෂයක් යන්නේ නැහැ මේකට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවට කඩ දෙකක් බද්දට ගන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බද්දට ගන්න පුලුවන් කමක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමාගේ තර්කය බලන්නකෝ. දැන් එතුමා විරුද්ධ වෙනවා සභාවෙන් කරන්න එපා කියලා. එතුමාම දැන් කියනවා සභාවෙන් තැන් දෙකක් හොයලා කඩ කාමර දෙකක් හදලා කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම මේ වැඩේට විරුද්ධයි කොහොමත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා සතියෙන් මේ වැඩේ කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමා අලුතින් කඩ දාන්න එපා කියලා මේ කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ වැඩේ සතියෙන් කරන්න පුලුවන් අවශ්‍යය නම් පෙරසවි කොන්ක්‍රීට් වලින් හදපු වයි කණු වලින්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සතියෙන් කරන්න පුලුවන්. නමුත් සභාවේ එකඟතාවය තියෙන්න ඕනනේ. දැන් මේ යෝජනාව ඉල්ලා අස් කර ගන්නවාද, නැත්නම් සභාවෙන් තැන් දෙකක් හඳුනාගෙන ඒ ස්ථාන දෙකේ සභාවෙන් මස් කඩ දෙකක් ඉදිකරලා ටෙන්ඩර් කරනවාට එකඟද.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පෞද්ගලික ඒවා අයින් කරලා ඒක එහෙම කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පෞද්ගලික ඒවා අයින් කරලා සභාවෙන් මස් කඩ දෙකක් හදලා ටෙන්ඩර් කරන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ යෝජනාව සංශෝධනය කරන්න මෙහෙම. සභාවෙන් දැන් කඩ කාමර දෙකක් බද්දට ගන්න පුලුවන් ආදායම් පරීක්ෂක මහතා කියන විදියට. එහෙම අරගෙන වැඩි මුදලට දෙන්න පුලුවන්. අපිට අයිතිය තියෙන භූමියක් හොයා ගන්න ඕනනේ. ඒක හොයා ගන්නකම් මම කියන්නේ සභාවෙන් කඩ කාමර දෙකක් අපි බද්දට අරගෙන වැඩි මුදලට දෙමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක අතුරු බදු දීමක්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම කරලා ඊට පස්සේ අපි තැන් දෙකක් හොයා ගෙන මේක කරමු. අපි නිකං ඒ මිනිස්සුන්ගේ කඩවලටම ටෙන්ඩර් කරලා දීලත් ඒ අය ලක්ෂ ගණන් ගෙවනවා. අතුරු බදු දුන්නත් ලක්ෂ ගණන් බදු ගෙවනවා ඒ අය. අපි බදු දෙන්නේ ඒ අයට ලක්ෂ ගාණකට. නිකං දෙන්න බැහැනේ. අපි කඩ කාමරයක් රුපියල් පන්දාහකට කුලියට ගන්නවා නම් අපි ඒක දෙන්නේ ලක්ෂයකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි දැන් මෙහෙම කරමුකෝ. මේක පැහැදිළි කරන්න ඕන තවමත් නොතේරිච්ච අයට. අපිට බැහැ අනුන්ගේ තැනකින් බදු ගන්න. අපිට පුලුවන් අපේ කඩේකින් බදු ගන්න විතරයි. එහෙම නැත්නම් අපි ගන්න ඕන රුපියල් දාහේ බද්ද විතරයි. එච්චරයි අපිට ගන්න පුලුවන්. ඊට වඩා සත පහක්වත් ගන්න බැහැ. ඒක තමයි මේ පැහැදිළිව කියන්නේ අපේ කඩයක් ඉදිකර ගන්න. එක්කෝ අපි කඩයක් ඉදිකරන්න ඕන, නැත්නම් බද්දට ගන්න ඕන. ඒක තමයි මේ දිගින් දිගටම තේරුම් කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අතුරු බදු දීමේදී කතාවක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බදු ගන්න එකට එකඟ නැත්නම් කඩ දෙකක් අලුතෙන් හදන්න එකඟද, නැත්නම් ඒකටත් විරුද්ධද.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** සභාවෙන් හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව විසින් අලුතෙන් කඩ දෙකක් හදන්නද.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** කඩ කාමර දෙකක් හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකටත් විරුද්ධද, කියාස් මන්ත්‍රීතුමා තැන් දෙකක් හොයා ගන්න තියෙනවාද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ බලප්‍රදේශය තුළ ඉඩම් කැලි දෙකක් හොයා ගන්න එක අමාරුයි. කුරුඳුවත්ත කොට්ඨාශයේ සභාවට අයිති තැන් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අර පොකුණ පිහිටි ඉඩම තියෙනවා නේද.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පොකුණ තියෙන ඉඩමක් තියෙනවා. තව තැනක් හොයා ගන්න ඕන අපි එහෙම නම්. තව තැනක් අපි හොයා ගන්නකම් මාස දෙක තුනකට කඩයක් බද්දට ගමු. නවුෆර්ලගේ ගෙදර ගාව තියෙන ළිඳ ගාවත් ඉඩමක් තියෙනවා. තව එකක් අපි හොයා ගමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමා ඒකටත් විරුද්ධද, අපේ තැන් දෙකක කරනවාටත් විරුද්ධද, මේ කාලයේදී මම සාමුහිකව යනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** අපේ තැනක කඩ දෙකක් හදන්න. අතුරු බදු දෙන්න අවශ්‍ය නැහැ. අපේ කඩ දෙකක් හදන්නකෝ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හැබැයි ඒ අතරතුර බද්දට අරගෙන දාන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් මේ යෝජනාව පහත විදියට සංශෝධනය කරනවා.

වැලිපිටිමෝදර සහ කුරුඳුවත්ත යන ප්‍රදේශ කේන්ද්‍ර කර ගෙන කඩ කාමර දෙකක් සභාව මගින් ඉදිකර එළ ගව මස් අළෙවිසැල් දෙකක් පවත්වා ගෙන යාම සඳහා ටෙන්ඩර් කර බදු දීමට යෝජනා කරමි කියලා.

එහෙමනම් ඒ යෝජනාව හරිනේ. එතකොට බදු කතාව සම්පූර්ණයෙන්ම අයින් වෙනවා. ඒක මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** අප ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිල ඇඳුම් දිමනාව හිමි නමුත් මේ වන තෙක් එය ලබා නොදුන් නිලධාරින් සහ සේවකයන් සඳහා නිල ඇඳුම් ලබාදීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තුන් පාර්ශවයක් ඉන්නවා මේකට. ඒ අය තමයි කාන්තා තාක්ෂණ නිලධාරීන්, විදුලි කාර්මික සහ ආයුර්වේද ඖෂධ සංයෝජක යන අය. මේ තුන් ගොල්ලොන්ට නිල ඇඳුම් දීමනාව ලබා දීමට තමයි යෝජනා කරේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**11.** මීපාවල ලද්දුහෙට්ටිවත්ත මාර්ගය මැන මායිම් ලකුණු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලින් දැනුවත් කිරීමක් මේ කරන්නේ. මේක නැවත සභාවට විධිමත් විදියට ඉදිරිපත් කරනවා. ඉල්ලීමක් කරලා තියෙනවා ගාල්ල, උළුවිටිකේ, හල්වතුරගොඩ වත්තේ පදිංචි ජී.එස්.කේ. කොහොඹන් මහතා. එයා ජූලියන් මවුන්ට් නැමැති ඉඩමට ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීමට මේ ඉල්ලන්නේ. අද සැලසුම් කමිටුවට දාලා ඒකෙ තීරණය මම සභාවට දැනුම් දෙන්නම්. මේ කෙනාගේ ඉඩම ඉස්සරහින් තියෙන මාර්ගය පොදු මාර්ගයකට සම්බන්ධ වෙන්නේ නැහැ. මේ පැත්තෙන් මාර්ගය ගන්නත් බැහැ නඩුවක් තියෙන නිසා. ඒ නිසා මෙතන තියෙනවා වෙන්දේසි ඉඩමක්. ඒකෙ සභාව සතු ඉඩමෙන් ඒ අයට මාර්ගයක් ඉල්ලනවා. ඒ මාර්ගයට යන ඉඩ ප්‍රමාණයට වැඩිය වැඩි ඉඩම් ප්‍රමාණයක් ඒ ඉඩමෙන් දෙන්නම් කියලා කියනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක දෙන්න පුලුවන් සභාපතිතුමා. මමත් ගිහින් ඒක බැලුවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සිද්ධිය ගැන දන්නවාද කවුරුහරි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ නාවින්නේ තැනක්.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** නාවින්නේ එහා පැත්තේ මේක තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ ඉඩමේ ප්‍රමාණය කොච්චරද, එක ගෙදරකට යන්නද මේ ඉල්ලන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** අක්කර තුනක් විතර තියෙනවා මෙතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට කොන්දේසියක් දෙන්න වෙනවා ඉඩම සංවර්ධනය කරලා විකුණන්න බැහැ කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ ඉඩම සංවර්ධනය කරන්න දෙන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කොන්දේසියක් දාන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හැබැයි ඊට පස්සේ ඉඩම සංවර්ධනය කරලා විකුණාවි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අක්කර ගාණක ඉඩමක් නම් ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉඩමකට කොහෙන් හරි පාරක් තියෙන්න ඕනනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අක්කර දෙකක් පෙන්වන්නේ නැහැ මේකෙ. සඟබෝවත්ත කන්ද පාරද මේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** මේ සඟබෝවත්ත නෙමෙයි. ප්‍රේස්ට්‍රිජ් පාරේ එහා කොනම මේ. අපේ සභාවේ ඉඩම් කෑල්ල තියෙන්නේ ඊට මෙහායින්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ අපේ ඉඩම හරහාද පාර දෙන්න හදන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** අපේ ඉඩමට එහා පැත්තේ පාර මේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඊට අල්ලපු පැත්තේ ගෙයක් හදලා තියෙනවා. මේ ඒකද, පහළ එකද.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** මේ පහළ එක. ඒ පාර අවශ්‍ය ප්‍රමාණයට දෙන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හරි. ඒක මෙහෙම තියෙන්නේ. ඔය ඉස්සෙල්ලා එන්නේ පාර දෙන්න කියලා. හැබැයි ඉතිං අපි පාරක් දුන්නට පස්සේ ඒක වෙන්දේසි කරන්න එපා කියලා කියන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාපතිතුමා අර කමිටුවක් තියෙනවානේ. ඒ කමිටුවෙන් බලලා කරනවා නම් හොඳයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ කමිටුවෙන් බලලා කරන්න තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් ඉස්සෙල්ලා සැලසුම් කමිටුවට දාලා සභාවට ඉදිරිපත් කරන්නම්. එතකොට හරිනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සැලසුම් කමිටුවෙන් අනුමත කරන්න දාන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේක අනුමත කරන්න දාන්න එපා සැලසුම් කමිටුවට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සැලසුම් කමිටුවෙන් අපි නිර්දේශ ගන්නේ. ඒ නිර්දේශයන් ක්‍රියාත්මක කරන්න සභාවට ඉදිරිපත් කරන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සැලසුම් කමිටුවේ නිර්දේශයන් සභාවට ඉදිරිපත් කරන්න ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ ඉඩමට හානියක් වේවිද දන්නේ නැහැ පාරක් දුන්නොත්.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒක ගිහින් බලන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ ඉඩමෙන් එහා පැත්තේ ඒ ඉඩම තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඉතිං එක වාසියක් වෙනවා. අපිට අවශ්‍ය ඉඩම් කෑල්ලක් ගන්න පුලුවන් අරකෙන්. ඒකත් එතකොට පොදු ඉඩමක් වෙනවා. ඒක මායිමේනේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අක්කර දෙකහමාරකට වැඩිය නැත්නම් හම්බ වෙන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි හිතමු පාරට යන්නේ පර්චස් පහක් කියලා. ඒ අය ඊට වැඩි ප්‍රමාණයක් අපිට දෙන්න එකඟයි. මේක බලලා ඉදිරියේදී තීන්දුවක් ගමු.

**<u>ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 12.** තොටගොඩ පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** තොටගොඩ රිචඩ් පතිරණ මාවත ආසන්නයේ මේ පොදු ළිඳ තියෙන්නේ. ඒක පිළිසකර කරලා දෙන්න කියලා යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පාවිච්චි කරනවද දන්නේ නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ අවශ්‍යතාවය තියෙනවා ජනතාවට. ළිඳ කඩාගෙන වැටිලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙන්නේ. දැන් මේවා වැහී ගෙන යන්න හේතුව තමයි මිනිස්සු නළ ජලය අරගෙන තියෙනවා. මේකෙදී නිකං අපි වියදමක් දරලා හැදුවොත් වටිනාකමක් තියෙනවාද, පාවිච්චි කරනවාද මේක.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** පහුගිය දවස් වල වැලිපත සේනානායක මාවතේ ගමේ කට්ටිය එකතු වෙලා ළිඳක් ප්‍රතිසංස්කරණය කරා. ඒවා ඉතාමත් ප්‍රයෝජනවත් වෙනවා. දවල් කාලයට වතුර කපන නිසා යම් යම් කටයුතු වලදී මිනිස්සු ඒ ළිං පාවිච්චි කරනවා. ඒ නිසා මේකත් පිළිසකර කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ- 13.** කපුහෙම්පල කැරුන්විල ග්‍රාම සේවා වසමේ තරංගා ලැන්ඩ් සේල් ආයතනය විසින් කැබලිකර වෙන්දේසි කිරීමට සුදානම් කරන ලද ඉඩම නිසා දීර්ඝ කාලයක් ඒ ආසන්නයේ පදිංචිව සිටින පවුල් කිහිපයක් හට භාවිතා කරන ලද මාර්ගය ඇහිරීමකට ලක් කරන ලදී. ඒ පිළිබඳව මෙම ආයතනයෙන් විමසීම් කළ විට එම පවුල් හට අදාළ මාර්ගය ලබාදෙන බවට වාචිකව ප්‍රකාශ කළද අදාළ මැනුම් කටයුතු සිදුකිරීමේදී මෙම මාර්ගය සළකුණු කර නොමැත. මෙම පවුල් සඳහා සිදුවූ එම අසාධාරණ කටයුත්ත නිවරදි කිරීමට සභාවට මැදිහත්වන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේ යෝජනාව ගැන මම ඔබතුමාව දුරකථනයෙන් දැනුවත් කරා. කපුහෙම්පල කැරුන්විල ග්‍රාම සේවා වසමේ තරංගා ලැන්ඩ් සේල් සමාගම විසින් ඉඩම් වෙන්දේසියකට සුදානම් කරනවා. මෙතෙක් ස්ථිර පදිංචිකරුවන් වෙලා හිටපු ඒ නිවෙස් හිමියන්ට පාරවල් දානට නැහැ. පාර වහලා තමයි ඒ අය මැනුම් කටයුතු කරලා තියෙන්නේ. මම නැවත දුරකථනයෙන් ඒ අය අමතපු වෙලාවේදී කිව්වේ මැනුම් කටයුතු ඉදිරියේදී කරනවා කියලා. නමුත් මැනුම් කටයුතු සියල්ල සිදු කරලා පාර වහලා තියෙනවා. ඊට පස්සේ ඒ ගමේ අයගේ ඉල්ලීම මත අපේ සභාවෙන් ඒක ගැන දැනුවත් කරන්න. නාගරික සංවර්ධන අධිකාරියෙන් තමයි ඒ අවශ්‍ය නිර්දේශ අරගෙන තියෙන්නේ. නමුත් ගරු සභාපතිතුමනි, සභාවක් විදියට අපි මේකට මැදිහත් විය යුතුමයි. හේතුව පවුල් දෙක තුනක අයගේ නිවෙස් වලට යන පාර වහලා තියෙනවා. ගමේ අයගේ ඉල්ලීම මත මම ඒ ඉඩමට ගියා. ගිහිල්ලා මම කතා කරන කොට දැක්කා කිසිම ප්‍රමිතියකින් තොරව තමයි මේ පාරවල් හදලා තියෙන්නේ. ගල් බැම් දාලා තියෙනවා මහ පොළව උඩ තියෙන තණකොළවත් කඩන්නේ නැතුව. නිකම්ම ගල් බැම්ම හදලා තියෙන්නේ. එක වැස්සක් ආවොත් ගල් බැම්ම කැඩෙනවා. එහෙම මට්ටමක් තමයි තියෙන්නේ. ඊළඟට නිසි පරිදි කාණු දාලත් නැහැ. සිලින්ඩර් බෝක්කු දාලා තියෙනවා. ඒක දාන්නේ මොකටද කියලා ප්‍රශ්නයකුත් මට තියෙනවා. ඒ වතුර බහින්න නම් නෙමෙයි දාලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි නෙමෙයිද ඒ සංවර්ධන බලපත්‍රය දීලා තියෙන්නේ,

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකට කවුරු අනුමැතිය දුන්නත් ගරු සභාපතිතුමනි මගේ අදහස තමයි අපි මේකට මැදිහත් විය යුතුමයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ අපේ ප්‍රදේශයේ එකක්ද.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මගේ කොට්ඨාශයේ එකක් මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයට පවරා ගනිපු කාලයේදී දීපු සංවර්ධන බලපත්‍රයක් මේක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක පවරා ගනිපු කාලයේදී කරපු එකක් වුණාට දැන් කෙරෙන්න ඕන දේවල් හරියට කෙරෙන්නේ නැත්නම් ඒ වෙනුවෙන් පෙනී ඉන්න ඕනනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ සැලසුම් කමිටුවෙන් නෙමෙයිද එතකොට නිර්දේශ දෙන්න ඕන. සී.එෆ්.සී. එක දෙන්න ඕන අපෙන් නෙමෙයිද.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒකට සභාවෙන් මැදිහත්වීමක් වෙන්න ඕනනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ලියුමක් යවන්න වහාම අපේ අධීක්ෂණය යටතේ කරන්න කියලා. දැන් අපිට බලතල පවරලානේ තියෙන්නේ. දැන්නේ මේ ඉඩම් වෙන්දේසිය යන්නේ. ඒ අයට කියන්න අපේ අධීක්ෂණය යටතේ මේක කරන්න කියලා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේකෙ තියෙන හොඳම කරුණ තමයි ඒ කට්ටියට නිර්දේශ දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉක්මනට මේකට ලියුමක් යවන්න. ඒක නාගරික සංවර්ධන අධිකාරියටත් යවන්න, අදාළ වෙන්දේසි ආයතනයටත් යවන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඊළඟට හොඳම දේ තමයි වෙන්දේසි ඉඩම කරන කට්ටිය නිසා වෙච්ච අසාධාරණය හේතුවෙන් ඒ අවට ගෙවල්වල අය මේ ඉඩම බලන්න ආවම ඒක ප්‍රතික්ෂේප කරනවා. මෙතනින් පාරක් තිබුණා, පාර වහලා මැනුම් කටයුතු කරා කියලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට මතකද, සභාවේ ඉඩමෙන් පාරක් ඉල්ලුවා. එතන උඩද ඔය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ අයව නොමඟ යවලා තියෙනවා. ලිඛිත අවසරයක් නැතුව මේ ආයතනය ගමේ අයව නොමඟ යවලා ඒ ගස් කොළන් ටික කපලා තියෙනවා. මේ අයට මුදල් දෙන්න හැදුවම මුදල් අවශ්‍ය නැහැ පාර දෙන්න කියලා, කියලා තියෙනවා. ඒ නීතිඥතුමා එක්ක මම කතා කරා. දැන් පොඩි එකඟතාවයකට ඒ අය ඇවිල්ලා තියෙනවා පාර දෙන්නම් කියලා. ඒ වුණාට සභාපතිතුමනි හෙට අනිද්දාට මේ ඉඩම් වලට පදිංචිකරුවෝ ආවට පස්සේ අපිට වගකීමක් තියෙනවා. පාරවල් ටික හරියට නැහැ. කාණු පද්ධති අක්‍රියයි. බෝක්කු කැඩිලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. නාගරික සංවර්ධන අධිකාරියට බලතල පවරා ගනිපු කාලයේදී සංවර්ධන බලපත්‍රය දීපු එකක් මේ. නමුත් දැන් මේක ගැන සභාවේ කතා වුණා කියන්න නිසි ප්‍රමිතියකින් තොරව මේ ඉඩම් වෙන්දේසිය සිද්ධ වෙනවා කියලා. නමුත් දැනට ප්‍රාදේශීය සභාව වෙත නැවත බලතල පවරලා තියෙන නිසා පිඹුර අනුමත කිරීම සහ අනුකූලතා සහතිකය නිකුත් කිරීම අපේ සභාවේ සැලසුම් කමිටුව මගින් කරන්න අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා නාගරික සංවර්ධන අධිකාරියටත් ලියුමක් දාන්න. ඒ අදාළ ආයතනයටත් ඒ ලියුම දාන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, තව දෙයක් දැන ගත යුතුයි. ඒ ඉඩමේ කැබලි 28 ක් විතර දැනට විකිණිලා තියෙනවා. ඒවාට අත්තිකාරම් බැඳලා තියෙන්නේ. හැබැයි ඉතුරු ඒවා ගන්න එන කොට ගමේ අයට පාර අහිමි වෙච්ච නිසා ඒකට විරෝධය එල කරනවා. එතකොට මේ ආයතනය මැරයෝ ගෙන්වලා අර ගෙවල්වල අයට තර්ජනය කරනවා. ඒවගේ මට්ටමක් දැන් ඇති වෙලා තියෙන්නේ. ගරු සභාපතිතුමනි, ඔබතුමා මැදිහත් වෙලා මේක නිවැරදි කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** තරංගා ලැන්ඩ් සේල් ආයතනය යන හැම තැනම ඔහොම තමයි. මංකොල්ලා කනවා. සභාවේ මන්ත්‍රීවරු ඉන්නවා. සභාපති සහ නිලධාරීන් ඉන්නවා. ඒ හැමෝම අපහසුතාවයට පත් වෙලා තියෙනවා. ඇත්ත කතා කරන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේක මේ ආයතනය නිවැරදි කරන තුරු වෙන ඒවාට අවසර දෙන්න එපා. අපේ බලප්‍රදේශයේ තරංගා ලැන්ඩ් සේල් ආයතනයෙන් ඉඩමක් වෙන්දේසි කරනවා නේද, හපුගල පැත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක නිවැරදි කරනකම් ඒකට අවසර දෙන්නේ නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** වටරැක පැත්තෙත් තියෙනවා නේද එකක්. ඒවා තාවකාලිකව හරි අත්හිටුවීමක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පැතුම් උයනේ අයට තාම වතුර දීලා නැහැ. ඒකටත් ආවා. පැතුම් උයනේ ඉඩම් ගනිපු අයට වතුර දීලා නැහැ තවම. ඒවා දෙනකම් අපි අවසර දෙන්නේ නැහැ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** වටරැක පැත්තේ ඉඩමක් වෙන්දේසි කරනවා නේද, තරංගා ලෑන්ඩ් සේල් ආයතනයෙන්. මේක නිවැරදි කරනකම් ඒකට පොඩි අත්හිටුවීමක් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒවා විකුණලා ඉවරයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අරක නිවැරදි වෙනකම් මේවා අත්හිටුවීමක් කරන්න ඔබතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 14.** බංගලාවත්ත මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 15.** ටොරින්ටන් ටෙරස් ඉඩමේ සිට ගැමුණු මාවත දක්වා ඇති කාණු පද්ධතියේ අවසන් කොටසේ යොදා ඇති සිලින්ඩර් පිරිසිදු කළ නොහැකි ආකාරයට කාණු පද්ධතිය ඉඩමට ඇතුළත්කර තාප්පයක් ඉදිකර ඇත. එම අනවසර ඉදිකිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කර ජලය බැසයන ආකාරයට කාණු පද්ධතිය සැකසීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක 2014 වගේ ඉඳලා එන ගැටළුවක්. ටොරින්ටන් ටෙරස් එකේ ඉඳලා විශාල ජල කඳක් එනවා. ඒක අවසාන ඉඩමේ අඩියේ සිලින්ඩර් වගයක් යොදලා තියෙන්නේ. පහුගිය සභාවේදී මම යෝජනාවක් ගෙනල්ලා අඩි දෙකේ සිලින්ඩර් දාන්න යන කොට ඒ පහල ගෙදර අය විරුද්ධයි කිවුවා ඒක ඒ අයගේ පෞද්ගලික කාණුවක් කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්ලෑන් එකක ඒක නැද්ද, දැන් කාණු පද්ධතිය ගන්න බැරිද එතකොට. එතන අපිට අඩි දෙකේ සිලින්ඩර් දාන්න බැරිද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක උඩ ඉදිකිරීමකුත් කරලා තියෙනවා. මඩුවකුත් ගහලා. අපි සිලින්ඩර් දානකොට ඒක කරන්න දෙන්නේ නැත්නම් ඒකට අනවසර ඉදිකිරීමක් යටතේ නීතිමය කටයුතු කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සිලින්ඩර් දෙක දාන්න දෙන්නේ නැත්නම් අනවසර ඉදිකිරීම් යටතේ නඩු දාන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ගුණසේකර මහතා පෞද්ගලිකව ගිහිල්ලා ඒකට මැදිහත් වුණා. ඒක 2014 ඉඳලා ගිහිල්ලා තිබුණා. ඒක පෞද්ගලික කාණුවක් නම් වහලා දාමු. ටොරින්ටන් ටෙරස් එකේ පහලින් යන්නේ මේක. ගෙවල් හතක් වගේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලලා ඊළඟ සභාවට දාන්න.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 16.** ගොඩකන්ද මිල්ලගස් අද්දර රණසිංහ කඩය අසළ වැසි දිනවලදී විශාල ජල ප්‍රමාණයක් එක්රැස්වීම නිසා මාර්ගයේ ගමන් කරන්නන් දැඩි අපහසුතාවයකට පත්වෙයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ අප ප්‍රාදේශීය සභාව සම්බන්ධ වී සැලසුමක් සකස්කර මෙම ඇළ මාර්ගය පිළිසකර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ගොඩකන්දේ රණසිංහ කඩය අසල කාණුව එක එක්කෙනා විසින් අල්ලා ගෙන තියෙනවා. අඩි තුනක් හතරක් තියෙනවා එතන. ඒ නිසා අපි මේකට සුදුසු වැඩපිළිවෙලක් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව එකතු වෙලා කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඉදිරිපත් කරන්නම් මම.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 17.** ආචාර්ය රිචඩ් පතිරණ විද්‍යාලයේ මුරකරුවන් සහ අනෙකුත් කම්කරුවන් නොමැතිවීම නිසා එම විද්‍යාලය දැඩි අර්බුදයකට පත්ව ඇති බැවින් මෙම විද්‍යාලය සඳහා මුරකරුවන් සහ අවශ්‍ය අනෙකුත් කම්කරුවන් සේවය සඳහා ලබා දෙන ලෙස ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා වෙතින් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** දැන් මුරකරන්න එක්කෙනෙක් ඉන්නවා. එයාව දවල් වරුවේ සේවයට යොදවා ගෙන ඉන්නේ. පහුගිය දවස්වල දකුණු පළාත් සභාවේ වැඩිම රැකියා අවස්ථා ප්‍රමාණයක් ලබා දුන්නා. හැබැයි කිසිම පාසලක මුරකරුවෙක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ අදාළ කොට්ඨාශයේ කෙනෙක් ගත්තා නම්, ගමේ කෙනෙක් නිසා එයා ඒවි. එක එක්කෙනාගේ අවශ්‍යතාවයන් මත දීපු හින්දා තමයි ඔය අදාළ පාසල් වල වැඩ කරන්න කෙනෙක් නැත්තේ. ඒක කැත ක්‍රමයකට දුන්නේ. අපි ඒක කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කැතම ක්‍රමයකට දුන්නේ. අධ්‍යාපන ඇමතිවරයෙක් නෙමෙයි ඒ මුදලාලි කෙනෙක්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ මුදලාලි කෙනෙක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** අධ්‍යාපන ඇමතිවරයා විසින් රැකියා 7000 ක් දෙනකොට අධ්‍යාපන අමාත්‍යාංශය ගෙනියන්නේ කොහොමද.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගෙන් අහලා දුන්නා නම් ඒ පාසල් ආවරණය වෙනවානේ. එහෙමනම් ඔය ප්‍රශ්නය හැදෙන්නෙත් නැහැ. මහ ජරාම ඇමතිවරයෙක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඉතිහාසයේ වැඩිම රැකියාවල් ලබා දීම මේ. ඒ මුදලාලි කෙනෙක්. ආයේ කරන්න බැරි වෙන්නම සේවකයෝ ගෙනත් දැම්මා. කරන්න පුළුවන්නම් තව කමකුත් නැහැ. හිටපු ජරාම අධ්‍යාපන ඇමතිවරයා. ආයේ ඇමතිවරයෙකුට කරන්න බැරි වෙන්නම මේක කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒ වගේම සභාපතිතුමා තව ප්‍රශ්නයක් තියෙනවා. අර උප කාර්යාලයේ ට්‍රැක්ටරය පහුගිය කාලයේදී කඩ වලින් කුණු අරගෙන නැහැ. කඩ තුන හතරකින්ම මට කතා කළා මේ යන ක්‍රමවේදය කෙරෙන්නේ නැහැ කියලා. අනිත් එක තමයි ගෙවල් වලින් කතා කරා උප කාර්යාලයට ගිහිල්ලා ට්‍රැක්ටරයට කුණු දාලා යනවා කියලා. ඒ සේවකයොන්ගෙන් ඇහුවම ඇයි කුණු ටික ගන්නේ නැත්තේ කියලා මෙහේ ඉඳලා කිවුවා දැන් යන්නේ. අන්න ඒකට සුදුසු වැඩපිළිවෙලක් ආයේමත් හදන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීතුමා මෙහෙමයි. දැන් ඔබතුමන්ලා ඒක ගැන දන්නවාද කියලා දන්නේ නැහැ. අපිට හදිසි අවශ්‍යතාවයක් ආවොත් රියදුරෙක්ව හොයා ගන්නවත් නැහැ. මෙතන වතුර බවුසරයක් ගෙනියන්න වුණොත්, ටෙන්ට් එකක් ගෙනියන්න වුණොත්, පුටු ටිකක් ගෙනියන්න වුණොත් කෙනෙක් නැහැ. නමුත් අපි හොඳටම දන්නවා කසළ ට්‍රැක්ටර් වල රියදුරන් උදේ 08.00 ට යනවා. ආයේමත් පස්වරු 12.30 ට කලින් අනිවාර්යයෙන්ම එනවා. පස්වරු 11.30 යි 12.30 යි අතර, අනිවාර්යයෙන්ම එනවා. මේක හැමෝටම කරන චෝදනාවක් නෙමෙයි. සමහරු තැන් තැන්වල නොයෙකුත් දේවල් කරලා, ඔක්කොම කරලා එන්නේ. සමහරු අතිකාල වැඩත් කරනවා. ඒ කරලා පස්වරු 04.45 ට ඇවිල්ලා අත්සන්

කරනවා. ඒකට මම තීරණයක් ගත්තා. උදේ 08.00 ට පිටත්වෙන්න ඕන ප්‍රධාන කාර්යාලයෙන් ඒ අය දූන්. මොකද, එහේදී අපිට මේ අයව පාලනය කරන්න බැහැ. එහේ තියෙන තත්ත්වය අනුව අපිට ඒක බලන්න ක්‍රමවේදයක් නැහැ. එතන ඔක්කොම අය වෙන විදියකට හැඩ ගැහිලා තියෙන්නේ.

(ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙම හැඩ ගැහිලා තියෙනවා නම් ඒවා වෙනස් කරන්න ඕන. ඒ අයට ඕන විදියට මේක කරන්න දෙන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කරේ එකම වෙනසයි. කට්ටියට රිදිලා තියෙන්නේ ඒකයි. එක වෙනසයි කරේ. ඒක මහා ලොකු දෙයක් නෙමෙයි. මෙතන ඉඳන් එතනට යන වෙලාව විතරයි වෙනස් වුණේ. නමුත් ගිහිල්ලා නැවත එන්නේ පස්වරු 12.30 වද, ඒ අය මෙහේ අත්සන් කරන්න ඕන. කෑමට පැය භාගයකට යන්න පුලුවන්. ගිහිල්ලා ඇවිත් නැවත අත්සන් කරන්න ඕන. ආයේමත් මෙහේ ඉන්න ඕන. ඊට පස්සේ පස්වරු 04.45 ට යන්න පුලුවන්. ඉතිං ඒකට තමයි කට්ටිය දූන් තැන් තැන්වල කුණු ගන්නේ නැත්තේ. ඒ මට රිද්දවන්න කරන්නේ. ඒකටත් මම ක්‍රමවේදයක් හදනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක ගැන නෙමෙයි මම කතා කරේ. ඒක මම බැලුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සභාපතිතුමා කිරිමැටිමුල්ල වත්තෙත් ඔය ප්‍රශ්නය තියෙනවා. කොටසක ගන්නවා තවත් කොටසක ගන්නේ නැහැ. මිනිස්සුන්ගේ ලොකු දෝෂාරෝපණයක් තියෙනවා සභාව වෙනුවෙන්. මම කිව්වා එහෙම කරන එකක් නැහැ කියලා. මම ඒ අයටත් ඒක ආයෙමත් කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මන්ත්‍රීවරු සියළු දෙනාම උදව්වක් කරන්න. කලින් කුණු අරගෙන දූන් හිතාමතාම නොගන්න තැන් ටික කියන්න. මම ඒ අයට කරන්න ඕන දේ කරන්නම්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** කලින් අරගෙන තියෙනවා. සභාපතිතුමාගේ කාලයේ ඉඳන් ගන්නේ නැතිලු. කිරිමැටිමුල්ල වත්තේ නන්දනපාල මාමාලාගේ ගෙවල් ගාව පාරේ ගෙවල් පහක් හයක් විතර තියෙන්නේ. ඒ ටික නැතුව අනිත් ටික වටෙන් අරගෙන යනවලු. ඒක ලොකු ප්‍රශ්නයක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එක මනුස්සයෙක් කතා කරා උළුවිටිකේ ප්‍රදේශයෙන්. එයා කුණු බෑග් එක සභාව ඇතුළට ගෙනිහිල්ලා ට්‍රැක්ටරය ඇතුළෙන් තියලා කිව්වා එයා යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා මට කතා කරා. නමුත් මම එයාට කරන්න ඕන විදිය කිව්වා. එයා උළුවිටිකේ එක්කෙනෙක් නිසා මීපාවලට ගිහින් ට්‍රැක්ටරයේ තියලා යන්න ඕන නැහැ. මෙතන හදලා දෙන්නම් කිව්වා වැඩට යන ගමන් මෙතනට දාලා යන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එයා බද්දේගම වැඩට යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා ගාල්ලේ වැඩ කරන කෙනෙක්. බැංකුවක වැඩ කරන කෙනෙක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** එයා බද්දේගම වැඩ කරන්නේ. මම ඒක ඇහුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා මට කිව්වේ ගාල්ලේ කියලනේ. ඊට පස්සේ මගෙන් ඇහුවා මෙතනට දැම්මට ප්‍රශ්නයක් නැද්ද කියලා. මම කිව්වා කිසි ප්‍රශ්නයක් නැහැ දාන්න කියලා. මම ගේට්ටුවේ ඉන්න කෙනාට කියන්නම් එයාට ඇවිල්ලා කුණු ටික දාන්න කියලා කිව්වා.

**ගරු මන්ත්‍රිනී ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය ඃ-** සභාපතිතුමා අපේ කොට්ඨාශයේ සතියකින් විතර කුණු අරගෙන නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලන්න කියන්නම්. ඒ වගේම තමයි කම්කරු මහත්වරු ගත්තම ඊට අන්තයි තත්ත්වය. සියළු දෙනාම නෙමෙයි හොඳට වැඩ කරන අයත්, අනිත් අය සමඟ එකතු වුණාම තත්ත්වය සම්පූර්ණයෙන්ම අඩාල වෙලා තියෙන්නේ. ඒ පිළිබඳව මම ක්‍රියාමාර්ග ගන්නවා කවුරු තරහා වුණත්, නැතත්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** හොඳ කට්ටියත් ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හොඳ කට්ටියත් ඉන්නවා. නමුත් ඒකත් දැන් වෙනස් වෙලා තියෙන්නේ. මම හිතන්නේ නැහැ උපරිම පැය 03 ක් වත් කොට්ඨාශයේ වැඩ කරනවා කියලා. පැය 03 ක් වැඩ කරන කොට්ඨාශයක් මට කියන්නකෝ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කියන දේ නිවැරදියි. ඊයේ මගේ දවස උප කාර්යාලයෙන් මගේ කොට්ඨාශයේ වැඩ කරන්න එන. නමුත් මට වැඩ තියෙන නිසා බලන්න යන්න බැරි වුණා. මම හවස ගිහිල්ලා ඒක බැලුවා. ඇත්තටම වැඩ සතුටුදායකයි. උප කාර්යාලයේ කට්ටිය සතුටුදායක සේවයක් කරලා තියෙනවා. මට සතුටු හිතුණා ඇත්තටම. මම ආවේ නැති වුණත් උනන්දුවෙන් ඒ තණකොළ ගස් නැවත මාස හයකටවත් හැදෙන්නේ නැති විදියට සුද්ධ කරලා පිහිදාලා තමයි ගිහිල්ලා තියෙන්නේ. ඔබතුමා කියන විදියට එහෙම වැරදි කරන කට්ටියකුත් ඉන්නවා. මෙතන හරියට සේවයේ යෙදෙන කට්ටියකුත් ඉන්නවා. ගරු සභාපතිතුමනි, අපේ සභාවේ රියදුරු මහත්වරු කී දෙනෙක් ඉන්නවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හය දෙනයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ අය නිවාඩු ගැනීමේදී මෙඩිකල් නිවාඩුවක් නම් ඒක ගැටළුවක් නැහැ. එයාලාගේ අවශ්‍යතාවයන් වලට නවතිනවා නම් ගැටළුවක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකත් කියන්න ඕන. එක රියදුරෙක් නොදන්වා සේවයට පැමිණියේ නැහැ දවස් දෙකක්. දෙවැනි දවසේ හවස තමයි ටෙලිග්‍රෑම් එක ගහලා තිබුණේ. මම සති දෙකක් එයාගේ සේවය අත්හිටෙව්වා. වැටුප් නැවැත්තුවා. සති දෙකකට පස්සේ තමයි එයාව නැවත සේවයට කැඳෙව්වේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙම වුණාම ලොකු සේවයක් අපේ ආයතනයට කර ගන්න බැරි වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙඩිකල් නිවාඩුවක් ඇරෙන කොට කලින් දැනුම් දීමක් නොකර නිවාඩු ගන්නවා නම් යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මම නැවත තව යෝජනාවක් කරනවා. බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ නාවින්න කියන ප්‍රදේශය තෝරාගෙන තියෙනවා කොරෝනා ආසාදිත මරණ භූමදානය කරන්න. බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ නාවින්න තෝරාගෙන කියලා කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාම අපිට එහෙම දැනුම් දීලා නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** වෙන තැනක් තෝරාගන්න කියලා ඉල්ලීමක් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නාවින්න කියන්නේ හිර වෙච්ච තැනක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නාවින්නේ කොහේ වළලන්නද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක යෝජනා කරලා තියෙනවා. මේ ඉඩම් වෙන බලප්‍රදේශයන් තුළ තියෙනවා. බෝපෙ පෝද්දලින් නම් කරලා තියෙන්නේ නාවින්න ප්‍රදේශය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකට අපි තරයේ විරුද්ධයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** ඒක හින්දා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමාටයි, ගාල්ල දිස්ත්‍රික් ලේකම්වරයාටයි, සභාවේ විරෝධතාවය ප්‍රකාශ කරලා ලියුමක් යවන්න. ජල පිරිපහදුව පිහිටලා තියෙන්නෙත් බෝපෙ පෝද්දල ප්‍රදේශයෙ න්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම තැන් තෝරාගෙන නැහැ. නාවින්නේ නෙමෙයි ලංකාවේ ඕනම තැනක වළලන්න පුලුවන්. ඒක ගැටළුවක් නැහැ. තැන් හතරක් දීලා තියෙනවා. ඒකට ඒ අය ඇවිල්ලා බලලා පරීක්ෂා කරාවි. ඒකට යෝජනා ඉල්ලුවම දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක කරන්න දෙන්නේ නැහැනේ. මොනවා කරන්න ආවත් කරන්න දෙන්නේ නැහැනේ.

<u>ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 18.** උක්වත්ත, දීගොඩ වෙල්ලාලගොඩ මාර්ගය ඉහළ හා දෙපස ජනතාව දැනට පාවිච්චි කරන ප්‍රමාණයට කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒ ප්‍රදේශයේ අය මට ලියුමකින් අත්සන් ලේඛනයක් දීලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 19.** මොල්ලිගොඩවත්ත ප්‍රධාන මාර්ග දෙකේ සීමා මායිම් ලකුණුකර ජනතාව විසින් සිදුකරන අනවසර ඉදිකිරීම්, ගෙපල් කැපීම් නතර කර ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඉතාමත්ම හොඳ යෝජනාවක්. ඒක ඔහොමම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එහෙත් අපිට මැනුම් කරලා ලබා දෙන්න කියලා ඉල්ලන්න. ඒක හොඳ යෝජනාවක්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ- 20.** මොල්ලිගොඩවත්ත පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාපතිතුමා, ඒක මේ වෙන කොට මම මැදිහත් වෙලා සුද්ධ කරා. සභාවෙනුත් අපිට සහයෝගය ලැබුණා. කම්කරුවෝ තුන් දෙනෙකුත්, ජලය ඉසින යන්ත්‍රයකුත් ලබා දුන්නා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද ඔය, පහළ අනෝමාලාගේ ගෙවල් ළඟ තියෙන එකද.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔව්, දැනට වතුර නැති පවුල් කිහිපයක්ම තියෙනවා. ඒ අයගේ දුඩි ඉල්ලීම මත තමයි මම මැදිහත් වුණේ. ගුණසේකර තාක්ෂණ නිලධාරි මහතා ගිහින් බැලුවා අපි ළිඳ පිරිසිදු කරන කොට. දැන් පවුල් කිහිපයක්ම ඒක පරිහරණය කරනවා. හැබැයි අර තැනින් නාන වතුර ආපසු ළිඳට එනවා. ළිං බක්කි කැඩිලා විනාශ වෙලා තියෙන්නේ. හැකිනම් ළිං බක්කියක් හදලා ඒක පාවිච්චි කරන්න පුලුවන් විදියට සකස් කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හොඳ යෝජනාවක්. ඒක බලලා ඇස්තමේන්තුවක් හදන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක බැලුවා. තාම පාවිච්චි කරනවා ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 21.** කලේගාන උතුර සහ කලේගාන දකුණ යන ග්‍රාම සේවා වසම් දෙක සඳහා ඉඩමක් ලබාගෙන ක්‍රීඩා පිටියක් සකස්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** කලේගාන උතුර සහ දකුණ ප්‍රදේශයේ මිනිස්සුන්ට ක්‍රීඩා පිටියක් ලබා ගැනීම සඳහා ක්‍රීඩා ඇමතිතුමාට කියලා ඒක ලබා දෙන්න. මේ මිනිස්සු දැනට සෙල්ලම් කරන්නේ පාරේ. ඒ නිසා මේක දැන් බොහොමත්ම අවශ්‍යතාවයක්. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ කාරුණිකව අවධානය යොමු කරලා ක්‍රීඩා පිටියක් ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 22.** වීදි පහන් නඩත්තු කටයුතු සඳහා නව විදුලි කාර්මිකයෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මේක දැනට ක්‍රියාත්මක වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 23.** කලේගාන වී.සී පාරේ සභාව සතු ඉඩමේ ඉදිකරන ලද නව ගොඩනැගිල්ල සඳහා ජලය සහ විදුලිය යන පහසුකම් ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** අපේ කැටයම් මධ්‍යස්ථානයට ජලය සහ විදුලිය ලබා දීම සඳහා මම යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ දෙකම දෙන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී චමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඩබ්.පී චමින්ද මැතිතුමා ඃ- 24.** අප ප්‍රාදේශීය සභාව සතු පෝද්දල පිට්ටනිය මැන මායිම් ලකුණු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී චමින්ද මැතිතුමා ඃ-** ඒකට ගරු සභාපතිතුමා යම් ආකාරයකින් බිම් කොටසක් රජය සතුව, සභා පිට්ටනිය සතුව තියෙනවා නම්, ඒ බිම් කොටස අයුතු ලෙස අත්පත් කර ගෙන තියෙනවා. මේකට මම ඉල්ලනවා බුද්ධිමත් මන්ත්‍රීවරුන්ගෙන් අඩුම තරමේ මේක සභාවට අත්පත් කර ගන්න උත්සාහ දරන්න කියලා. මොකද, පෝද්දල කොට්ඨාශයේ ඉඩමක් අන්සතු වෙලා තියෙනවා. ඒකට යම් ආකාරයකින් මැදිහත් වීමක් වුණා නම් ආදාහනාගාරය එතන ඉදිකරන්න තිබුණා. ඒක ප්‍රතික්ෂේපවීමත් එක්ක, වෙන ස්ථානයක ආදාහනාගාරය ඉදිකිරීමත් සමඟ ඒක දැන් නැවතත් ඒ අය සතු වෙලා තියෙනවා. ඒක කිසි ගැටළුවක් නැහැ. පෝද්දල පිට්ටනිය කියන්නේ ළමයින්ට සෙල්ලම් කරන්න දැනට ඉතුරු වෙලා තියෙන රජය සතු ඉඩමක්. මේකෙන් යම් කිසි කොටසක් පුද්ගලිකව අල්ලා ගෙන ඉන්නවා. මේ ගැන සාකච්ඡා කරහම මට විරෝධතාවයක් ඇති වෙලා තියෙනවා. ඒක මට ප්‍රශ්නයක් නැහැ. හැබැයි මේ යෝජනාව ඉදිරිපත් කරන එක මම සතුව තියෙන වගකීමක්. ඒක මගේ යුතුකමක් කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට. ඒක නිසා යෝජනා කරනවා පෝද්දල පිට්ටනිය මැන මායිම් ලකුණු කිරීම සඳහා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා සඳහන් කරපු පළවෙනි කාරණයට තාප්පයක් ඉදිකරලා තියෙන්නේ මම හිතන්නේ. ඒකෙ මායිම් ලකුණු කරන්න දෙයක් නැහැ. එහා පැත්තේ තාප්පයක් තියෙනවා. අපිට භූමිය සුද්ධ කර ගන්න තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී චමින්ද මැතිතුමා ඃ-** ඒක ඔබතුමා කරනවා නම් ලොකු දෙයක්. පිරිසක් ඉදිරිපත් වෙලා තියෙනවා එයාලගේ සීයාගේ කාලයේ ඉඳලා මේක භුක්ති වින්දා කියලා. දැනට කෙසෙල් ගස් හිටවලා තියෙනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අර සොහොන් පිටිය අපි ගිහින් මැන්නා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ ස්ටේජ් එක පිටිපස්සේ කෙසෙල් ගාලක් එක්ක තියෙන එක. ඊට එහා පැත්තෙන් දිගට තාප්පයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී චමින්ද මැතිතුමා ඃ-** තාප්පයක් තියෙනවා. නමුත් ඒක පිළිගන්නේ නැතිකම තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒ තාප්පය මායිමනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී චමින්ද මැතිතුමා ඃ-** එහෙමනම් සභාවෙන් ගිහින් ඒක සුද්ධ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන දැන් බස් ගහන්නේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී චමින්ද මැතිතුමා ඃ-** නැහැ. බස් ගහන තැනක් නෙමෙයි මෙතන. රජයේ පොදු ළිඳක් තියෙනවා. ඇත්තටම එතන අවශ්‍යතාවය පෝද්දල හන්දියට තියෙනවා. මම හිතන්නේ ඒක රජය සතු කර ගන්න, ඒක සභාව සතු කර ගන්න. ඊට පස්සේ මොකක් හරි කරන්න පුලුවන්. හැබැයි ඒ අය ඉදිරිපත් වෙලා දුරකථන ඇමතුම් කිහිපයක් දීලා කිවුවා මෙතනට අත ගහන්න එන්න එපා භුක්තිය තියෙනවා කියලා. ඒකයි මම මේ සභා යෝජනාවක් දැම්මේ. ඔබතුමන්ලා ඒක ගැන නීත්‍යානුකූලව හොයලා බලලා ඒක සභාව සතු කර ගන්න කියලා ඉල්ලීම කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ ඔබතුමාගෙන්. ඒකෙ දිගට තාප්පයක් ඉදිකරලා වෙන් වෙලානේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී් චමින්ද මැතිතුමා ඃ-** නමුත් වැට ගහලා තියෙනවා ප්‍රධාන පාර පැත්තෙන්. වැටේ වැඩ නවත්වලා තියෙනවා මේ ප්‍රශ්නය දාපු නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ එක්කම මේකට සංශෝධනයක් ඉදිරිපත් කරන්න අර ගහ කපන්න කියලා. මහා විශාල ගහක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ ගහ කැපුවා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි මේ. ඇඹුල් මොනවා හරි ගහක් තියෙන්නේ. බුරුත ගහක් නෙමෙයි මේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී් චමින්ද මැතිතුමා ඃ-** ඒ ගහ කපන්න ඕන. ක්‍රීඩා මණ්ඩපයට කඩන් වැටෙන්න වගේ ඒක තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මේ යෝජනාවට එකතු කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී් චමින්ද මැතිතුමා ඃ-** ඒ ගහ කපලා අස්කරලා දෙන්න කියලා ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.පී් චමින්ද මැතිතුමා ඃ-** ඊළගට ගරු සභාපතිතුමනි, සී/ස අක්මීමන විවිධ සේවා සමූපකාර සමිතියේ රථ වාහන අළුත්වැඩියාවක් සම්බන්ධව අක්‍රමිකතාවයක් සිදු වෙලා තියෙනවා. ඒක ගැන සමූපාකාර සමිතිය රැක ගැනීමේ සේවකයන්ගේ එකමුතුව කියන සංගමයෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. ඔබතුමාටත් ඒකෙ පිටපතක් ලැබෙන්න ඕන. මටත් පිටපතක් ලැබුණා. මන්ත්‍රීවරු කිහිපදෙනෙකුට පිටපත් ලබා දීලා තියෙනවා. මේක ඔබතුමාගෙන් ඉදිරිපත් නොවුන නිසා මම ඉදිරිපත් කරන්නද, නැත්නම් ඔබතුමා මේක ඉදිරිපත් කරනවද කියන ඉල්ලීම සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඒකෙ වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී් චමින්ද මැතිතුමා ඃ-** ඒකෙ තියෙන්නේ අක්මීමණ විවිධ සේවා සමූපකාර සමිතියට අයත් “HB - 8392” අංක දරණ ටොයෝටා ඩොල්පින් වර්ගයේ වෑන් රථය අළුත්වැඩියාව සඳහා යොමු කරලා තියෙනවා නිසි ටෙන්ඩර් පටිපාටියකින් තොරව සභාපතිතුමාට අවශ්‍ය විදියට. ඒ වෙච්ච මුදල් වංචාව සම්බන්ධව සියළු විස්තරත් සමග සියළු කරුණු කාරණා මේ සමග ඉදිරිපත් කරලා තියෙනවා. ඔබතුමාගෙන් මේකට ඉල්ලීමක් තියෙනවා නම් ඉදිරිපත් කරන්න පුලුවන් මේක සියළු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙතුමා කියපු එකෙන් මේක පැහැදිළි වුණේ නැහැ. යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කරලා තියෙන්නේ ඉලේපෙරුම මෝටර්ස් එකට. නමුත්, මේ අය දීලා තියෙන්නේ අමිල මෝටර්ස් කියලා එකකට. අන්න ඒක තමයි මේ ප්‍රශ්නය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** මේක ගැන සමූපාකාර කොමසාරිස්ව දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී් චමින්ද මැතිතුමා ඃ-** ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස අක්මීමන ප්‍රාදේශීය සභාවටත්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවටත්. ඒ නිසා මේක දැන ගැනීම පිණිස සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ-** සමූපාකාර කොමසාරිස්වරයා ඒ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කරාවි එහෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක වහාම කරන්න කියන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඉලේපෙරුම මෝටර්ස් ආයතනයට දීලා තියෙන්නේ. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඉංජිනේරු මහතා පරීක්ෂා කරලා වාර්තාව ලබා දීලා තියෙනවා ඉලේපෙරුම මෝටර්ස් එකෙන් කරේ කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී් චමින්ද මැතිතුමා ඃ-** ඉලේපෙරුම මෝටර්ස් එකෙන් නෙමෙයි කරලා තියෙන්නේ. පින්නදූවේ අමිල මෝටර්ස් ආයතනයෙන් කරලා තියෙන්නේ. නමුත් මිල ගණන් අනුමත වෙලා තියෙන්නේ ඉලේපෙරුම මෝටර්ස් ආයතනයට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** වරලත් ඉංජිනේරුවරයා නිර්දේශ කරලා තියෙන්නේ ඉලේපෙරුම මෝටර්ස් එකේ මිල ගණන් වලට. නමුත් අර මිල ගණනට දීලා තියෙනවා. ඒකෙ බිල තියෙනවා. හැබැයි අඩුවෙන් කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඊට අඩුවෙන්ද.

**ගරු මන්ත්‍රී ඩබ්.පී චමින්ද මැතිතුමා ඃ-** සී/ස අක්මීමන විවිධ සේවා සමූපකාර සමිතියේ රථ වාහන අළුත්වැඩියාවක් සම්බන්ධව අක්‍රමිකතාවයක පිළිබඳව ( සමූපාකාර සමිතිය රැක ගැනීමේ සේවකයන්ගේ එකමුතුව)

ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා ඒක ලබා දෙන්නේ කොහොමද, එයා කියපු ආයතනයට නොදැම්මානම්. ඕක මන්ත්‍රීතුමා සමූපාකාර කොමසාරිස්ට යවන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.පී චමින්ද මැතිතුමා ඃ-** ඒක තමයි. මේකෙන් පේනවා සභාපතිතුමා විසින් අක්‍රමිකතාවයක් සිදු කරලා තිබෙන බව. ඒක පැහැදිළිව පේනවා. මේකට නැවත පරීක්ෂණයක් සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඊළඟට සභාපතිතුමා තවත් එකක් මතක් කරන්න තියෙනවා. ලේකම්තුමා ඉන්න නිසා එතුමත් මේක ගැන දැන ගන්න ඕන. ඊයේ දිනයේ ඔබතුමාටත් බොහොම චෝදනා එල්ල කරමින් මීපාවල ප්‍රදේශයේ මහත්තයෙක් ඇවිල්ලා වීදි පහන් අළුත්වැඩියා කරේ නැහැ කියලා පැමිණිල්ලක් කරලා තිබුණා. ලේකම්තුමා සිද්ධිය නොදන ඒ අවස්ථාවේදී ඒක ගැන කතා කරලා තිබුණා. නමුත් ඔබතුමන්ලා සියළු දෙනාම දන්නවා අපිට මාසෙකට දවස් දෙකක්, තුනක් තමයි විදුලි වාහනය ලැබෙන්නේ. මට ඉල්ලීමක් කරා ඒක හදලා දෙන්න කියලා. මම කිවුවා සතියක් විතර ඉවසන්න කියලා වාහනය දෙනකම්. වාහනය ආවම ඒක හදලා දෙන්නම් කියලා මම කිවුවා. නමුත් බීමත්ව මගේ සේවා ස්ථානයට ඇවිත් බොහොම කැත විදියට බැන්නා. මන්ත්‍රීවරයෙකුට සභාවේ ප්‍රකාශ කළ නොහැකි ආකාරයට බැනලා මෙතන ඇවිත් ඔබතුමාටත් චෝදනා කරලා තිබුණා. අන්තිමට ඒ ලයිට් එක දාන්න එපා කියලා මම කිවුවා. මම කියනකම් ඒ ලයිට් එක දාන්න එපා කියලා මම කිවුවා. එහෙම කරන්න ඕන නැහැ. මම පොරොන්දු වුණා ඒක හදලා දෙනවා කියලා. හැබැයි සතියක් ඉවසන්න බැරුව කරපු ඒ චෝදනාව ගැන ලේකම්තුමා දන්නේ නැහැ. නමුත් ලේකම්තුමාට ඒ ගැන චෝදනා කරලා තිබුණා මෙහෙට ඇවිල්ලා. අද උදෑසනත් එතුමා ඔබතුමාට සහ මට ඒ චෝදනාව කරනවා. මේක ගැන අනිත් සියළුම මන්ත්‍රීවරුන් දැන ගත යුතුයි. සාධාරණයක් නැත්තේ නැහැ. අනිවාර්යයෙන්ම ඒක හදලා දෙනවා. හැබැයි එහෙම කෙනෙකුගේ යම් යම් ආකාරයේ ගැරහුම් වලට යටත් වෙලා, චෝදනා වලට යටත්වෙලා වීදි ලාම්පු සකස් කරලා දෙන්න අවශ්‍ය නැහැ කියලා මම සභාවට ඉදිරිපත් කරනවා. ඒ වැඩේ මම කරලා දෙනවා. ඒක කරලා නොදී ඉන්නේ නැහැ. ඒකත් ඔබතුමන්ලා දැන ගත යුතුයි කියලා මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 25.** මාම්පිටිය මහවත්ත මාර්ගයේ පිවිසුම සඳහා සවිකර තිබූ එල්.ඊ.ඩී වීදි ලාම්පුව ගලවාගෙන ගොස් ඇති බැවින් ඒ සඳහා නව එල්.ඊ.ඩී වීදි ලාම්පුවක් සවි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මාම්පිටිය, මහවත්ත පිවිසුමේ නව විදුලි ලාම්පුවක් සවි කරලා තිබුණා. මම දැක්කා ඒක සතියක් විතර තියෙනවා. ඊට පස්සේ ඒ වීදී ලාම්පුව ගලවාගෙන ගිහිල්ලා තියෙනවා. මට ඒ ඇතුලේ ඉන්න කෙනෙක්ගෙන් පැමිණිල්ලක් ආවා මෙහෙම වීදි ලාම්පුවක් සවි කරා නමුත් ඒක ගලවා ගෙන ගියා කියලා. එහෙම නම් ඒක ගලවා ගෙන යන්න අදහස් කර ගෙන ඉන්නවා නම් ඒක හයි නොකර ඉන්න ඕන. ඒකට නව එල්.ඊ.ඩී. විදුලි ලාම්පුවක් කොහෙන් හරි හොයලා සවි කරලා දෙන්න කියලා මගේ ඉල්ලීම තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පරීක්ෂා කරලා බලමු.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** හයිකරපු එක ගලවාගෙන ගිහිල්ලා තියෙන්නේ. ඒක හයි නොකර හිටියා නම් ගැටළුවක් නැහැ. එතකොට මිනිස්සු මුකුත් කියන්නේ නැහැනේ. හයි කරපු එක ගැලෙව්වට පස්සේ තමයි කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක බලන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 26.** මහවත්ත මාර්ගයේ පිවිසුමේ සිට ඇතුළතට යන විට ඇති පළමුවන නිවසේ පදිංචි අනුර මහතා විසින් මහවත්ත මාර්ගය අවහිරවන ලෙස යොදා ඇති ස්ථිර කොන්ක්‍රීට් කොටස ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මහවත්ත මාර්ගයේ ඇතුළට යනකොට අනුර මහත්තයා අනවසරයෙන් තාප්පයක් බැඳලා තියෙනවා. ඒකට නම් ගැටළුවක් නැහැ. මොකද, ඒක අනවසරයෙන් ඉදිකරපු කතන්දරය ඇත්ත. හැබැයි වැට තියෙනවාට වැඩිය ඒක හොඳයි. වාහන වල දෙපැත්තේ ලී කෝටු අරවා මේවා ගැවෙනවා. ඒක කරපු එකෙන් හොඳකුත් තියෙනවා වැරැද්දක් වුණාට. නමුත් කොන්ක්‍රීට් ස්ථරයක් දාලා තියෙනවා ටේපර් නොකර. ගැට්ටක් එක්ක දාලා තියෙන්නේ ඒක මහවත්ත පාරේ. ඒක නිසා වෙන්නේ දැන් ඇතුලේ ඉඳලා වාහනයක් එනකොට ඒ වාහනය ඒක දකින්නේ කිට්ටුවටම ගියාම. වාහනය කිට්ටුවටම ගිහින් වම් පැත්තට අයින් කරලා නැවත පාරට දාන්න අර ගැට්ට උඩින් පැනලා යන්න ඕන. ඉතිං ඒක නිසා කරුණාකරලා ඒ ගැට්ට අයින් කරන්න. ඒකත් වැරදියි පාරට දාපු එක. පාරට කොහොමත් දාන්න බැහැනේ. ඉතිං ඒක නිසා යම් විදියකට ඒක ටේපර් කරලා දානවා නම් ගැටළුවක් නැහැ. පාරට අවහිර නොවන විදියට ඒක හදා ගත්තට අපිට කමක් නැහැ. ඒකට අපේ විරෝධතාවයක් නැහැ. ඉතිං ඒක නිසා කරුණාකරලා ඒක බලලා සුදුසු විදියක් කරලා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

ඔන්න දැන් ආවා ට්‍රැක්ටරයක්. මම කිවුවානේ පස්වරු 12.30 ට කලින් එනවා කියලා. ට්‍රැක්ටරය ආවම වෙනදට කරන්නේ ඒ අය යන එක. ආයේමත් එන්නේ පස්වරු 04.30 ට විතර. මම කිවුවා එහෙම කරන්න බැහැ කියලා. දැන් ආවා නම් ගෙදර ගිහින් පස්වරු 12.55 වෙනකොට එන්න ඕන. මෙතන ඉන්න ඕනේ හවස 04.45 වෙනකම්. අත්සන් කරලා ගෙදර යන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සේවකයන්ට මොනවා හරි වුණොත් ඔබතුමාට තමයි මේකෙ වගකීම එන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිවාර්යයෙන්ම.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මෙහේ හිටියා කියලා කියන්නේ. එතකොට වගකියන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒ අය පැමිණෙන්නේ කීයටද, පිටත් වෙන්නේ කීයටද කියන එක ඔබතුමාගේ වැරදි නෙමෙයි. මීට ඉහතදී කරපු වැරදි.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 27.** කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සෙල්ලම් මිදුලේ තිබෙන අඩුපාඩු සකස්කරදෙන ලෙස ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේ යෝජනාව කරන්නේ ඇත්තටම මේ විද්‍යාලයේ ළමයෙක් පහුගිය ශිෂ්‍යත්ව විභාගයේදී ලකුණු 195 ක් ලබා ගෙන සමත් වුණා. ඇත්තටම ඒ ළමයාට තෑග්ගක් දෙන්න ඇමතිතුමා පන්සලට ඇවිල්ලා තිබුණා. ඇමතිතුමා නිකම්වත් පාසලට ඇවිල්ලා තිබුණේ නැහැ. පාසලේ අඩුපාඩු ගොඩක් තියෙනවා. ඒක ගැන අපිට කණගාටුයි. මේ පාසලට එන්නේ ගමේ ඉන්න දුප්පත්ම ළමයි ටික. මේ පාර ළමයි පහළොවක් විතර ඉන්නවා පළවෙනි ශ්‍රේණියට ඇතුළත් වුණ අය. ඉතිං ඒ දෙමවුපියන්ට මේ සෙල්ලම් මිදුල සකස් කර ගන්න හැකියාවක් නැහැ. අඩු ආදායම්ලාභී පවුල් වල ළමයි ටිකක් තමයි මේ පාසලට එන්නේ. වෙන පාසල් වලට ඒ ළමයි තේරෙන්නෙත් නැහැ. ඒ දෙමවුපියන්ට මේ පාසල ගොඩනගා ගන්න ආදායමක් ඇත්තෙත් නැහැ. ඉතිං මම මේක ඒකට අවස්ථාවක් කර ගන්නවා. සභාපතිතුමත්, මේ පාසලට ගිහින් තියෙනවා. මේ පාසලේ අඩුපාඩු රැසක් තියෙනවා. උප සභාපතිතුමාට මම කිහිපවතාවක්ම කියලා තියෙනවා මේ ගැන අවධානය යොමු කර වන්න කියලා. මේ සඳහා අවධානය යොමු කර වන්න කියලා ආණ්ඩුකාරතුමා වෙත දන්වා යැවීමට යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔය පිළිබඳව සුභපැතුම් එකතු කරන්න මම ඒ ලකුණු 195 ගනිපු ළමයාගේ නිවසට ගියා ඒ දෙමවුපියන්ව හම්බ වෙලා සුභ පතලා එන්න. ගරු අමාත්‍යතුමා කාපට් පාරක වැඩ පටන් ගන්න යන කොට පන්සලට ඇවිල්ලා තෑගි බෝග දීලා ඒ ළමයාට සුභ පැතුවා. ඒ වෙලාවේදී ගරු ඇමතිතුමා මට ප්‍රකාශ කරේ පාසලේ අඩුපාඩු ගැන. මම දන්න තරමින් රමේෂ් පතිරණ ඇමතිතුමා මැදිහත්වෙලා නැවතිලා තිබුණ ගොඩනැගිල්ලේ වැඩ අවසන් කරා. මීට අවුරුද්දකට විතර කලින්. සියළුම පන්තිකාමර සෙවිලි තහඩු කරලා දුන්නා. කඩන් වැටෙනවාට මුක්කු ගහලා

තිබුණ ප්‍රධාන ශාලාව නවීකරණය කරලා දුන්නා. ක්‍රීඩාපිටිය ක්‍රමවත් ලෙස සකස් කරලා දුන්නා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේදී ගල් වැටිය සකස් කරන්න පටන් ගත්තා. ජල සැපයුම මගේ ප්‍රතිපාදන වලින් ලබා දුන්නා. පැති බැම්මත් එක්ක පිවිසුම් මාර්ගය තාර දාලා හදලා තියෙනවා. ළමා මිදුලේ අවශ්‍යතාවය විතරයි දැන් තියෙන්නේ. පුස්තකාලය ප්‍රතිසංස්කරණය කරලා දුන්නා. මම හිතන්නේ මොකක්ද අඩුපාඩුව කියලා ප්‍රශ්නයක් තියෙනවා. ළමා මිදුලේ අවශ්‍යතාවය එදා අපිට කඩිනමින් කර ගන්න බැරි වුණා. දැන් මේ අවුරුද්දේ ගමට එන මුදලින් වැඩිම මුදල විදියට රුපියල් ලක්ෂ 30 ක් කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් යොදවලා තියෙනවා. ඒකට යෝජනාව යවලා තියෙනවා. ඒක අනුමත වෙලා ආවට පස්සේ ක්‍රීඩා මණ්ඩපයයි. ඔය ඔබතුමා කියන තව අඩුපාඩුවක් වෙලා තියෙනවා නම් ඒකත් කරලා දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට ක්‍රමයේ වැරැද්ද මොකක්ද කියලා තේරෙන්නේ නැහැ. දැන් ඔබතුමා තෑග්ග දීපු එක බොහොම හාස්‍යයට ලක් කරලා කතා කරා. මම කියන්නේ අඩුම තරමේ එතුමා ඒ කරපු එක ගැනවත්, ඒ ළමයාව මතක් කරලා තෑග්ගක් දීම සම්බන්ධවත් නෙමෙයි ඔබතුමා කියන්නේ. ඔබතුමා කියන්නේ ඇමතිතුමා විද්‍යාලයට ආවේ නැති එක ගැන. නමුත් අපේ ක්‍රමය එහෙම නෙමෙයි. ඇමතිතුමා විද්‍යාලයට යන්නේ නැහැ. කොට්ඨාශයේ මන්ත්‍රීවරයා හරහා ඒ ටික කරනවා. දැන් උදාහරණයක් විදියට හපුගල කොට්ඨාශයේ පාසල් ටික මටයි, මාදුගොඩ මන්ත්‍රීතුමාටයි කියනවා ගිහිල්ලා බලන්න කියලා. අඩුපාඩු කිවුවම ඒ ටික කරනවා. ඔබතුමාලගේ ක්‍රමයේ මොකක්ද වැරැද්දක් තියෙනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැන් එතන අල්ලපු මායිමේනේ පන්සල තියෙන්නේ. විදුහල්පතිතුමාව සම්බන්ධ කර ගෙන පාසලට ඇවිල්ලා ළමයාට තෑග්ගක් දීලා ඒ පන්තියේ ඉඳපු අනිත් ළමයින්ටත් තෑග්ගක් දීලා යන්න ඇමතිතුමාට නොහැකි වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ ඇමතිතුමාගේ ක්‍රමවේදය ඔබතුමන්ලාගේ ක්‍රමය නෙමෙයිනේ. අපේ ඇමතිතුමා කරන්නේ පන්සලට යනවා නම් පන්සලට යනවා. විද්‍යාලයට යනවා නම් විද්‍යාලයට යනවා. ඒක තමයි අපේ ඇමතිතුමාගේ ක්‍රමවේදය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඔබතුමාට දේශපාලන අධිකාරියේ ඉහළ නායකත්වය සමඟ මුහුණ දෙන්න වෙනවා අඩුයිනේ. ඔබතුමන්ලාට ආණ්ඩු බලයක් තිබුණා නම් ඒ අදාළ විෂය භාර ඇමතිවරයා විදියට වගකීම් ඔක්කොම භාර ගන්නවා නම් හරි. නමුත් ඒක ප්‍රාදේශීය වශයෙන් වගකීම් බෙදලා දීලා තියෙනවා. ඒ වගකීම් අපිට දීලා තියෙනවා. ඔබතුමන්ලා ඉහළ දේශපාලන නායකත්වයත් එක්ක ගැටෙන්නේ නැහැනේ. දැන් දේශපාලන නායකත්වයක් ඇත්තෙත් නැහැනේ. පළාත් සභාවේවත්, මන්ත්‍රීවරයෙක් හරි, ඇමතිවරයෙක් හරි නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට අඩුපාඩුව තියෙන්නේ සෙල්ලම් මිදුලනේ. හරි ඒක ආණ්ඩුකාරතුමාට දන්වලා යවන්නම්. ආණ්ඩුකාරතුමාගෙන් කෙරෙන්න කලින් අපි කරලා දෙන්නම්. එච්චරයිනේ වෙන්න ඕන.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මහ ලොකු දෙයක් නෙමෙයිනේ ඒක. ඒක කරන එක අපේ යුතුකමක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 28.** ලබුදූව උසස් තාක්ෂණ විද්‍යාලය ඉදිරිපිට ඇති ක්‍රීඩාංගනයේ තණකොළ කපා ඉවත් කරවන ලෙස යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි, ඔබතුමා කියන එක අපි කරන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ- 29.** කපුහෙම්පල මංසන්ධියේ සිට ඇල්හේනවත්ත හරහා ගොඩදූව මාර්ගයට වැටෙන මාර්ගයේ ඇති වලවල් ප්‍රීමික්ස් යොදා අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

කොතනද මේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගොඩදූව මාර්ගයයි, කපුහෙම්පල මාර්ගයයි, ඇල්හේන වත්තට යන මාර්ගය මේ. ළිඳ ගාවින් මේක යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කියන්නේ මේ ඉස්කෝලේ ඉස්සරහින් යන පාරද.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** නැහැ. පොදු ළිඳ ගාවින් තියෙන එක.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** හරි ඒ වැඩේ කරලා දෙන්නම් ඉක්මනටම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 30.** නරාවල, වලවත්ත, ගල්වල කන්දේ නිලූකා මහත්මියගේ නිවස අසළ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 31.** නරාවල, වලවත්ත, තුෂාර ගුණරත්න මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 32.** මුලන බටහිර, ආරාමය අසළ, නො. 61 නිවස අසළින් ඇති මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 33.** මුලන බටහිර, නො. 16 නිවස අසළින් ඇති මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 34.** මුලන බටහිර, අගුරුමුල්ලවත්ත මාර්ගය සහ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 35.** මගදෙණිය, කාසල්හිල්වත්තේ ක්‍රීඩා පිටිය අසළ සිට රෝහණ කඩය දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 36.** මගදෙණිය, බැද්දදෙණිය වත්ත මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 37.** අද්දරගොඩ, කන්දේගොඩවත්ත ප්‍රධාන මාර්ගය අඩි 14ක් දක්වා පළල්කොට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 38.** අද්දරගොඩ, කන්දේගොඩවත්ත අල්විස් මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 39.** වලවත්ත, ගල්වලගොඩ කන්ද ප්‍රධාන මාර්ගයේ නිරෝශාන්ත මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 40.** මුලන බටහිර, මුලන නො. 15 නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 41.** මුලන නැගෙනහිර, මුලන නො. 127 නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 42.** මුලන නැගෙනහිර, මුලන නලීන් මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 43.** මුලන නැගෙනහිර, නො. 230 නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 44.** මුලන නැගෙනහිර, මුලන කනත්ත දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 45.** මුලන නැගෙනහිර, නො.292 නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 46.** මුලන බටහිර, නො. 135 නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 47.** පන්විල, වී.සී පාරේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 48.** නරාවල, පරණ සිට්ට්‍රස්වත්ත මාර්ගයේ සිට ඇති අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 49.** නරාවල, සිට්ට්‍රස්වත්ත, අතුරු මාර්ගය සහ කෝවිල දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 50.** පන්විල, වල් ජම්බුගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-51.** පන්විල, ෆාම් එක අසළ තිලක් මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේ සියළු දේවල් සිදු වෙනවා. මේවට සල්ලි තියෙනවා. සල්ලි ගෙනල්ලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැරදිලාවත් මන්ත්‍රීධූරය නැති වෙන කොට කියන්න පුළුවන්නේ මම යෝජනා කරලා තිබුණේ කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ සභාවට වැදගත් වුණ, මගේ කොට්ඨාශයටත් වැදගත් වුණ නරාවල සිට්ට්‍රස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව දැන් මම හිතන්නේ ටෙන්ඩර් කැඳවලා තාක්ෂණික ඇගයීම් කමිටුවට දාලා වාර්තාව ඊයේ දිනයේදී සකස් කරා. ඒක කාටද ලබා දුන්නේ, ඒ ලබා දීපු ක්‍රියාපටිපාටිය මොකක්ද, මේක කවදාද කෙරෙන්නේ. මේකෙ විස්තර ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉන්දික මන්ත්‍රීතුමාගේ 56 වන යෝජනාවට තියෙන්නේ ඒක ගැන. ඒකෙදි මේක ගැන කතා කරමු.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** හරි ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමාගෙන්ද, සියළුම මන්ත්‍රීවරුන්ගෙන්ද, මන්ත්‍රීවරියන්ගෙන්ද, නිලධාරීන්ගෙන්ද අවසරයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සද්දේ මදි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඇහෙනවා මදිද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක පැහැදිළිව අහගන්න ඕන. වැදගත් දේවල් ටිකක්නේ කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කෙටියෙන්, පැහැදිළිව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් වෙලාව පස්වරු 12.35 යි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමාට හැමදාම මම නැගිටිනකොට වෙලාව මතක් වෙනවා. සභාපතිතුමාට වෙලාව මතක් කරලා දෙන්න මම නැගිටින්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කතා කරන කොට වෙලාව දැන ගන්න ඕන. නැත්නම් විනාඩි පහයි කතා කරේ කියලා කියන්නේ. ඔබතුමා ඕන තරම් වෙලාව ගන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කලබල වෙන්න එපා. ඔබතුමා හරි කලබලයිනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම අද යන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිත් යන්න ඕන. ගෙවල් දොරවල් නැතුව නෙමෙයිනේ.

**52.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ අනියම්, තාවකාලික හා කොන්ත්‍රාත් පදනමින් සේවයේ යෙදී සිටින සුදුසුකම් සහිත සියළුම සේවකයන්ට අදාළ තනතුරුවල ස්ථිර පත්වීම් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට දැනටමත් කටයුතු කරලා තියෙන්නේ. අදාළ ස්ථාන වලට අපේ නිර්දේශ යවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැනට තියෙන කාඩර් එකටද එහෙම නැත්නම් අපේ අවශ්‍යතාවය අනුවද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි. දින 180 සම්පූර්ණ අයව ස්ථිර කරන්න කියලා ඉල්ලීම් කරා. ඒ අනුව අපේ සේවකයෝ ආපු පිළිවෙලට යවලා තියෙනවා අදාළ තනතුරුවල ස්ථිර කරන්න කියලා. ඒ වගේම රියදුරු තනතුරුවල පුරප්පාඩුවක් තියෙනවා. නමුත් බඳවා ගැනීම් කරන්න අපිට අවස්ථාව ඇවිල්ලා නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පුරප්පාඩු සම්පූර්ණ කරන්න කෙනෙක්ව යොදවන්න බැරිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරන්න එපා කියලා තියෙන්නේ. රැකියා ලක්ෂය යටතේ ඒවා ලබා දෙනවා කියලා මේක තාවකාලිකව නවත්වලා තියෙනවා. අපි මේ ගැන උපදෙස් ඉල්ලලා තියෙනවා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන්. තාම ඒකට උත්තර ඇවිල්ලා නැහැ. අපිට අනුමැතිය ඇවිල්ලා නැහැ. දැනට ආණ්ඩුකාරතුමා මැදිහත්වෙලා මේකට කටයුතු කරනවා. පළාත් පාලන ආයතන රැකියා ලක්ෂයට සම්බන්ධ නැහැ කියලා කතාවකුත් තියෙනවා. ඒක අනුව ඉදිරියේදී අපිට ඒ පිළිබඳව තීන්දුවක් ලැබේවි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැනට අපිට අවශ්‍යතාවයටද කාඩර් එක තියෙන්නේ. නැත්නම් තිබුණ කාඩර් එකෙන් මේ වැඩේ කරගෙන යනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තිබුණ කාඩර් එකෙන් අපි වැඩේ කරගෙන යනවා. කාඩර් එකේ ප්‍රමාණයට අපිට තව බඳවා ගැනීම් කිහිපයක්ම කරන්න තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභා බලප්‍රදේශ ජනාකීර්ණවීමත් සමඟ සහ නාගරීකරණය වීම මත අවශ්‍යතාවයන් වැඩි වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි කාඩර් එක වැඩි කරන්න ඉල්ලලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** වැඩි කරන්නද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාඩර් එක වැඩි කරන්න ඉල්ලලා තියෙනවා. ඒකට දැන් අපි වර්ෂ දෙකක පමණ කාලයක ඉඳගෙන ඉල්ලීම් කරනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 53.** මීපාවල - පැණිදෙණිය මාර්ගයේ පැණිදෙණිය වෙල් යාය මැදින් දිවෙන මාර්ගය හරහා ගලා බසින ඇළ ඉහලින් ඉදිකර ඇති පාලම දෙපස ආරක්ෂිත වැටක් නොමැතිවීම අනතුරුදායක බැවින් මාර්ගයේ ගමන් ගන්නා ප්‍රදේශවාසීන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පාලම දෙපස ආරක්ෂිත වැටක් ඉදිකිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මීපාවල, පැණිදෙණිය මාර්ගයේ වෙල්යාය මැදින් දිවෙන මාර්ගයේ බෝක්කුව දෙපස ආරක්ෂිත වැටක් නැතුව තියෙන්නේ. මේ ගැටළුව දීර්ඝ කාලයක් තිස්සේ තියෙනවා. යම් අනතුරක් වීමේ අවධානමක් එතන තියෙනවා. ඒ නිසා මේකට අත්වැටක් සකස් කරන්න පුළුවන්ද, හැබැයි මේක පී.ආර්.ඩී. මාර්ගයක්. එතකොට සභා අරමුදල් වලින් කරන්න බැරි කමක් තියෙනවාද, පොඩි පාලමක් හැබැයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ගැන අපි පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට දන්වලා යවන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 54.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සිදු කරනු ලබන සභාවට අයත් සියළුම මාර්ගවල සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රථම සභාව දැනුවත් කිරීමටත් ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරීන් විසින් පෙන්වා දෙනු ලබන මාර්ගය දෙපස සීමා මායිම් අනුව අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වඩා යෝග්‍ය වන බැවින් ඒ සම්බන්ධයෙන් එකී ආයතන දැනුවත් කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ මාර්ග සංවර්ධනය කිරීම පිළිබඳව අපිට ඉතාමත් බරපතල ප්‍රශ්න කිහිපයක් පැන නැගිලා තියෙනවා. මොකද, බෝපෙ පෝද්දල බලප්‍රදේශය තුළ මාර්ග ගණනාවක් දැන් සංවර්ධනය වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මන්ත්‍රීතුමා මේ ගැන දන්වලා තියෙන්නේ. ලිඛිතව මේක ගැන දන්වලා තියෙන්නේ හැම ආයතනයකටම. මාස දෙකකට විතර කලිනුත් අපි මේක ගැන කතා වුණා. ඒක දන්වලා යවලා තියෙනවා සියළුම ආයතන වලට. ගාල්ල, කඩවත් සතර ප්‍රාදේශීය ලේකම්තුමියටත්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම්තුමියටත් මේ ගැන දන්වලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ වෙන කොටත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ ඒ කිසිදු අනුදැනුමක් හෝ සභාවේ සම්බන්ධවීමකින් තොරව. එතකොට ප්‍රශ්නය තමයි මට දැන් පෞද්ගලික අත්දැකීම් කිහිපයක් තියෙනවා අවට මාර්ගවල. ඒ මාර්ග දෙපස කාණු පද්ධති විධිමත්ව නැහැ. ඊට පස්සේ ඒවා පරීක්ෂා කරලා බලලා නැහැ. ඒ එන වතුර ධාරිතාවයට කාණු පද්ධතිය සරිලන්නේ නැහැ. මේවා සම්බන්ධයෙන් කිසිම අධීක්ෂණයක් වෙන්නේ නැහැ කොහේවත්ම. ඒකට හපුගල හොඳම උදාහරණයක් තියෙනවා. ඒ කාණුව අඩියක් උස නැහැ. අඩියක් පළල නැහැ. මීටර් 200 ක් විතර දිගයි ඒ කාණුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අඩි එකහමාරක් විතර උසයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම ඒක බලන්න ගියා. මම ඒක ගැන පෙන්නුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පළල අඩියක් තියෙන එක හරි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් මම කියන්නේ එතන අඩියක් නැහැ පළල. ඊට පස්සේ එතන එක ගෙදරකට ප්‍රවේශ වෙන ගේට්ටුව ළඟ තව අඟල් හයක් විතර කපලා තමයි කට්ට දාලා තියෙන්නේ. එතකොට තවත් අඩියක් විතර කොන්ක්‍රීට් ස්ලැබ් එක පහළට යනවා. එතන උස නැහැ. මම ඉංජිනේරු මහතාව ගෙන්වලා එයත් එක්ක කතා කරලා මේක පෙන්වලා දුන්නා. එයා කිව්වා මේක අනිවාර්යයෙන්ම නිවැරදි කරන්න ඕන කියලා. උඩ ඉඳලා අඩියක කාණුවකින් ලොකු වතුර පාරක් එනවා. මම හිතන්නේ එතන තියෙන කන්දක සංවර්ධනය කරන ඉඩමක් තියෙනවා. මේ සභාවෙත් පොඩි ප්‍රශ්නයක් තිබුණා ඒ සම්බන්ධව. වැහි කාලයට ඒ කාණු පද්ධතිය කිසිසේත්ම ඔරොත්තු දෙන්නේ නැහැ. ඒක හරිම පැහැදිළියි. එතකොට මම කියන්නේ ලක්ෂ ගණන් වලින් මහජන මුදල් මේවාට මේ යොදවන්නේ. මේවා නැවත නැවත කරන්න පුලුවන් කමක් නැහැ. මම කියන්නේ ඒ කරන වැඩේ නිසියාකාරව ප්‍රමිතියකින් කරන්න උත්සාහ කරනවා නම් තමයි හොඳ. මොකද හේතුව ඔබතුමා දන්නවා. අපි පාරවල් පටු කරලා සංවර්ධනය කිරීම හේතුවෙන් මිනිස්සු ඒවා අහුරා ගැනීම සම්බන්ධව ප්‍රශ්න ගොඩක් තියෙනවා. එතකොට ඒවා තියෙන මායිමෙන් මෙහාට කරනවා. මිනිස්සු ඉඩමේ මායිම කාණුවට ගේනවා. මේවා මම කියන්නේ මේ වෙලාවේදීම විසඳගන්න පුළුවන් ප්‍රශ්න. එතකොට අපි මේවාට මැදිහත් නොවන එක ඇතුළේ අතුරු ප්‍රශ්න ගණනාවක් පැන නගිනවා. ඒ නිසා මම යෝජනා කරේ මේවා ක්‍රමවත්ව කර ගන්න අපි ඒ ආයතන එක්ක සම්බන්ධ වෙලා වැඩපිළිවෙලක් යොදමු. නැත්නම් මේ සිද්ධ වෙන ඒවා නවත්වා ගන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාව හොඳයි. අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ පිළිබඳව මතු කරන්නම්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පන්විල පාරේ කාපට් එක දාලා මාස තුනක් ගත වුණේ නැහැ ජල සම්පාදන මණ්ඩලයෙන් පාර කඩලා තියෙනවා. මාර්ග සංවර්ධන අධිකාරියෙන් කොන්දේසියක් දාලා තියෙනවා වසර පහක් යනකම් කාපට් කරපු පාරක් කඩන්නේ නැහැ කියලා. පන්විල පාර ප්‍රාදේශීය සභාවට අයිති පාරක්. අපි මොකක් හරි තීන්දුවක් මේකට ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි මේ සභාවෙන් තීන්දුවක් ගත්තානේ ඒකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතනදී සභාවෙනුත් වැරැද්දක් කරලා තියෙනවා. මොකක්ද දන්නවාද, ඔය කාරණයේදී අපි කිවුවා පාර කාපට් කරන්න කලින් බට දා ගන්න කියලා. ඕකෙදී සභාව මුදල් නොගෙන හිටියානම් ඉවරයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කිසිම කාපට් පාරක් කඩන්න දෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාපට් එක දාලා මාස තුනක් යන්න කලින් පාර කඩනවා. අපේ රිසිට් එක නැතුව වතුර දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ සඳහා තමයි ඇස්තමේන්තුවට නොදා අර බට ටික දාන්න තියාගෙන තිබුණේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය ප්‍රශ්නය අපිට දිගින් දිගටම තියෙන එකක් නේ. කලිනුත් මේ සභාවේ ඕක ගැන කතා කරා. අඩු ගානේ මීටර් 200 සීමාවේ ඇතුළේ බටයක් දාලා ඒක හදලා තියමු. එතකොට ඒ හරහා මේක ගෙනියන්න පුළුවන්කම තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ මාර්ගයේ අපි ඉල්ලපු ඉල්ලපු අය බට දා ගත්තා. අපිත් ඒකට මැදිහත් වුණා. බට දාන්න අපිත් උදවු කරා. නමුත් ඒ එක්කෙනෙක් හිටියා බොහොම දරදඬු විදියට. එයා ඒකට එකඟ වුණේ නැහැ. නමුත් පාර කාපට් කරපු ගමන් එයා ඒක කැඩුවා වතුර ගන්න. මහ කුහක මිනිස්සු ඉන්නේ. ඇයිද දන්නේ නැහැ සභාවෙන් ඒක දුන්නේ. සභාවෙන් බලන්නේ නැතුව ඇති. මීටර් ප්‍රමාණය බලලා ඒක කරලා දෙන්න ඇති. ඒක නොදී හිටියා නම් ජල සම්පාදන මණ්ඩලයෙන් වතුර දෙන්නේ නැහැ. අපෙනුත් ඉතිං වැරැද්දක් සිද්ධ වුණා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අළුත්වැඩියාවක් කරද්දී අපිට ඒ සමහර දේවල් වළක්වා ගන්න පුළුවන්කම තියෙනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මෙහෙන් රිසිට් එක දුන්නොත් ජල සම්පාදනයෙන් වතුර දෙනවා. ආර්.ඩී., පී.ආර්.ඩී., ප්‍රාදේශීය සභාවද කියලා නැහැ. සල්ලි බැඳලා රිසිට් එක දෙනවා නම් වතුර දෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මගේ 54 වන යෝජනාවට ඔබතුමා කිවුවා වගේ මේක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී හරි, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී හරි සාකච්ඡා කරලා හෝ ඊට පෙර මොකක් හරි මේකට කරන්න. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු කැඳෙව්වෙම නැහැනේ. ඒ නිසා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී වේවා, ඊට පෙර හෝ වේවා මැදිහත් වීමක් කරලා මේක කරන්න. දැන් කර ගෙන යන ව්‍යාපෘතිවලට ඔබතුමා මැදිහත් වෙන්න. එතකොට ඒක ප්‍රායෝගික වේවි. නැත්නම් මේක වුණාට පස්සේ ලක්ෂ ගණන් වියදම් කරලා ඒ ඉදිකිරීම් කඩන්න බැහැ. කරුණාකරලා මේකට මැදිහත් වෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒකට කතා කරන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 55.** ගාල්ල - බද්දේගම මාර්ගය අසබඩ හෝළුවාගොඩ වෙල් යාය ගොඩ කරමින් සිදු කරනු ලබන ඇවිදින මං තීරු ව්‍යාපෘතිය සම්බන්ධ ව්‍යාපෘති වාර්තාව සහ ඊට අදාළ වියදම් ඇස්තමේන්තුව අදාළ ආයතන වෙතින් කඩිනමින් ගෙන්වා ගෙන ලබන මහා සභාවේදී සභාගත කිරීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** **:-** මෙතුමාට හෝළුවාගොඩ වෙල්යාය ගැන මාර අමාරුවක්නේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** **:-** යාය ගැන අමාරුවක් තියෙන්න ඕන. මොකද, අක්කර දහස් ගාණක භූමියක් මේක. යාය ගැන අමාරුවක් නැත්නම් ප්‍රශ්නයක් තියෙනවා. ඒක තමයි ඒක මෙච්චර කාලයක් තිබුණේ. මෙච්චර කාලයක් ආණ්ඩු කරා. මුකුත් කරේ නැහැ. අපි කියන්නේ ඒකයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** **:-** දැන් ඔබතුමා ඒක කරන්න දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** **:-** දැන් ඔබතුමන්ලා කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** **:-** චැනල් එකක් අරන් ගිහින් අර මොකක්ද කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** **:-** පොඩ්ඩක් ඉන්න. චැනල් එක ගැන අපි වෙනම කතා කරමු.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** **:-** හෝළුවාගොඩ වෙල්යාය අස්වද්දන්න ගිහින් තමයි ඩික්සන් රාජා සභාපතිතුමා ගෙදර යැව්වේ. හෝළුවාගොඩ වෙල්යාය අස්වැද්දුවා. ඩික්සන් රාජා සභාපතිතුමා ගෙදර යැව්වෙත් ඒකෙන් තමයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** **:-** ගරු සභාපතිතුමනි, ඒ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ ව්‍යාපෘති වාර්තාව හෝ අදාළ ඇස්තමේන්තුව සම්බන්ධව සභාව දැනුවත්වීම වැදගත් වෙනවා. සභාවේ මන්ත්‍රීවරු විදියට, සභා බල ප්‍රදේශයේ ජනතාව විදියට ඒක දැන ගැනීම වැදගත් වෙනවා. කරුණාකරලා ඒ නිසා මෙතෙක් මේ සම්බන්ධව කිසිදු සාකච්ඡාවක් කරලා නැහැ. මට මතකයි මේ ව්‍යාපෘතිය ගැන ඔබතුමා මුලින් කතා කරේ වැව් දෙකක් හදලා වෙල්යාය අස්වද්දවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** නැහැ. යාය අස්වද්දනවා කියලා කිවුවේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** **:-** මම ඒක ගෙනල්ලා පෙන්වන්නම්. පොඩ්ඩක් ඉන්නකෝ. හැබැයි දැන් මේ යන්නේ වෙන ව්‍යාපෘතියක්. එතකොට ඒ ව්‍යාපෘතිය එක පැත්තක තියෙනවා. අනිත් පැත්තේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් කරන වෙනත් ව්‍යාපෘතියක් තියෙනවා. ඒක වගා කිරීමේ ව්‍යාපෘතියක්. ඒකයි, මේකයි, දෙකක්. මම යෝජනා කරන්නේ මේක ගැන සභාව දැන ගත යුතුයි. ඒක ගැන සභාවේ මන්ත්‍රීවරු දැන ගන්න ඕන. ඒක නිසා මේක සභාගත කරන්න කියන ඉල්ලීම කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** මෙහෙමයි මන්ත්‍රීතුමා. මේ වන විට මේක ඇස්තමේන්තු හදලා යන එකක් නෙමෙයි. තේරුණාද, මේකෙ සියළුම කටයුතු කරන්නේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ. මේක කොන්ත්‍රාත් දීලා කරනවා නෙමෙයි. ඒ කියන්නේ මේ අයගේ යන්ත්‍ර උපකරණ තමයි භාවිතා කරන්නේ. ඒකයි රාජ්‍ය ඉදිකිරීම් ආයතනයයි මේක කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** **:-** ඕනම දේක සැලැස්මක් සහ වැය ඇස්තමේන්තුවක් තියෙනවා. ඒ සැලැස්ම සහ ඇස්තමේන්තුව මම ඉල්ලන්නේ. ව්‍යාපෘති වාර්තාවක් තියෙනවා නම් ඒකට වැය ඇස්තමේන්තුවක් තියෙනවා. ඒක ගෙන්වලා සභා ගත කරන්න. ව්‍යාපෘති වාර්තාවක්, වැය ඇස්තමේන්තුවක් නැතුව වැඩක් කරන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** මෙහෙමයි. මේකෙ ඇස්තමේන්තුව තියෙනවා. නමුත් මේක ටෙන්ඩර් කරලා එහෙම යන එකක් නෙමෙයි. අදාළ ආයතනයෙන්ම තමයි මේක කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** **:-** ඒක වෙන්න පුලුවන්. ඒක වෙන්න බැරි දෙයක් කියලා නෙමෙයි මම අදහස් කරේ. ව්‍යාපෘති වාර්තාව ගෙන්වලා සභා ගත කරන්න කියලා මම යෝජනා කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** **:-** ඒක නවත්වන්න මොකක් හරි ක්‍රමයක් යොදවන්න ඕන ඇති. ඒක නිසා ඕක ගෙනත් දෙන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා** **:-** ඕක නවත්වන්න ඕන නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා** **:-** දූෂණයක් සිදු වෙනවා නම් ඕක නවත්වනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** **:-** උසාවියටවත් යන්න විදියක් නැහැ ඕක නවත්වා ගන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** **:-** නවත්වන්න ඕන නැහැ ඕක හරියට කරනවා නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කලබල වෙන්න එපා ඉතිං. ඔබතුමා කලබල වෙනවානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔබතුමා මේ වගේ යෝජනා ගෙනාවම මේක කරන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඉන්නවා එතන. මම කතා කරේ එතුමත් එක්ක. පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. හික්මීමක් නැහැනේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** හෝළුවාගොඩ ගෙයක් හදලා දූන් ගේට්ටුවකුත් දාලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔව්. මම කියන්නේ අනවසරයෙන් හදනවා. ඔය ප්‍රශ්නය තියෙනවා නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව අක්කර පහ, පහ අත්පත් කර ගන්නවා. වැව් දෙකක් හදනවා. ඒ වැව් දෙක කැපූ ඇළ දක්වා සම්බන්ධ කරනවා. ඒ අතර, ඒවාත් අත්පත් කර ගන්නවා. ඕකෙදී සම්පූර්ණයෙන්ම වැව් දෙකයි, ඊට පස්සේ ඇවිදින මංතීරුවකුයි හදන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම අහන්නේ මේ ව්‍යාපෘතිය සම්බන්ධව මොකක් හරි දැක්මක් තියෙනවානේ. ඒකට මොකක් හරි සැලැස්මක් තියෙනවානේ. ඒ සැලැස්මට අනුවනේ ඕක කරන්නේ. නිකං නෙමෙයිනේ ඕක කරන්නේ. එහෙම නිකං කරන්නේ නැහැ. මම කියන්නේ ඔබතුමන්ලාගේ දැක්ම සහ අරමුණු එක්ක සකස් කරපු සැලැස්මක් ඇතිනේ. ඒ සැලැස්ම ගැන අපිටත් දැන ගන්න සලස්වන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර බෝඩ් එකේ ඒක තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බෝඩ් එකේ සැලැස්මක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන බෝඩ් එකක් තියෙනවා. ඒකෙ තියෙනවා ප්ලෑන් එක. ලස්සන ප්ලෑන් එකක් ඒකෙ තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා රූකඩ චිත්‍රයක තියෙන එකයි, ව්‍යාපෘතියක සැලැස්මක් කියන එකයි අඳුරන්නේ නැද්ද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ව්‍යාපෘති වාර්තාව ගෙනත් දෙන්නම් කියන්න. එතකොට වැඩේ ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඔබතුමා මාධ්‍ය සාකච්ඡා කැඳවන්න කලින්, අරවා කරන්න කලින්, මේවා කරන්න කලින් ඒක ඇහුවා නම් හොඳයි කියලා මම හිතනවා. මම හිතනවා ඔබතුමා ඊට කලින් ඕක ගැන ඇහුවානම් හොඳයි කියලා. දැන් ඕක ආරම්භ කරලා මාස පහක් විතර වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, දැන් නෙමෙයි මම මේ හෝළුවාගොඩ වෙල්යාය සම්බන්ධව පහුගිය අවුරුදු පහ ඇතුළත වියදම් කරපුවා මොනවද කියලා, ක්‍රියාත්මක කරපු සංවර්ධන ව්‍යාපෘති මොනවද කියලා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ප්‍රශ්නයක් දාලා ඉල්ලලා තියෙනවා. අද වෙනකම් මේක ගැන විස්තර හම්බ වුනේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මට මේකෙ. කරන්න දෙයක් යෝජනා කරන්නකෝ මේක කරන්න හොඳ නැහැ කියලා. ඔබතුමාගේ යෝජනාව මොකක්ද කියන්නකෝ. මේ කරන වැඩේ හොඳ නැද්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම ඒක හොඳ නැහැයි කියන්නේ නැහැ. මිනිස්සුන්ට ප්‍රශ්නය තිබුණේ ගරු සභාපතිතුමා හෝළුවාගොඩ යාය සම්බන්ධව. මිනිස්සු ඉල්ලුවේ මොකක්ද, ගොවිතැන් කරන්න බැරි වෙලා තියෙනවා. රැඳිලා තියෙන ජලය ඉක්මනට බස්සවන්න බැහැ. ඒකට මොකක් හරි ක්‍රමවේදයක් හදන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. ඒක වැරදි වැටහීමක්. මේකෙ මේ වැව් හදන්නේ ජලය පාලනය කිරීමට නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නේ මිනිස්සුන්ට තිබුණ ප්‍රශ්නය මේක නෙමෙයි. පොදු ජනතාවට තිබුණ ප්‍රශ්නය මම මේ කිවුවේ. ගොවියාට තිබුණ ප්‍රශ්නය තමයි තමන්ගේ වගාව කර ගන්න බැරි එක. ඒක නිසා තමයි හුගක් කුඹුරු අතහැරියේ. ඒක එකම හේතුව නෙමෙයි. මම කියන්නේ නැහැ ඒක එකම හේතුව කියලා. මිනිස්සු එතන වගා කරන එක අතහැරියේ වගා කරන්න බැරිකම නිසා විතරක් නෙමෙයි. මූලිකවම මේ හේතුවත් ඒකට බලපානවා. තව මිනිස්සුන්ට තිබුණ ප්‍රශ්නය වුණේ මේක වගා කරේ ගොඩක් අඳගොවියෝ. සමහර ඒවා වගා කරේ අයිතිකාරයෝ නෙමෙයි. සමහර අයිතිකාරයන්ට මේක වගා

කර ගන්න වුවමනාවක් තිබුණෙත් නැහැ. මේකට ඉතිං විවිධ ප්‍රශ්න තියෙනවා. මේක සම්බන්ධව එක ප්‍රශ්නයකට ලඝු කරලා කතා කරනවා නෙමෙයි මේ. මම කියන්නේ මේ ගොවියන්ට වුවමනාව තියෙන්නේ, දනටත් වගාවේ යෙදෙන ප්‍රදේශවල ගොවියන්ට ඕකට දැඩි වුවමනාවක් තියෙනවා. නමුත් ජල අර්බුදය තියෙනවා. වැසි කාලයට ජලය රැඳෙනවා. අපි ගොවිතැන් කරන්නේ වාරි ජලයෙන් නෙමෙයිනේ. අපි ගොවිතැන් කරන්නේ වැහි ජලයෙන්. එතකොට ප්‍රශ්නයක් තියෙනවා. එතකොට ඒ ප්‍රශ්නයට තමයි ගොවියෝ උත්තරයක් ඉල්ලුවේ. නමුත් දැන් ගොවියන්ට ලැබුණේ වෙන එකක්. එතන ගැටළුවක් තියෙනවා. ඒක වෙනම කතා කරමු. මේක කරලා ඉවර වෙලා ඒක කරන්න පුලුවන්. එහෙමනම් ඒක අපි වෙනම සාකච්ඡා කරලා යෝජනා කරලා කරමු මෙන්න මේ යෝජනාව කරන්න කියලා. ඒක කරන්න පුලුවන්නම් වැඩිය හොඳයි. ගොවියෝ ඉල්ලුවේ අතන පම්ප් හවුස් එකක් දාලා වතුර ටික ඉක්මනට බස්සවන්න කියලා. මොකද, මෙහේ යටවෙන කොට දවසක් දෙකක් ඇතුළත වතුර ටික බැස්සම මෙච්චර හානියක් සිදු වෙන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඒ වැඩෙත් කෙරෙනවා. අතන පාලම පළල් වෙනවා අඩි 68 කට. ඔය තිබ්බ්ච පාලම වගේ දෙගුණයක පාලමක් ඔතනට එනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මට මේක ප්‍රායෝගිකව කියන්න. මම දැන ගන්න ඕන නිසා අහන්නේ. මම දකපු හෝළුවාගොඩ ඇළේ පළලත් එක්ක සහ දෙපැත්තේ තියෙන ඉඩම්වල ස්වභාවයත් එක්ක අඩි 30 ක් වත් පළල නැති හෝළුවාගොඩ ඇළේ පාලම අඩි 68 කට පළල් කරන කොට දෙපැත්තේ ඉඩම් වලින් කොහොමද ඒක ගන්නේ. ගොඩ ඉඩම්වල තියෙන ඉඩ ටික අරගෙන පාලම උඩින් යනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අවශ්‍ය ප්‍රමාණයට ඔක්කොම පවරාගෙන තියෙන්නේ. අත්පත් කර ගැනීම කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අර ව්‍යාපෘති වාර්තාව සභාවට අරගෙන දෙන්නකෝ අපිට බලන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා දඟලන්න එපා. වැඩේ යනකම් බලන්න. අපි ඒක කරන්නම් අවශ්‍ය වෙලාවට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දඟලන්නේ නැතුව තමයි මේ කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දැන් ඕක අහන්නේ නැතුව එක එක ඒවා කරන්න කලින් ඇවිල්ලා ඇහුවා නම් අපි ඕක දෙනවානේ. ඔබතුමා මේක ගැන ඔය මට්ටමෙන් නෙමෙයි. උද්ඝෝෂණ කරන්න, මාධ්‍ය සාකච්ඡා කරන්න මිනිස්සුන්ව විරුද්ධ කරන්න ඒවා කරන්න කලින් ඇහුවානම් ඕක දෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම එකක් නැහැ. මම දැන් මේක ඉල්ලලා තියෙනවා. මාධ්‍ය සාකච්ඡා තියන එක හරි, මේවා කරන එක හරි වෙනම වැඩක්නේ. ඒක ඔබතුමා මේකට අදාළ කර ගන්න එපා. ඒක ඔබතුමා බාධාවක් කර ගන්නේ නැතුව යෝජනා කරලා තියෙන මේවා එක සභාගත කරන්නකෝ. එතකොට අපි ඒක අධ්‍යයනය කරන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි ඒ වාර්තාව දැන ගැනීම පිණිස ගෙනත් දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යෝජනාව ස්ථිර කරලා තියන්නකෝ. මේක අපි බලමු. අපි අනිත් ආයතන එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන්න ඕනනේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 56.** යෝජිත ආදාහනාගාරයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම් ගතවීමට ප්‍රථම තෝරා ගනු ලැබූ ආයතනය සතු හැකියාව, එකී තෝරාගැනීමට අදාළ නිර්ණායක සහ පසුගිය වසර තුනක කාලය තුළ එකී ආයතනය විසින් සිදු කරනු ලද ආදාහනාගාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු මීළඟ සභාවාරයේදී සභාගත කිරීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මෙහෙම යෝජනා කරන්නේ වෙන මොකක්වත් නෙමෙයි ගරු සභාපතිතුමනි, අපි මේක දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කරලා, විවිධ වාද විවාද මැද්දේ අපි එකඟතාවයකට ආවා අප්ග්‍රාෆ්ට් ක්‍රමයට මේක කරන්න ඕන කියලා. මොකද, වඩා සුදුසු ඒ ක්‍රමය කියන එක සහ ඊට අදාළව ඒකට සුදුසුම තාක්ෂණ දැනුම තියෙන ආයතනය විදියට තර්ඩ් එකට කතා කරලා තර්ඩ්

ආයතනය එක්කත් සාකච්ඡා කරලා ඒ ආයතනයෙන් මේ ව්‍යාපෘතිය සම්බන්ධව වාර්තා ඉල්ලා ගෙන මේක දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් කරලා මේ ක්‍රියාවලියට අපි අනුගත වුණා. එතකොට ගරු සභාපතිතුමනි, මේකට අපි අවසානයේදී ටෙන්ඩර් කැඳෙව්වා. ටෙන්ඩර් කැඳවනකොට ප්‍රශ්න ගොඩක් තිබුණා. ටෙන්ඩරයට අදාළ ව්‍යාපෘති වාර්තාව කැඳවනකොට අපි අප්ග්‍රාෆ්ට්, ඩවුන්ට්ග්‍රාෆ්ට් ක්‍රම දෙක ඇතුලේ අප්ග්‍රාෆ්ට් ක්‍රමයට ආදාහනාගාර ඉදිනොකරපු ආයතන පවා මේකට එකතු වෙලා මිල ගණන් ඉදිරිපත් කරා. ටෙන්ඩර් ඉදිරිපත් කරා. එතකොට ප්‍රශ්නයක් තියෙනවා. මේ ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ඇතුළේ මිළ ගණන් සංසන්දනාත්මකව බැලුවොත් එහෙම සමහර ඒවා, ඒ අය නොකරපු තාක්ෂණයකටත් අලුතෙන් එකතු වෙන්න පුලුවන්. අපි කියන්නේ නැහැ ඒක බැහැ කියලා. අලුත් තාක්ෂණ නිලධාරීන් ඉන්න පුලුවන්. එහෙම වෙන්න පුලුවන්නේ. නමුත් ඒකට සුදුසුකම් ලබන ආයතනයට තියෙන හැකියාව සම්බන්ධව අපිට අවබෝධයක් තියෙන්න ඕන. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා මේකට නර්ඩ් ආයතනය මැදිහත් වෙයි කියලා. එහෙම කරනවා නම් වටිනවා. නර්ඩ් ආයතනය වගකිව යුතු ආයතනයක්. දැනටමත් යම් ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් නීතිමය කටයුත්තක් මතු වුණොත් ඒ තාක්ෂණය සම්බන්ධව වග කියන්න ඉන්න ආයතනය තමයි නර්ඩ් ආයතනය. එතකොට ඒවාට නර්ඩ් ආයතනය තමයි මැදිහත් වෙන්නේ. නර්ඩ් ආයතනය මැදිහත් නොවන ක්‍රියාවලියකට ගියොත් එහෙම නීත්‍යානුකුලභාවය සම්බන්ධයෙන් අපි අභියෝගයට ලක් වෙනවා මොකක් හරි යම් ප්‍රශ්නයක් මතු වුණොත්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටින්නේ මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න කලින් මේක සම්බන්ධව අවබෝධයක් ලබා ගන්න මේ තොරතුරු ටික සභාගත කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අපි ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ටෙන්ඩර් කමිටුවට අපි ඉදිරිපත් කරානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවත් අපි ඉදිරිපත් කරනවා ටෙන්ඩර් කමිටුවට. තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාවේ නිර්දේශයන් ටෙන්ඩර් කමිටුවට ඉදිරිපත් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කමිටුවට දාලා සභාවටත් දාන්න ඕන. සභාවෙන් ඒක ගැන දැන ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිත් දැන ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමිටුවේ ඉන්න අය දැන ගන්නවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කමිටුවේ ඉන්න අය විතරක් දැන ගත්තට මදියි සභාපතිතුමා. මේවා මහජන මුදල්. මේ කෝටි ගණන් සල්ලි කියන්නේ මහජන මුදල්. මේ සම්බන්ධව අපිටත් ප්‍රශ්නයක් තිබුණා මේ කරන ක්‍රමවේදය ගැන. දැන් මේ ක්‍රමවේදය හරි. අප්ග්‍රාෆ්ට් ක්‍රමයට තමයි අපි හදන්න ගිහින් තියෙන්නේ. ඒක හදන්න යනකොට ප්‍රශ්න කිහිපයක් තියෙනවා ගරු සභාපතිතුමනි, එකක් මේකෙ ව්‍යාපෘතියේ කොටස් දෙකක් තියෙනවා. තාක්ෂණික කොටස් දෙකක් තියෙනවා. ගොඩනැගිලි ඉදිකිරීමේ තාක්ෂණයයි, අනික දාහක කුටීරය ඉදිකිරීම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ මෙහෙමයි මන්ත්‍රීතුමා. ඔබතුමා ඉන්න ස්ථාවරයේ මමත් ඉන්නවා. මේක බොහොම පැහැදිළිව කියන කාරණයක්. තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් දීලා තියෙනවා ඒ තුන් දෙනාගේ එකඟතාවයෙන්. දන්න විදියට ඒ නිර්දේශයන් අඩුම මිල ගණන් ඉදිරිපත් කරපු ආයතනයට තමයි දීලා තියෙන්නේ. නමුත් මගේ හැඟීම ඊට වැඩිය වෙනස්. දිගින් දිගටම ඔතනදී මම දරපු ස්ථාවරයේදී එක තැනකදී ඔබතුමාම මතු කරා අප්ග්‍රාෆ්ට් ක්‍රමයේ ප්‍රවීණයන්ට, ඒ කියන්නේ අප්ග්‍රාෆ්ට් ක්‍රමයේ පළපුරුද්ද තියෙන අයට මේක දෙන්න ඕන කියලා. ඒ මතයේ මම එදත් ඉන්නවා, අදත් ඉන්නවා, හෙටත් ඉන්නවා. ඒ වගේම තමයි දැන් ඒ ලබා දීපු නිර්දේශ කෙසේ වෙතත් ඒ අදාළ එක ආයතනයක් මේකෙන් අයින් වෙනවා වැඩිම ලංසුව තියපු ආයතනය ඒ. ඉතුරු ආයතන දෙක ගැන බලලා ඒ අය කරපු සියළු දේ ගැන අඩුම තරමේ කරපු ඒවා සන්සංදනාත්මකව බලලා තමයි ටෙන්ඩර් මණ්ඩලය තීන්දුවක් ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම මේ මතු කරන්න හැදුවෙත් ඒකයි. ප්‍රශ්නය තියෙන්නේ මෙතනදී මේ ආදාහනාගාරය ඉදිකිරීමේ සමස්ථ ව්‍යාපෘතිය කොටස් දෙකකින් යුක්තයි. එකක් තමයි ආදාහනාගාරයේ තාක්ෂණ ක්‍රියාවලිය. අනිත් එක තමයි ගොඩනැගිල්ල ඉදිකිරීම. දැන් ගොඩනැගිල්ලට කෝටි එකහමාරක වගේ මුදලක් යන්නේ මට මතක විදියට. මේකට ඉදිකිරීම් ආයතනය සතු හැකියාව කියන එක ගත්තොත් එහෙම CIDA එකේ C5 – C7 එකක් තිබුණම ඇති. නමුත් ප්‍රශ්නය තියෙන්නේ මේකෙදී අපිට දැනෙනවා මේක එක කණ්ඩායමකට පවරන්න වුවමනාවෙන් මේකෙ හැකියාව C5

වලට තෝරාගෙන තියෙනවා. ප්‍රශ්නය තියෙන්නේ ඒකයි. මේකෙදී ගොඩනැගිල්ලට යන වියදම බැලුවම මේ ඉදිකිරීම් ආයතන සතු හැකියාව බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම වුණත් මන්ත්‍රීතුමා මගේ හැඟීම නම් අපිට දුන්නේ කවුද, මේවා කරන්නේ කොහොමද කියන එක නෙමෙයි වැදගත්. පළවෙනි කාරණය අප්ග්‍රාන්ට් ක්‍රමය පිළිබඳව පළපුරුද්දක් තියෙන්න ඕන. ඒක තමයි මෙතන තියෙන මූලිකම සුදුසුකම. දැන් උදාහරණයක් මම කියන්නම්. හදවත සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙක් ඉන්නවා. අක්මාව සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙකුත් ඉන්නවා. නමුත් මේ දෙන්නම විශේෂඥ වෛද්‍යවරු. අපිට හදවත සම්බන්ධ සැත්කමක් කර ගන්න ඕන වුණාම අක්මාව සම්බන්ධව ඉන්න ශල්‍ය වෛද්‍යවරයාට භාර දීලා හරියන්නේ නැහැ. තේරුණාද, දෙන්න ඕන අරයට. එතනදී ඒ ඉල්ලපු අය අතරින් වැඩිම සුදුසුකම් තියෙන කෙනාට දෙන්න ඕන. තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් ගන්න ඕන ඒ නිර්දේශ. මේකට මම පුද්ගලිකව මම මැදිහත් වෙනවා. මොකද මේකට අපිට චෝදනාවක් ගන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලියේදී අපිට වුවමනා උපකරණයන් මිලදී ගන්න තියෙනවා නම්, ඒ උපකරණයම මිලදී ගන්න අපිට ඕනකම තියෙනවා නම් ඒකටම අනන්‍ය වූ ලක්ෂණයක් නිර්ණායකයක් විදියට දානවා මිල ගණන් කැඳවන කොට. එතකොට අනිවාර්යයෙන්ම ඒ නිර්ණායකයන් තියෙන්නේ ඒ ආයතනය සතුව තමයි. එතකොට ඒ නිර්ණායකයන් වෙන කාටවත් නැහැ. ඒක ඒ අයට අනන්‍ය වෙච්ච එකක්. ඒක දාලා මිල ගණන් කැඳවපු ගමන් අර අයට විතරක් ඒ ටෙන්ඩරය යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුදල් කමිටුව විදියට දැන් ඔය තුන් ගොල්ලොම කරපු ඒවා බලමු. ඒ කරපු ටික ස්ථානීය පරීක්ෂණයක් කරමු අදාළ තැන් වලට ගිහිල්ලා. මේකට එකඟයි නේද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ටෙන්ඩර් එකට දාපු කොන්දේසි සම්බන්ධව මට පොඩි ප්‍රශ්නයක් තියෙනවා ගරු සභාපතිතුමනි, ඇයි මේ C5 වලට මේක දුන්නේ කියලා. ඒ ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනයි. සමස්ථ ව්‍යාපෘතිය වෙනයි. ඉදිකිරීමට යන්නේ කෝටි එකහමාරක වගේ මුදලක්. ඒ ගොඩනැගිල්ලේ ඉදිකිරීම වෙනයි. ගොඩනැගිලි තාක්ෂණය වෙන එකක්. මේකෙ ආදාහනාගාර තාක්ෂණය තව එකක්. ඒකට යන්නේ වෙනම මුදලක්. මේ දෙක එකතු කරහම තමයි මුළු මුදල එන්නේ. ඉදිකිරීමේදී CIDA එකේ C5 වලට යන්නේ ඇයිද කියන එක තමයි මට තියෙන ගැටළුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කෝටි තුනහමාර නම් අපිට යන්න වෙන්නේ C5 වලට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ සමස්ථයටනේ. ඕකේ අංග දෙකක්නේ තියෙන්නේ. තාක්ෂණ දෙකක් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ඒක එකක් යටතේ දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය තර්කය අපි කතා කරමු තවදුරටත්. ගරු සභාපතිතුමා ඔබතුමත් කැමති නම් අපි ඉස්සරහදී මේ සම්බන්ධව තව සාකච්ඡා කරලා බලමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම බොහොම විවෘතව ඔබතුමන්ලා මුදල් කමිටුව විදියට ගන්න ඕනම තීන්දුවකට එකඟයි. හැබැයි මෙහෙමයි. ඒ තාක්ෂණය යටතේ කරලා තියෙන්න ඕන සහ ඒ කරපු ඒවා සාර්ථක වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි මහජන මුදල් එක්ක ගනුදෙනු කරන කොට සභාවක් හැටියට හෝ කමිටුවක් හැටියට තීන්දු ගන්න කොට අපිට කැමති කැමති දේවල් කරන්න බැහැ. ඒකට අනන්‍ය වෙච්ච නීත්‍යානුකූල තත්ත්වයන් අපි සැලකිල්ලට ලක් කරන්න ඕන. අපිට ඒකට තර්කයක් තියෙන්නත් ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තටම මම මේක වැරදියි කියන එකට මම කණගාටු වෙනවා. තාක්ෂණ ඇගයීම් කමිටුව අඩුම තරමේ කරපු ඒවා නිරීක්ෂණය කරන්න ඕන. තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් කරන්න ඕන ඒවා මේ. එක තැනක ඉඳන් හදලා කට්ටියගේ අත්සන් අරගෙන දෙන එක නෙමෙයි කරන්න ඕන. හරි නම් ඔය දෙගොල්ලොම ඒක කරන්න ඕන. දැන් මේ නිසා අපිටමයි මේක කරන්න වෙලා තියෙන්නේ. ඒ දෙගොල්ලෝ, තුන් ගොල්ලෝ කරපු ඒවා ගිහින් බලලා ඒ තැන් වලින් අදාළ වාර්තා අරගෙන ප්‍රායෝගිකව ඒක කරන්න ඕන. ඒවා බලලා තමයි තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් මේක තීරණය කරන්න ඕන. නමුත් ඒක වුණේ නැහැ ඇත්ත කතාව. අපි සති දෙකක කාලයක් ලබා දුන්නේ ඒකට.

එහෙමනම් අපිටත් තිබුණා අඩුම එක කියලා කමිටුවෙන් තීරණය කරන්න. අඩුම එක මොකක්ද කියලා මම දන්නේ නැහැ. එතකොට තාක්ෂණ ඇගයීම් කමිටුවක් ඕන නැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තාක්ෂණ ඇගයීම් කමිටුවක් ඕන නැහැ අඩුම මිලට දෙනවා නම් හරිනේ. තාක්ෂණය සම්බන්ධව අපිට අවබෝධයක් ගන්න ඕනනේ. මේක සම්බන්ධව තවදුරටත් විමර්ශනය කරලා මේ තීරණය ගන්න ඕන කියන එකයි මගේ තීරණය ගරු සභාපතිතුමනි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එකම දෙයයි දැන් අපිට කරන්න ඉතුරු වෙලා තියෙන්නේ. මේ කරපුවා පිළිබඳව, මේ දෙගොල්ලෝ, තුන්ගොල්ලෝ කරපුවා පිළිබඳව අපි ගිහිල්ලා අධීක්ෂණය කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඉන්දික මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මම ස්ථිර කරනවා. ඒවගේම සඳහන් කරන්න ඕන මේක මගේ කොට්ඨාශයේ කරන්න ඉන්න කාර්යයක්. ප්‍රාදේශීය සභාවකට එක් අවස්ථාවක් තමයි මේ කාර්යය කරන්න සිද්ධ වෙන්නේ. පාරවල් හදනවා වගේ නිතර නිතර ඒක කරන්නේ නැහැ. ඉතිං ඒ වගේම ද්විත්ව කුටීර ආදාහනාගාරයක් තමයි මේ හදන්නේ. ඒක නිසා මේක නිවැරදිව හදා ගන්න ඕන. මොකද, වලවත්ත ප්‍රදේශයේ සහ නරාවල ප්‍රදේශයේ මුලදී ප්‍රශ්න මතු වුණා මේ අදාහනාගාරය ඉදිකරනවා කිව්වම. ඉතිං ඒ ප්‍රශ්නය අපි මැදිහත් වෙලා, නිරාකරණය කරගෙන, යටපත් කර ගෙන ඉන්නේ. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට ආදාහනාගාරයක අවශ්‍යතාවය තියෙනවා. මොකද අපිට විතරයි අදාහනාගාරයක් නැත්තේ. ඒක නිසා තමයි අපේ රමේෂ් පතිරණ ඇමතිතුමා මැදිහත්වෙලා මේක හදන්න ඉඩම නිරවුල් කරලා දුන්නේ. දැන් අපි ඒකෙ ආදාහනාගාරයක් හදන්න ගිහිල්ලා ටෙන්ඩර් කැඳවලා තියෙනවා. හැබැයි මේකෙ මුලදීම මට පෞද්ගලිකව පෙනුන විදිය තමයි යම් කිසි කොටසකට මේක දෙන්න කටයුතු කරා කියන කාරණාව. ඒ නිසා තමයි අපි අප්ග්‍රාෆ්ට් ක්‍රමය කියන කාරණාව ගෙනාවෙත්. එහෙම කරේ අර ක්‍රමය වළක්වා ගන්න. ඒ වගේම තමයි ඉන්දික මන්ත්‍රීතුමා මතුකරපු C5 කතන්දරය. ඒකෙදි සභාපතිතුමනි, යාන්ත්‍රික කොටස නර්ඩ් ආයතනය හරහා කරනවා නම් මේ ගොඩනැගිල්ල ඉදිකරන එක C7 න් කරන්න පුලුවන්. යාන්ත්‍රික කොටස වෙනයි, ගොඩනැගිල්ලේ කොටස වෙනයි. ඉතිං මේකෙ තරඟකාරීත්වය අඩු කරලා අර කොටසටම දෙන්න ඕන නිසා තමයි මේ C5 කියන කතාව ඇදලා ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නර්ඩ් එකෙන් කොටසක් ඉදිකරන්නේ නැහැ. මේක එක කර්මාන්තයක් විදියට කරන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ වුණාට යාන්ත්‍රික කොටසට නර්ඩ් ආයතනය මැදිහත් වෙනවා. යාන්ත්‍රික කොටස ඉදිකරන්නේ නර්ඩ් ආයතනය හරහා. ඒ මැෂින් එක හයි කරන්නේ නර්ඩ් ආයතනය හරහා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. ඒකත් මේ අය කරන්න ඕන. අධීක්ෂණය විතරයි නර්ඩ් ආයතනයෙන් කරන්නේ. ඒක වැරදි වැටහීමක්. අධීක්ෂණය කිරීම පමණයි නර්ඩ් ආයතනය කරන්නේ. වෙන කිසිම කාර්යයක් නර්ඩ් ආයතනයෙන් කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එහෙමනම් ඉතිං අපිට වගකීමක් ගන්නම බැහැ ඔය කියන විදියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතන ගැටළුව වෙලා තියෙන්නේ මන්ත්‍රීතුමා මෙච්චරයි. නර්ඩ් ආයතනයේ ලියාපදිංචි ආයතන නමයක් තියෙනවා. ඒ ටෙන්ඩර්කරුවන්ගේ සමාගම් නමයෙන් කොටසක් සම්පූර්ණයෙන්ම ඩවුන්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ කරන්නේ. තවත් කොටසක් අප්ග්‍රාෆ්ට් ක්‍රමය යටතේ කරන්නේ. මෙතන වැරදිච්ච තැන ඒකයි. දැන් අපේ ටෙන්ඩරයට ඉදිරිපත් වුණේ තුන් දෙනයි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒක ගියේ කාටද කියලා දැන ගන්න බැරිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තාම අපිට කියන්න බැහැ. මම බැලුවෙත් නැහැ ඒක තවම. කියන විදියටනම් අඩුම මිල ගණන් තියෙන ආයතනයට ගියා කියන එක තමයි ආරංචිය තියෙන්නේ. ලබන බදාදා ටෙන්ඩර් කමිටුවක් දැම්මා. ඊට කලින් පුලුවන්නම් මේකටම තව එකක් කැඳවන්නම්.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. තාක්ෂණ ඇගයීම් කමිටුව දැන් නිර්දේශයන් ඉදිරිපත් කරලා ඇතිනේ. ඒ නිර්දේශයන් අනුව තෝරාගනිපු ආයතනය කරපු ටික අපිට වාර්තාවක් විදියට සභාවට දෙන්න. මෙන්න මේ ටික මේ මේ ප්‍රදේශවල කරලා

තියෙනවා කියලා දෙන්න. ඒ විතරක් නෙමෙයි ඉතාමත් ඉක්මනින්ම අපි මේ මන්ත්‍රීවරු ඔක්කොම හරි, කීපදෙනෙක් හරි ගිහිල්ලා ඒවා බලමු. ඒවා බලලා තීරණයක් ගමු කියලා මම ඉල්ලීමක් කරනවා. මොකද මේක මගේ කොට්ඨාශයේ හැදෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ස්ථාවරයේ බොහොම තදින් මමත් ඉන්නවා. මේ කරපු ඒවා බලලා තොරතුරු අරගෙන ඒ නිර්දේශ මත තමයි මේක කරන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මුදල් කමිටුවේ ඉන්න මන්ත්‍රීවරු එක්ක අපි ගිහින් මේක අධීක්ෂණය කරමු. මුදල් කමිටුවෙන් තමයි මේකට අන්තිම වාර්තාව ලබා දෙන්නේ. මන්ත්‍රීවරු ගිහින් කතා කරලා මේකට තීරණයක් ගමු. අපේ ඉන්දික මන්ත්‍රීතුමාගේ යෝජනාව මේකට එකතු කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට මෙහෙම කරන්න බැරිද, මුදල් කමිටුව විදියට අදම අපි නිර්දේශ අරගෙන බලමු. අද බැරිනම් හෙට හරි අරගෙන අපි යමු. ඊළඟ මුදල් කමිටුව බදාදා කැඳවලා තියෙන්නේ. ඒ වෙන කොට අපිට බැරිද, තීරණයක් ගන්න තැනට එන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මමත් ඒක තමයි කිවුවේ. ඒක බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම කරමු. හෙට ටෙන්ඩර් කමිටුව රැස්වෙමු. අපි එවෙලේම තීන්දුවක් ගමු.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** සභාපතිතුමා, එහෙම බලන්න යනවා නම් කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට මටත් යන්න අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බලන්න යන එකට එක්කගෙන යන්නම්. ගෙවන්න ඕන හැබැයි. අතින් ගෙවලා යන්න ඕන.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** හරි. ඒකට කමක් නැහැ. අතින් ගෙවලා යන්නම්. අපි කොහොමත් අතින් ගෙවලා හරක් බලන වැඩනේ කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුදල් කමිටුවේ ඉන්නේ කවුද, සභාව ඉවර වෙලා අපි මුදල් කමිටුව තියමු. ටෙන්ඩර් කමිටුව විදියට ඒක අපි රැස්වෙමු ආදාහනාගාරය ඉදිකිරීම ගැන කතා කරන්න විතරක්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 57.** ගාලු දිස්ත්‍රික්කයේ ජනතාවට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි පියදිගම සුභද්‍රාරාම විහාරස්ථානයට අයිතිය ඇති ගිනිකරුන්ද කන්ද, කුරක්කන් හේන, පන්සල්වත්ත ඉඩමේ ඔසුපැළ සිටුවීමේ ආදර්ශ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ ඉඩම ලබා දෙන්නේ තුන්මහල් විහාර පන්සලේ හාමුදුරුවෝ. දැන් මේ වෙන කොට ඒකට වැඩකටයුතු සිද්ධවේගෙන යනවා. 19 වෙනිදා හවස 05.30 ට ගරු ඇමතිතුමන්ලා දෙපලත්, ගරු නගරාධිපතිතුමත්, අපේ ගරු සභාපතිතුමත් ඇතුළු සියළු දෙනාම එකතු වෙලා මේකෙ වැඩ ආරම්භ කරනවා. ඒකට සහභාගි වෙන්න කියලා සියලු දෙනාටම මම ආරාධනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකෙදී පොඩි කාරණයක් කියන්න ඕන. මේකට අපේ සේවකයන් යොදවන්න පුලුවන්. ඒ ඇරුණම අපිට මුදල් යොදවන්න නම් බැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙම අවශ්‍යතාවයක් නැහැ තවම. දැක්කානේ බල්ලාට ඉස්සෙල්ලා කොටියා පනිනවානේ. අපි ඉල්ලුවෙවත් නැහැනේ. සාධාරණය මේ කතා කරන්නේ. එහෙම ඉල්ලන්නේ නැහැ අපි. ගොන් පාට් දාන්නේ නැහැ සභාවේ. ඉල්ලුවේ නැහැනේ. ඉඟියක්වත් කරාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකෙ ඉතිං යෝජනා වෙන්නේ ඒකටනේ. ඒක ඊළඟට ආවොත් කියනවානේ අපි සභා යෝජනාව සම්මත කරා කියලා. එහෙමනම් මේකෙ යෝජනාව දාන්න ඕනත් නැහැනේ. ඕකෙ දෙපැත්තක් තියෙනවා. මේකෙ යෝජනාව දාන්න ඕන නැහැනේ. යෝජනාවට අපි දෙන්න පුළුවන් සහයෝගය දෙන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි ව්‍යාපෘතියක් මොකක් හරි ක්‍රමයකින් කරන්න හදනකොටම මොකක් හරි බකල් එකක් දාන්නනේ හදන්නේ ඇත්තටම. දැන් මට ඒක කියන්න සිද්ධ වෙනවා. මේක ඇත්තටම හොඳ වැඩක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි ඉතිං ඔබතුමාට දැනටමත් සේවකයෝ දුන්නා. ඒ ඉල්ලපු දේවල් කරානේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක තමයි ඉතිං මේ කියන්නේ. මේක අඩාල කරන්න එපා ඉතිං. සල්ලි ඉල්ලුවේ නැහැනේ ඇත්තටම. එහෙම දෙන්නෙත් නැහැ. එහෙම ඉල්ලන්නත් බැහැ. අපි එහෙම ඉල්ලන්නෙත් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 58.** ගිංතොට, වාලුකාරාම පන්සල අසළ ඇති ඉඩමේ වොලිබෝල් ක්‍රීඩා පිටියක් සකස්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉඩම කාටද අයිතිය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පන්සලට අයිති ඉඩම මේ. අයිතිය, ඒ ඔක්කොම ඒ අය දෙනවා. මේකෙදි මම හිතන්නේ මගේ කොට්ඨාශයේ ක්‍රීඩාව සම්බන්ධව මුකුත් සංවර්ධන කටයුතු සිද්ධ වුනේ නැහැ. නමුත්, ක්‍රීඩා ඇමති නාමල් රාජපක්ෂ මැතිතුමා විසින් සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයකටම ඒ අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කරනවා. නමුත් මම ඉන්න කොට්ඨාශයේ ඉඩමට පස් ටිකක් දාන්න කිවුවා. ඒ පස් ටිකවත් දාන්නේ නැහැ. සභාවේ තියෙන පස් ටිකත් තමන්ගේ ගෙවල් වලට බාගන්න තත්ත්වයට තමයි පත් වුණේ. ඒ වගේ තත්ත්වයක් මේකෙ ඇති වෙන්නේ. ඒවා නොකියා හිටියොත් හැමදාම මේවා කර කර ඉඳීවි. ඒක හින්දා මම ඒකත් සඳහන් කරනවා. මේක නාමල් රාජපක්ෂ ගරු ක්‍රීඩා ඇමතිතුමාට දන්වා යවන්න. මේ වොලිබෝල් ක්‍රීඩා පිටිය සකස් කරලා දෙන්න කටයුතු කරන්න කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමනි, ප්‍රදේශයේ මන්ත්‍රීවරයා විදියට මගෙන් ඉල්ලීමක් කරලා තියෙනවා. මගෙන් ඉල්ලීම කරන්න ඉස්සෙල්ලා මේ සෝමපාල ඩයස් ගල්ගොඩැල්ල කියන තැනැත්තා මේක ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලලා තියෙනවා. එයාට තාප්පය බඳින්න සැලසුම අනුමත කරලා ඉල්ලුවට ඒක නතර වෙලා තියෙනවා.

අයදුම්පත්‍ර අංක BA/311/10/2021 අනුමැතිය ලබා නොදීම සම්බන්ධව. (සෝමපාල ඩයස් ගල්ගොඩැල්ල) ලිපිය සභා ගත කරන ලදී.

මෙතනදී වෙලා තියෙන්නේ ගරු සභාපතිතුමනි, දැන් මෙයාට අඩි 12 ක පාරක් තියෙනවා. පාර නම් කරලා ජයසුන්දර මිනින්දෝරු මහතා විසින් ප්ලෑන් එක ඇඳලා දීලා තියෙනවා. ඒ අනුව තමයි මෙයා මේ ඉල්ලීම කරන්නේ, මේකට අනුමැතිය ඉල්ලන්නේ. අපි අර කාගේහරි ඕනකමකට මේක කරනවද කියලා තමයි මේකෙන් අහන්නේ. මෙතන පවුල් දෙක තුනක අරගලයක් තියෙන්නේ. ඒ අරගලය තුල අපි සභාව විදියට පටලැවිලා තියෙනවා. නමුත්, අඩි 10 ක් පාර තිබියදි තවත් අඟල් 6 ක් හෝ අඟල් 4 ක් මම හිතන්නේ වැරැද්දක් තියෙනවා. ඒක හින්දා මේක නිවැරදි කරන්න. දැන් මෙතන ගැටුමකටත් ගිහිල්ලා තියෙන්නේ. ඉදිරිපත් කරපු ලියුම බැලුවම සභාවටත් චෝදනාවල් එනවා. නිලධාරීන්ටත් චෝදනාවල් එනවා. ඊට අමතරව තමයි මට ඒ අය මේක ගැන ඇවිත් කිවුවම මම ඒක ගැන අවබෝධ කර ගෙන මේ කතා කරන්නේ. එම නිසා ගරු සභාපතිතුමනි, පුලුවන් තරම් අපි මේකට ආරවුලකට නොගිහින් යම් කිසි සමාදානයක් කරලා සමථයකට පත් කරන්න කියලා ඉල්ලීම කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ කාරණය සම්බන්ධව මටත් වචනයක් කියන්න තියෙනවා. මෙතුමා ලියකියවිලි ගණනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. කාරණය තියෙන්නේ සභාවට මෙතුමා මුලින්ම ඉදිරිපත් කරලා තියෙන්නේ වැට මායිම සම්බන්ධව. වැට මායිමේ බැම්මක් ඉදිකිරීම සම්බන්ධව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා කොච්චර කතා කලත්, එකම කාරණාවයි තියෙන්නේ. ඕක ඔතන සඳහන් කරලා නැහැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉන්න මම කියන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** වුට්ටක් ඉන්න කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ඔබතුමා මම කරුණු ඉදිරිපත් කරාට පස්සේ කියන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එයා අනවසර ඉදිකිරීමක් කරා කියලා ඔතන ලකුණු කරලා තියෙනවාද, එයා ඒක ඉදිරිපත් කරලා තියෙනවාද, එයා අපිට බැම්මේ සැලැස්ම ඉදිරිපත් කළේ අපි ඒක නැවැත්තුවට පස්සේ. එයා රජයේ සේවකයෙක්. එයා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩ කරන තාක්ෂණ නිලධාරි කෙනෙක්. එයා අනවසර ඉදිකිරීමක් කරා. ඔයගොල්ලෝ ඒක අනුමත කරනවාද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** සෝමපාල ගල්ගොඩැල්ල මහතා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකද වැඩ කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එයාගේ පුතා, ප්‍රියන්ත ගල්ගොඩැල්ල තමයි එන්නේ ඕකට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ඉඩම එයාගෙද, සෝමපාල මහතාගෙද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** දැන් එතකොට මේ කතා කරන්නේ කවුරු වෙනුවෙන්ද, සෝමපාල මහතාට එන්න කියන්න එහෙමනම්. අයදුම්පත්‍ර දාපු කෙනා එන්නේ. ඔබතුමන්ලාට කතා කරේ සෝමපාල මහතාද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** සෝමපාල මහතා නමින් ලියුම ඉදිරිපත් කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** සුගත් මන්ත්‍රීතුමා හමුවන්න ආවේ සෝමපාල මහතාද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ៖-** ලියුමේ සඳහන් වන්නේ මේ මහතාගේ නම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඉඩම තියෙන්නේ පුතාට. ඇයි තාත්තාගේ නමින් ලියුම් ඉදිරිපත් කරන්නේ. අයදුම්පත්‍රය ඇවිල්ලා තියෙන්නේ එහෙම. මේ හැංගි හෝරා යන වැඩක්. අපිට අයදුම්පත්‍රය ඉදිරිපත් කරලා තියෙන්නේ ප්‍රියන්ත ගල්ගොඩැල්ල.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ආරක්ෂිත වැටක් ඉදිකිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා, එතුමා අයදුම්පත්‍රය ඉදිරිපත් කලාට, එතුමාට කිවුවලු මේකෙ මායිම් වැරදියි ඒ නිසා මේකට ප්ලෑන් එකක් ඇඳලා ගෙනත් දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මන්ත්‍රීතුමා මේක අහන්නකෝ. අපිත් එක්ක මේ සම්බන්ධව කිසිම සාකච්ඡාවකට සෝමපාල ගල්ගොඩැල්ල මහතා නෙමෙයි ආවේ. ආවේ ප්‍රියන්ත ගල්ගොඩැල්ල මහතා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** හරි. අයිතිය තියෙන්නේ පුතාට වෙන්න ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** පොඩ්ඩක් ඉන්න. එතකොට එයා අනවසර ඉදිකිරීම් කරන කොට පුතා දන්නේ නැහැ. අයදුම්පත්‍රය දාන කොට පුතා දන්නවා. ඔබතුමන්ලා කියන්න මේකෙ අනවසර ඉදිකිරීම් කරන්න දෙන්නේ නැහැ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** අනවසර ඉදිකිරීම් කරන්න දෙන්න එපා. අනවසර ඉදිකිරීම් කරන්න නෙමෙයි මේ කියන්නේ. මේකෙ පාරේ සීමාවක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මම කියන්නම් සිද්ධිය. මෙයා අනවසර තාප්පයක් ඉදිකරගෙන යනවා. දැන් තාප්පයේ වැඩ තුනෙන් දෙකක් ඉවරයි. ඔබතුමන්ලා ඒවා අනුමත කරනවාද, ඒ පාර මුළු ගමම එකතු කරලා පෙත්සම් ගැහුවට පස්සේ තමයි අපි ගිහින් ඒක නැවැත්තුවේ. ඇත්ත කතාව ඒක. මේක නැවැත්තුවට පස්සේ තමයි අයදුම්පත්‍රය දම්මේ අනුමත කර ගන්න. අපිට තිබුණේ එයාගේ අනවසර ඉදිකිරීමට එරෙහිව නඩු දාන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ඔබතුමා කලබල වෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඔබතුමන්ලා එක ප්‍රශ්නයකදී එකක් කතා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ආවේගයෙන් කතා කරලා වැඩක් නැහැ සභාපතිතුමා. මේක තේරුම් ගන්නකෝ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අපේ තාක්ෂණ නිලධාරීන්ට කතා කරපු විදිය බලන්න එයා නිලධාරියෙක් විදියට. මට කතා කරපු විදිය බලන්න එයා නිලධාරියෙක් විදියට. සතෙක් වගේ

හැසිරුනේ. මන්ත්‍රීතුමා එක තැනකින් අඟල් හයයි ආපස්සට ගන්න ඕන. මුළු ඉඩමෙන්ම යන්නේ වර්ග අඩි බාගයයි. පැරණි වැට මායිම බොහොම පැහැදිළිව තියෙනවා. අපි නිරීක්ෂණ දුන්නේ පැරණි වැටට තාප්පය හදන්න කියලා. එච්චරයි. අපි එයාට ඒක ගැන දැනුම් දීලා තියෙන්නේ. තව කතා කරන්න දෙයක් නැහැ. අපි එයාට නඩු දානවා. අපි එයාගේ අනවසර ඉදිකිරීම් වලට නඩු දානවා. එයාට පුලුවන් අපේ සැලසුම් කමිටුවට නඩු දාන්න. එච්චරයි කරන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා පරස්පර දෙයක් තියෙනවා මෙතන. ඔබතුමා අහන්නේ නැහැනේ. අපි කියලා තියෙනවා මේ තිබුණ මායිම වැරදියි ඒ නිසා මිනින්දෝරු මහතෙකු ලවා ප්ලෑන් එක ඇඳලා ඒක ඉදිරිපත් කරන්න කියලා. ඉතිං එතුමා ප්ලෑන් එක ඉදිරිපත් කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ඉඩම, තාප්පය නෙමෙයි. ඒ ඉඩම ගැන ඔබතුමා කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ඉඩමේ මායිමටනේ තාප්පය ඉදිකරන්නේ. නැතුව වෙන කොහේවත් නෙමෙයි. ඒකයි මම මේ කියන්නේ. එයා අනුමත කරන්න දාපු ප්ලෑන් එක අනුව තමයි තාප්පය ඉදිකරන්නේ. දැන් කියනවා ඒකට කරන්න එපා පරණ එකට කරන්න කියලා. ඉතිං ඇයි ඒ පරස්පරතාවයක්. මුලින්ම එතුමා තිබුණ ප්ලෑන් එකට තාප්පය හදනකොට විරුද්ධ වුණා. අපේ සභාවෙන් ගිහිල්ලා එතුමාට කිවුවා මේ මායිම පිළිගන්න බැහැ, නැවත ප්ලෑන් එකක් ඇඳලා ඉදිරිපත් කරන්න කියලා තියෙනවා. එතුමා නැවත ප්ලෑන් එකක් ඇඳලා ඉදිරිපත් කරා. දැන් ඒ අනුමත වෙච්ච ඉඩමේ ප්ලෑන් එක. දැන් අපි කියනවා ඒ ප්ලෑන් එක අනුව ඉදිකිරීම කරන්න ගියාම ඒකට ඉදිකිරීම කරන්න බැහැ පරණ එකට ඉදිකරන්න කියලා ආපහු. ඇයි දැන් කලින් එකට යන්න කියන්නේ. මෙහෙන්ම කියලා තිබුණේ අළුත් එකක් අඳින්න කියලා. ඒක නීත්‍යානුකූලව කරාට පස්සේ කියනවා දැන් ආයෙම පරණ එකට කරන්න කියලා. එතකොට මෙතන පරස්පරතාවයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පරණ ප්ලෑන් වලට මායිම් තාප්ප අනුමත කරන්නේ නැහැ. අවුරුදු දහයකට මෙහා පැත්තේ ප්ලෑන් එකක් වෙන්න ඕන අනුමත කරන්න නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම තමයි ඒ අය කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවුරුදු දහයකට මෙහා පැත්තේ ප්ලෑන් එකක් දාලා නැහැ එයා තාප්පය අනුමත කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ තියෙන්නේ ඒ ප්ලෑන් එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අපි දැනුම් දුන්නට පස්සේ දැම්මේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හරි ඔබතුමන්ලා කිවුවට පස්සේ තමයි දීලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් මන්ත්‍රීතුමා මෙහෙමයි. එයා තව නිලධාරියෙක් විදියට අපි පරීක්ෂණයකට යනකොට හැසිරුන විදිය වැරදියි. මම විතරක් නෙමෙයි, ලේකම්, තාක්ෂණ නිලධාරි සහ නාගරික සංවර්ධන අධිකාරියේ ශිරෝමි මිස් පරීක්ෂණයට ගියේ. එච්.කිවු.අයි. කපිල සේනාධිපති මහතාත් එතනට ඇවිල්ලා හිටියා. එවෙලෙත් මේ ගෙදර අනවසරයෙන් ඉදිකිරීම් කරනවා. මේ වගේ බලහත්කාරයෙන් කරන මිනිහෙක් මේ. මේක ඔබතුමන්ලා ගිහිල්ලා බලන්න. එක සත පහක අනුමැතියක් අරගෙන නැහැ. එතකොට ඒ ඉදිකරපු ගොඩනැගිලි වලට අනුමැතිය අරන්ද, ඔබතුමන්ලා එක පැත්තකින් කතා කරනවා මේකෙ අනවසර ඉදිකිරීම් කරන්න දෙන්න එපා කියලා. අපි ඒවා නවත්වනකොට ඔබතුමන්ලා ඒකට පක්ෂව කතා කරනවා. ඔබතුමන්ලා ඩබල් ගේම් ගහන්න එපා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා වැරදි ස්ථාවරයක ඉඳගෙන ඔය කතා කරන්නේ. ඒක තේරෙන්නේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම එක අනවසර ඉදිකිරීමක්වත් මේකෙ නතර කරන්නේ නැහැ. ඔබතුමන්ලා එක පැත්තකින් අනවසර ඉදිකිරීම් නවත්වන්න හදනවා. අනෙක් පැත්තෙන් ඒවාට කතා කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ආවේගශීලීව කතා කරාට වැඩක් නැහැ. ඔහොම නෙමෙයි කතා කරන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් මේකට නඩු දානවා නම් ඔක්කොටම නඩු දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අන්න පැන්නා. හරි. එකකටවත් නඩු දාන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දාන්න කියලා කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔක්කොටම දාන්න කියලා කියන්නේ. කොහොමද ඔක්කොටම දාන්නේ. මට හොයා ගන්න විදිය කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකෙදී මේ පාර අල්ලා ගෙන තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අසාධාරණයක් වෙන කොට කොහෙන් හරි සාධාරණයක් කර ගන්න බලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා නිකම්ම නිකං නොදන්න මිනිහෙක් නෙමෙයි. මේකෙ නොදන්න මිනිස්සු කරා නම් තව කමක් නැහැ. මේ හොඳටම දන්න ප්ලෑන් පවා අඳින තාක්ෂණ නිලධාරියෙක් අනවසර ඉදිකිරීමක් කරා කියන එක පිළිගන්නේ නැත්තේ ඇයි ඔයගොල්ලෝ. එතකොට ඒවා කතා කරන්නේ නැද්ද, මොකක්ද මේ වැඩේ. ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අනවසර ඉදිකිරීම් ඉවත් කරන එක වෙනම කරන්න. ඒක නෙමෙයි මේ වැඩේ. එතුමාගේ ආරක්ෂාවට මායිම් තාප්පය ඉදිකරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මම අහන්නේ එතුමා අනවසර ඉදිකිරීමක් කරලා නැද්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තාප්පයද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාප්පයයි, ගෙදර කොටසකුයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගෙවල් ඕන තරම් තියෙනවානේ සභාපතිතුමා අනුමත නැතුව. ඒවා කොච්චර තියෙනවාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක දැන් බලන්න යමුද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හරි යමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ඉවර වෙච්ච ගමන් යමු. එයා එතකොට මේ ඉදිකරලා තියෙන ටික නීත්‍යානුකූලව කරලා තියෙනවද කියලා බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැහැ. නීත්‍යානුකූලව කරලා නැත්නම් නඩු දාන්න. එතුමා මේක දිගින් දිගටම නීත්‍යානුකූල කර ගන්න ආවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ පෞද්ගලික ප්‍රශ්නයක්නේ. ඒ මනුස්සයා තමන්ගේ ආරක්ෂාවට තාප්පය බැන්දේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අපිට පාරේ පළල කියන්න බැහැ. මේ පැත්තෙන්ද, ඒ පැත්තෙන්ද කියලා. අපි කමිටුව විදියට ඒක නිර්දේශ කරේ. අපි තනියම නෙමෙයි ඒක නිර්දේශ කරේ කමිටුව විදියට. ඇස් මායිමට පේන්න තියෙනවා පරණ වැට මායිම එයා කම්බි ගහලා තිබුණ නිසා. නිකං නෙමෙයි අපි මේ සටන් කරන්නේ පාරට තව අගල් හයක් ගන්න. ඔබතුමන්ලා කරන්නේ ඒ අඟල් හය ගන්න එක අහුරන්න. මේක මාර තර්කයක්නේ. සභාව විදියට ඔය ගොල්ලෝ හැසිරෙන්නේ මම හැසිරෙන්න ඕන තැනනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ හැමතැනම තාප්ප හදලා තියෙන්නේ අනුමත කරලද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ කියන එක තේරුම් ගන්න. ප්ලෑන් එක ඇන්දම තියෙන විදියට වැඩේ කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා කොහොම වුණත් මම ඉන්න මතය මෙච්චරයි. මම සභාපතිවරයා විදියට එක තැනක කණුවක් විතරයි අයින් කරන්න කිවුවේ. අපි දිගටම අයින් කරන්න කිවුවේ නැහැ. එක කණුවක අඩුපාඩුවක් අපි දැක්කා. ශිරෝමි මිස් ගියපු ගමන් කිවුවා සභාපතිතුමා මේක නම් අනුමත කරන්න දෙන්න බැහැ කියලා. බොහොම පැහැදිළිව පේනවා කිවුවා ඉස්සරහට ඇවිල්ලා කියලා. ඒක ඇවිල්ලා තියෙනවා මෙහාට. එවෙලේ එතන එහා පැත්තේ හිටියා පොලීසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක කෙනෙක් රාජපක්ෂ කියලා. එයා සීනියර් ඩී.අයි.ජී. ගේ පී.ඒ., අපි මේක බලන්න ඕන. පොලිසියේ ප්‍රශ්නයත් අපි විසඳගෙන යන්න ඕන. එයත් දිගින් දිගටම අපිට අභියෝග කරනවා. එවෙලේ එච්.කිවු.අයි. පවා ඇවිල්ලා හිටියා අපි එතනට යනකොට. ඒ ගියාම ඔයගොල්ලෝ බලන්න මම පත්වෙච්ච තත්ත්වය. මම එතන පරීක්ෂණය කරනවා. මේ මිනිස්සු කරන වැඩේ ඇතුලේ පෙනි පෙනී

ගෝලයෝ දාලා ඉවර වෙලා අනවසර ඉදිකිරීමක් කරනවා. එච්.කිවු.අයි. මහත්තයා මගෙන් අහනවා සභාපතිතුමා අර කරන වැඩේ හරිද කියලා. එතකොට ඒක නීතියට අනුකූලද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අනවසර ඉදිකිරීමක් කරනවා නම් ඒකට ඕන ක්‍රියාමාර්ගයක් ගන්න. මිනින්දෝරුවා පැහැදිලිව මැනුම කරලා තියෙනවා. මිනින්දෝරු ප්ලෑන් එක අනුමත කරන්න කියලා සල්ලි ගෙවලා තියෙනවා රුපියල් පන්සීය ගාණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම සියළු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා මේක ගිහින් බලන්න කියලා. ඒක බැලුවම තේරේවි. පාරේ අඩි 12 තියෙන්න පුලුවන් මේ පැත්තේ මිනිස්සුන්ගෙන් වුණත්. අපිට පාරේ තියෙන භෞතික ප්‍රමාණය බලලා කියන්න බැහැ මෙතන අඩි 12 යි කියලා. එහෙම නම් මුළු ඉඩම් ටිකම මනින්න ඕන. එහෙම නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පාරෙන් එහා පැත්තේ තියෙන්නේ එයාගේ ඉඩම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ අබේසේකර මන්ත්‍රීතුමා. ඔතන තියෙන ප්‍රශ්නය තේරුම් ගන්න. ඔය දෙගොල්ලෝ අතර, සට්ටනයක් තියෙන්නේ. ප්‍රධාන වැරදිකරු තමයි අනවසර ඉදිකිරීම කරපු කෙනා. මුලින් වැරැද්ද කරේ එයා. එක්කෝ එයා ඒක කරන්න කලින් සභාවෙන් අවසර අරගෙන කරන්න ඕන. එයා තාක්ෂණ නිලධාරියෙක්නේ. එයා දන්නේ නැහැ කියලා කියන්න බැහැ. එයාට තිබුණා තාප්පය ඉදිකරන්න කලින් සභාවෙන් අනුමත කර ගන්න. ඒක කරලා කරා නම් තව මේවා එකක් තියෙනවා. නමුත් දැන් මෙයා වැරදි වැඩක් කරපු නිසා ගමේ මිනිස්සු අපිට අභියෝග කරනවා. ඒ අය එහෙම කරන කොට මේ අයත් අපිට අභියෝග කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක කරාට පස්සේ හරි එයාලා අනුමැතියට දාලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැම්මා. එතකොට මම ගමේ අයත් එක්ක එකතු වෙලා, ගමේ අයවත් එතනට එක්ක ගෙන ගිහිල්ලා බැලුවා. එක තැනක් අපිට නිරීක්ෂණය වුණා. අපිටත් දැක්කම යම් යම් දේවල් පේනවා නේ. මම විතරක් නෙමෙයි කමිටුව විදියටත් අපි කිවුවා ඒ පෙනුන තැන තිබුණ කණුව විතරක් වෙනස් කරන්න කියලා. අනිත් කණු මුකුත් කරන්න එපා මෙතන විතරක් වෙනස් කරන්න කිවුවා. ඒ කණුවත් එතනින් අඟල් 04 ක් හරි, අඟල් 06 ක් හරි මෙහාට අරගෙන පරණ මායිමට ගන්න කියලා කිවුවේ. එකම එක කණුවයි. ඒකෙන් ඉඩමේ පොඩ්ඩක්වත් යන්නේ නැහැ. ඒ යන අඟල් 04 විතරයි යන්නේ. එයාගේ තාත්තත් එකඟයි. ඔය සෝමපාල ගල්ගොඩැල්ල කියන මනුස්සයත් එකඟයි. එවෙලේ බිරිඳත් එකඟයි. නමුත් අර තාක්ෂණ නිලධාරියා එකඟ නැහැ. ඉතිං එතනට ගියාම මගේ මතය හෝ කමිටුවේ මතය එයාට පිළිගන්න බැරිනම් අපිට එතනින් එහාට කරන්න දෙයක් නැහැ. කමිටු තීරණය අපි ඒ විදියට යවලා තියෙන්නේ. එයාට කමිටු තීරණය දැනුම් දීලා තියෙන්නේ. අපිට නඩු දාන්න කියන්නකෝ එයාට. ඒක අපිට ප්‍රශ්නයක් නැහැ. අපිට නඩු දාන්න කියන්න. අපිත් එයාට නඩු දානවා. අපි එයාගේ අනවසර ඉදිකිරීමට විරුද්ධව නඩු දානවා. ඔබතුමන්ලා අනවසර ඉදිකිරීම් වලට එක පැත්තකින් විරුද්ධ වෙනවා. අපි මේවා නවත්වලා දාන කොට අනිත් පැත්තෙන් ඒ විදියට කතා කරනවා.

(ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතුමාගේ මායිම තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කෙසේ වෙතත් මන්ත්‍රීතුමා මම සභාපතිකමේ ඉන්නකම් අපේ නිලධාරියෙකුට හෝ මන්ත්‍රීවරයෙකුට හෝ මට හෝ චෝදනා කරන්න දෙන්නේ නැහැ. ඒ ලියුමේ තියෙනවානේ අධිකරණ ක්‍රියාමාර්ග ගන්නවා කියලා. ඒ අයට අධිකරණ ක්‍රියාමාර්ග ගන්න කියන්න. ඇයි මෙහෙට එවන්නේ ඕක. අපිට මොකටද, ලිඛිතව ඔහොම එවන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කමිටුව නීති විරෝධී කියලා එයා හිතනවානේ. ඒකනේ එයා එහෙම කියන්න ඇත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මන්ත්‍රීතුමා ඕක වෙනුවෙන් ඔබතුමන්ලා කියනවා නම් අපි අධිකරණ කටයුතු නොකර ඉමු. හැබැයි මම අනවසර ඉදිකිරීම් කිසිම දේකට මෙතනින් එහාට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා වැරදි විදියට මේක තේරුම් ගන්නවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනටමත් ඔබතුමන්ලා පිළිගන්නේ නැහැනේ මෙතන අනවසර ඉදිකිරීමක් කරනවා කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉදිකිරීම අනවසර ඉදිකිරීමක් වෙලා තියෙනවා නම් ඒවාට ක්‍රියාමාර්ග ගන්න. එයා ඒ ඉල්ලීම කරලා මාස දෙකක් යනකම් ඒක මෙහේ හිරකරන් ඉන්නවානේ. අන්න

ඒක ගැන මේ කියන්නේ. එතකොට අපි මෙහෙන් දීලා තියෙනවා මේ මායිම පිළිගන්න බැහැ අයේමත් මැනලා ඉදිරිපත් කරන්න කියලා. ඒකත් ඉදිරිපත් කරලා තියෙනවා. එතුමා කියනවා ඒකත් තියෙද්දී මිනින්දෝරු ප්ලෑන් එකේ තියෙන, අදාළ ඔප්පුවෙන් වෙන් කරපු අඩි 12 ට වැඩිය පාර තියෙනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ. ඔබතුමන්ලා එක වෙලාවකට ජයසුන්දර මහතාගේ ප්ලෑන් අභියෝගයට ලක් කරනවා. මෙහේ ප්‍රශ්න තියෙන ඒවා බර ගාණක් තියෙනවා. මෙහෙමයි මන්ත්‍රීතුමා අපි කමිටුවක් විදියට තීරණය ගත්තා අපිට පෙනිච්ච පරණ මායිම තිබුණ නිසා. ඒකෙ කම්බියක් ගහලා තියෙනවා. දැන් යන්න පුලුවන් ඒක බලන්න. මෙයා කියනවා ඒ ගහ තල්ලු කරලා කියලා. අඩි තුනක් මෙහායින් ඒ ගහ තිබුණා කියලා එයා කියනවා. ඒ ගහ එයා තල්ලු කරාලු. හොඳට ගහ පොළවේ පැළ වෙලා තියෙනවා. කම්බියක් ඒකෙ තියෙනවා. ඒ ගහපු කම්බියක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා ඒ තීන්දුව නීත්‍යානුකූලව ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ මන්ත්‍රීවරු ගිහිල්ලා මේක බලන්න. බලලා කියන්නකෝ මේකට මොකක්ද වෙන්න ඕන කියලා. මම නම් උත්සාහ කරන්නේ පාරට අඟල් 06 ක් හරි ගන්න. ඔබතුමා ගාවට ඇවිල්ලා කවුරුහරි මොනවා හරි දෙයක් කිවුවොත් ඔබතුමා ඒකේ හරි වැරැද්දක් බලන්නේ නැහැ. ඔබතුමා ඒ වෙනුවෙන් කොහොමත් පෙනී ඉන්නවා. ඒකෙ හරි වැරැද්දක්, කිසි එකක් නැහැ. හදිසියකින් තමයි කවුරු හරි එන්නෙත්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමානේ මේක කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඔතනට ගියාද, ඒක දැක්කද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** යන්න වුනේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා කිවුවද කොටසක් අනවසරයෙන් ඉදිකරා කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක සුගත් මන්ත්‍රීතුමාගෙනුත් අහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අහන්න නෙමෙයි ඔබතුමා ඒක දැක්කද, ඔබතුමාට කිවුවද එයා අනවසර ඉදිකිරීමක් කරලා තියෙනවා කියලා. අනවසර ඉදිකිරීමක් වුණා කියලා කිවුවද,

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතුමා ඇවිල්ලා කිවුවා මෙහෙට ඉදිරිපත් කරා, නමුත් අනුමත කරේ නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා තාප්පයෙන් තුනෙන් දෙකක් ඉදිකරා කියලා කිවුවද, ගෙදර කොටසකුත් අනවසරයෙන් ඉදිකරලා තියෙනවා කියලා කිවුවද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තාප්පය හැදුවා ඒක අනුමැතියට ඉදිරිපත් කරා කියලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට වාර්තාවක් හදලා පුලුවන් තරම් ඉක්මනට නඩුවක් දාන්න ලේස්ති කරන්න. ඒක අපි බලමුකෝ. එයාටත් කමිටුවට විරුද්ධව අධිකරණයට යන්න කියන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒකට නඩු දානවා නම් අනිත් ඒවාටත් නඩු දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය ගොල්ලෝ කියපුවට නඩු දැම්මනේ. දහනායක හාඩ්වෙයාර් එකටත් නඩු දැම්මානේ. එයාට නඩු නොදා හිටියේ නැහැනේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඉන්දික මන්ත්‍රීතුමා මෙතන ලක්ෂ්මන් කරුණාරත්න මහතාගේ ප්‍රශ්නයක් ඇදගෙන ගියා. දැන් මොකක්ද ඒකට වෙලා තියෙන්නේ.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක සභාපතිතුමා කරේ නැති නිසා අකාර්යක්ෂමතාවය කියලා ලියුම් ආවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් දන්නවද ඒකට චෝදනා තියෙනවා. දැන් එතුමා කරන වැඩෙත් දන්නවද, ඒක පෙන්වන්නම් අපි. දැන් එතුමා ඉඩමේ මේ පැත්ත ගොඩකරන්න හදනවා. එතන වතුර සාවරය තියෙන්නේ. එතනින් කාණුවක් දාන්න ඕන අර පැත්තට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතුමාගේ ගේ හදනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ඉඩමේ වතුර සාවරය සම්පූර්ණයෙන්ම තියෙනවානේ.

**(ඊ) කාරක සභාවල වාර්තා ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2021-02-18 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** II. 2021-03-01 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2021-02-18 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** II. 2021-03-01 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2020.12.31 දිනෙන් අවසන් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක සභා ගත කරනවා. අවශ්‍ය අයට ඒක බලන්න පුලුවන්.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(උෟ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ මාර්තු මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ අයවැය ලේඛනය ලස්සනට හදලා ඉදිරිපත් කරලා තියෙනවා. හැබැයි ඒකට අපේ සමූහ ඡායාරූපය දාන්න පුලුවන් නම් වටිනවා. ඒක දැම්මා නම් මේක ලස්සනට තියේවි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඇත්ත.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක පොඩ්ඩක් බලලා දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඊළඟ වර්ෂයේදීවත් දාන්නම්. ඒ යෝජනාව හොඳයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මම පාරක් නම් කිරීම සම්බන්ධව යෝජනා කරා පියදිගම ග්‍රීන් මවුන්ට් ගාර්ඩන් කියලා. ඒ පාර නම් කරන්න යෝජනා කරා. ඒකට මොකද දන්නේ නැහැ වෙලා තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ ගැන නම් කතා කරලා වැඩක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ මෙහෙම අදහසක් තියෙනවා. ඒක මම දන්නේ නැහැ කොච්චර දුරට නීතියට ගැලපෙනවද කියලා. මගේ ඒක ගැන අදහසක් තියෙනවා මෙහෙම. අපිට පාරක් නම් කරන්න යෝජනා ආපු ගමන් අපි කරන්න ඕන ඒ පාරේ දැන්වීම් අලවලා විරෝධතා කැඳවන්න. විරෝධතා ආවේ නැත්නම් අපි ඒ පාර සභාවෙන් නම් කරමු. නැත්නම් මේක හොයන්නෙත් නැහැ, බලන්නෙත් නැහැ. යෝජනාව එනවා ඒක එතනින්ම ඉවරයි. දැන්වීම් අලවනවා නම් හැබැයි ඒක හරියට දැන්වීමක් විදියට අලවන්න ඕන. පාර ඉවර වෙනකම් දිගටම දැන්වීම් 10 ක් විතර අලවන්න ඕන. අදාළ දිනයට කලින් විරෝධතා ඉදිරිපත් කරන්න කියලා කියන්න ඕන. විරෝධතා නාවොත් අපි ඊළඟ සභාවෙන් තීන්දුවක් අරගෙන අපි ඒ පාර නම් කරමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ ග්‍රීන් මවුන්ට් මාර්ගය නම් කිරීම පිළිබඳව මගෙන් අද ඇහුවා. ඒ හින්දා තමයි මම මේ අහන්නේ. ඒ මිනිස්සු මේක බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මෙතුමා කියන එක හරි. මෙහෙම කරන්නම්කෝ. පාරවල් නම් කරන්න ආපු යෝජනා ටික ගන්නකෝ. අරගෙන විරෝධතා කැඳවන්නකෝ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගිංතොට මාර්ගයක් ඒ දවස්වල නම් කරන්න යෝජනා කරලා ඔක්කොම කරා. දැන්වීමුත් දැම්මා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විරෝධතා කැඳවීම් කරනවා කියන්නේ දැන්වීම් 10 ක් විතර පාරේ අලවන එක. ඒක කල් දදා ඉන්න එපා. ඊළඟ සභාවට දාලා ඒකට තීන්දුවක් ගන්න. එතකොට අරහෙම කරන්න.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** කිතුලම්පිටිය එගොඩහවත්ත මාර්ගය නම් කරන්න කියලා යෝජනා කරා. වතාවල් කිහිපයකදීම සභාවේදී මතු කරා. ඊට පස්සේ එගොඩහවත්ත මාර්ගයේ සභාව මගින් දැන්වීම් පළ කරා. ඒ විරෝධතා ලැබුණද, නැද්ද කියලා දන්නේ නැහැ. ඒ පාර නම් වුණොත් නැහැ. දැන් අවුරුදු දෙකකට වැඩියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහෙද පාර,

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** කිතුලම්පිටිය එගොඩහ වත්ත පාර.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට විරෝධතා කැඳෙව්වා. ඒකට එක විරෝධතාවයක් ආවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ විරෝධතාවය ආවම ඒකට පරීක්ෂණයක් කරාද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විරෝධතාවයක් ආවොත් පරීක්ෂණයක් කරනවා. විරෝධතාවයක් නැත්නම් මාර්ගය නම් කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ පරීක්ෂණය සිදු කරලා ඒක කරලා දෙන්න කියලා ඉල්ලනවා. ඒ වගේම සභාපතිතුමා මේ ප්‍රගතියේදී සඳහන් වෙනවා අපට ජල බවුසරයක් ලබා ගත්තා කියලා. ඒක ඉතාම හොඳයි. ඊගාවට ප්‍රධාන කාර්යාලයේ වාහන සේදීමේ අංගනයක් ඉදිකරා කියලා තියෙනවා. ඇත්තටම මේක අංගනයක් නෙමෙයි. මේක වාහන සේදීමේ ස්ථානයක්. අංගනයක් කියන්නේ ඊට එහා ගිය එකක්. මේකට ස්ථානයක් කියලා කියන්න පුලුවන්. ඒක හදපු එක හොඳයි. ඒක අවශ්‍යයයි. ඒකට ස්තුති කරනවා. මම මේ පිළිබඳව ලේකම් මහත්තයා එක්කත් කතා කරා. ඒකට නිකම්ම නිකං ෆ්ලැට් කොන්ක්‍රීට් එකක් තමයි දාලා තියෙන්නේ. ඇත්තටම ප්‍රායෝගිකව එහෙම වාහනයක් සේදීම අපහසුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ආනතියක් තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මම ඒකට යෝජනා කරනවා ක්ලැම්ප් දෙකක් දෙපැත්තෙන් ඉදිකරන්න කියලා. එතකොට වාහනයක යට හෝදන්න පුලුවන්. වාහනයක යට පිරිසිදු වෙන්න ඕන. ඒ ගැන තීරණයක් ගන්න සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඉඩ ඇහිරෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, අපි විනාඩියක් බොහොම සාධාරණව ඇහුම්කන් දීලා ඉදිරියට යන්න බලමු. මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා පහුගිය කාලයේ දිගින් දිගටම වෙච්ච දේවල් වලට.

කපුහෙම්පල ජයසුන්දර මහතා බෝක්කුවක කතාවක් කියලා තියෙනවා. ඒකට සිලින්ඩර් දාලා හරි කරලා දෙන්න. ඒක ගැන ඔබතුමාටත් කියලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අන්න ඒ බෝක්කුව කරලා ඉවර කරමු. ඒක අපි සිලින්ඩර් දාලා ඉවර කරමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට සභාපතිතුමා මම හිතන්නේ අපේ තාක්ෂණ නිලධාරීන් හැම කෙනෙක්ම මේක ගිහින් බැලුවා නම් හොඳයි. මොකද අපිත් නොදන්න දේවල් තියෙනවා. එතුමාලත් නොදන්න දේවල් තියෙනවා. මවුන්ට් කැල්වරි එක ඉස්සරහ කාණුව දාලා තියෙනවා. මම ඊයෙත් ඒක ගැන ඔබතුමාට කිව්වා. ග්‍රෑන්ඩ් පැනරෝමා එකේ අච්චර කාණුවක් කොහොමද බලන්න එකේ දාලා තියෙන්නේ. හුණ්ඩු බෝක්කු දාලා තියෙන්නේ. ඒක හින්දා මින් ඉස්සරහට ඔබතුමා විශේෂයෙන්ම මේ නිලධාරී මහත්වරුන්ට කියන්න ප්‍රධාන කාණුවක් දාන කොට වතුර බැහැලා යන ප්‍රමාණය හිතලා වැඩ කරන්න කියලා.

ඊළඟට මම නැවතත් මේක ඉල්ලා සිටිනවා බෝගහවේල්ල පාර ගැන. ඇත්තටම දැන් මේ පාරවල් කාපට් කරගෙන යනවා. ඒක ඉතාම වැදගත්. හැබැයි භයානක තැන් තියෙනවා. දැන් නාවින්න පාර ගත්තොත් එහෙම හරිම භයානකයි. හැබැයි බෝගහවේල්ලේ පාරේ එක ඉතාම ලස්සනට නිවැරදි වේගෙන යනවා අයිනේ කාණු දාලා. ගරු සභාපතිතුමා මම හිතන්නේ අපි මෙතුමාට කියමු ගිහින් කතා කරන්න කියලා මහායානය පැත්තකින් තියලා. පාරේ ලස්සන ඒ සියල්ල එන්නේ ඒකෙන්. ඒ මිනිස්සු ඒක දෙන්න කැමතියි.

ඒක ගැන කතා කරලා කරන්න. ඔළුවේ දේවල් තියාගෙන ඉන්නේ නැතුව ගිහිල්ලා කතා කරලා ඒ වැඩේ කර ගන්න. ඒක දෙන්න ඒ මිනිස්සු කැමැත්තෙන් ඉන්නේ. පොඩි ස්තුතියක් කරන්න. ඔබතුමන්ට ජපානයට වුණත් යන්න පුලුවන්.

ඊළඟට කෙටියෙන් හරි මේවාට ඔබතුමා උත්තර දෙන්න. කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ තත්ත්වය පිළිබඳව සහ ගිංතොට තුනී ලැලි එක පිළිබඳව පොඩි සාරාංශයක් හරි දෙන්න. ඊළඟට තව එකක් කියන්න තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ දෙකේම ප්‍රගතිය නැහැ ඉතිං. අරකේ නඩුව යනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගැන විනාඩියක් කතා කරන්න ඕන.

සභාව සම්බන්ධවී සභාවේ මුදල් හෝ ප්‍රදේශයේ ජනතාවගේ මුදල් වලින් උත්සව පැවැත්වීමේදී දැන් මේ සියළු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන්න කියලා ඉල්ලා සිටිනවා. ආරාධනා කරාට සමහර ඒවාට මම නම් එන්නේ නැහැ. ඒ එන්නේ නැත්තේ වෙන වෙන ඒවත් එක්ක. නමුත් සියළු දෙනාටම ආරාධනා කරන්න ඒක ඇත්තටම වටිනවා. ඊළඟට ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් දෙයක්. ඕපාත කියන්නේ වමට වැඩියි සාදාකාලිකවම එක්සත් ජාතික පක්ෂයට වඩා. ඒ පාර ඉතාම වැදගත් පාරක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කාපට් කරන්න දාලා තියෙන්නේ. ඒකට ඇස්තමේන්තුවත් හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ලොකු දෙයක් ඒක දාලා තියෙනවානම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ටෙන්ඩර් කරලත් ඉවරයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට පාරක් නම් කරන්න මම යෝජනා කරලා ඇති ගොඩක් ඉස්සර. මේක දිගින් දිගටම මම අදාළ නිලධාරිණියන්ටත් මතක් කලා. විජයබන්දු කහඳුවවත්ත මාර්ගය ඒක. ඒ හිටපු සභාපතිවරයෙක්. මම ඒක කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම රණවිරුවෝ කරපු සේවය පොඩ්ඩක්වත් අඩුපාඩු කරන්න කියලා කියනවා නෙමෙයි මේ. රණවිරුවන් වෙනුවෙන් පාරවල් නම් කරන්න ගියොත් ඉඩත් හිටින්නේ නැහැ. ඒක හින්දා අපි කොහේ හරි තැනක ස්මාරකයක් හදලා ඒ වගේ වැඩපිළිවෙලක් හදමු.

ඊළඟට ගරු සභාපතිතුමනි, මම මේ නඩු ගැන කියන්නම්. දැන් අර පරාද වෙච්ච නඩුව තියෙනවා. මේ පරාද වෙච්ච නඩුවේ ඇත්තටම නඩු වාර්තාව අරගෙන බැලුවට පස්සේ ඒක තේරෙනවා. මේ නඩුව පරාද වුණාම අපි නීතිඥ මහතාට ඉඳගෙන දොස් කියනවා ඇති තරම්. හැබැයි මේ නඩුව පරාද වෙලා තියෙන්නේ මොකක්වත් නිසා නෙමෙයි. මේකෙ පෙන්වන්න තියෙන්නේ එකම දෙයයි සභාපතිතුමා. මහජනතාවට හිරිහැරයි, මෙතනින් දුම් යනවා. ශබ්දය ඇහෙනවා කියන එක නෙමෙයි. මේ පනතේ තියෙනවා නේද බොහොම පැහැදිලිවම නේවාසිකභාවය ගැන. ඒක විතරයි කියන්න ඕන. මේ ගිහිල්ලා භූත කියලා තියෙන්නේ. ඒකයි අපි කියන්නේ කරුණාකරලා නඩු දාන්න භාර දෙන ඒවා ගැන අපිට දන්වන්න. එතකොට අපිත් ගිහිල්ලා කියන්නම්. මේ නඩු දිනන්නේ නැත්නම් සභාවටත්, ඒක සවුත්තුයි. මේ නඩු පරාද වුණාම හොඳ නැහැ.

ඊළඟට ගරු සභාපතිතුමනි, අපි මේක දිගින් දිගටම ඉල්ලලා තියෙනවා. මේ නිලධාරී මහත්වරු දෙන්නා තුන්දෙනාටමත් ඒක කියන්න ඕන. දැන් වෙන්දේසිකාරයෝ කිසි දෙයක් ගැන සත පහකට ගණන් ගන්නේ නැහැ. දැන් පහුගිය 14 වෙනිදා තරංගා ලෑන්ඩ් සේල් ආයතනය ඉඩම් වෙන්දේසියක් කරා. ඒ අය බෝඩ් දැම්මා. ඒවා කැපුවෙත් නැහැ. මේ බෝඩ් කපන්න. මම ඒවා ඔබතුමාට පෙන්වන්නම්. ඔබතුමා බලන්න සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වල වර්ෂ දෙදහස් ගණන් වල පවා මම ගෙනල්ලා තියෙනවා මේවා කරන කොට දන්වන්න කියලා.

පැතුම් උයනේ වෙන්දේසිය පටන් ගන්න කොට අපි ඔබතුමන්ලා විරෝධය පානවා මේ සියළු දෙනාම එකතු වෙලා. එතකොට නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරිතුමිය මොකක්ද කියන්නේ. අපිට යන්න ඉඩකඩ නැහැ. ඒ නිසා තාක්ෂණ නිලධාරීන් ලබා දීපු වාර්තාව අනුව කරා කියලා කියනවා.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොඩි ගැටළුවක් තියෙනවා. අපිට දැන් තීරණයක් ගන්න බැහැ. සමහර මන්ත්‍රීවරු ගිහිල්ලා. එක්කෝ ප්‍රකාශයක් කරලා යන්න ඕන. මේක ඇත්තටම නරක ක්‍රමයක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැනට සණපූර්ණය තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සණ පූර්ණය තියෙනවා. නමුත් තීරණයක් ගන්න ඕන තැනකදී ඒක කරන්න බැහැනේ. අපිට ප්‍රකාශයක් කරලා යනවා නම් ඒක ගැටළුවක් නැහැ. ඩඩ්ලි මන්ත්‍රීතුමා කියලා ගියා. රංගනී මන්ත්‍රීතුමියත් කියලා ගියා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මමත් කියලා ගියා කෝල් එකක් ඇවිල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි. මම මන්ත්‍රීවරුන්ගෙන් ඒක ඉල්ලා සිටිනවා. ඉන්න අයට මේක කියලා වැඩකුත් නැහැ. ප්‍රශ්නයක් ආවොත් මන්ත්‍රීවරු ගියා කියලා නැහැ අධිභාර ගෙවන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට මම මේ මාතෘත්වයට පොඩ්ඩක්වත් හානි කරන්න මේක කියනවා නෙමෙයි. දැන් මම දන්න සමහර ආයතන තියෙනවා. ඩී.එස්.අයි. එකේ වැඩට ගන්නේ නැහැ තරුණ ළමයින්ව. ඒ මොකද, කසාද බැන්දම ප්‍රශ්න එනවා. වයසක කට්ටිය විතරයි ගන්නේ ඒවාට. ඒ සහතිකය අරගෙන එන්න ඕන ඉස්සර වෙලා.

ඊළඟට ඉතිං ගරු සභාපතිතුමනි, දැන් මේ අය කරන දේ තමයි, අපිට ආරංචියි නගරිගෙවත්තේ පාරවල් වල අලුත්වැඩියාව දැන් කරනවා කියලා. හැබැයි අඟල් 04 ගල් දාන්නේ නැතුව මොන හේතුවක් නිසාවත් ඒවා අනුමත කරන්න එපා. අඟල් 04 ගල් දාන්න ඕන. ඒ.බී.සී. දාලා, මේවා දාලා කරලා වැඩක් නැහැ. පාරවල් කැඩුණම මොකද කරන්නේ, අවුරුදු පහ පැනලා යනකම් එක අළුත්වැඩියාවක්වත් කරන්නේ නැහැ. හැබැයි ඒක තව මාස දෙකක් යනකොට නිකම්ම ගැලවිලා යනවා. ඒ හින්දා ඒ අය කරපු වැරැද්ද සම්පූර්ණයෙන්ම නිවැරදි කරන්න ඕන. එතකම් කිසිම දේකට අවසර දෙන්න එපා.

ඊළඟට කිසිම අණක් ගුණක් නැතුව තමයි රජගෙදර වත්තේ එක කරේ. දැන් එතකොට ඒක තියෙනවා. ඊළඟට දැන් කමණි තාක්ෂණ නිලධාරිතුමිය දන්නවා ඇති වතුර ටැංකිය පාරේ එදා අපි ගිහිල්ලා මේවා කරපු ඉඩම ගැන. එතකොට තද පල්ලම් තියෙන තැන කොන්ක්‍රීට් එක විතරයි දාන්න තිබුණේ. හැබැයි ඒකෙත් අඟල් දෙකේ එක ගලක් දාලා නැහැ. හැබැයි ඒවා නිවැරදි කරනකම් කොයි වෙලාවකවත් අනුමැතිය දෙන්න එපා. මේ විදියට ගියොත් වෙන්නේ අවුරුදු පහ යනකම් ඉන්නවා. ඒක කිට්ටු කරලා පොඩි පැච් ටිකක් දාලා යාවි. ඒක මාස තුනෙන් හතරෙන් ඉවරයි. දැනට කැඩි කැඩීනේ යන්නේ. ඉතිං මම හිතන්නේ අපි මේ ටික කරන්න ඕන.

ඊළඟට ඔබතුමන්ලාගේත්, ඔබතුමියන්ලාගේත්, තාක්ෂණ නිලධාරීන්ගෙන් වාර්තාවක් ඉල්ලුවා. ඒක තව වෙනකම් හම්බ වුණේ නැහැ. දැන් ඒක මේ සභාව කරපු වැරැද්දක් නෙමෙයි. ජල සම්පාදන මණ්ඩලයට යන පාරේ තරංගා ලෑන්ඩ් සේල් ආයතනය කරපු එක මේ. ඒක ක්‍රමයක් ඇතිව නෙමෙයි කරලා තියෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරිය තමයි මේකට අනුමැතිය දීලා තියෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරියට එරෙහිව කරන්න පුලුවන් දේවල් ගොඩක් තියෙනවා. ඒ වුණාට මම කියන්නේ ප්‍රගතිය තමයි වැදගත්ම දේ. ඒක හින්දා කරුණාකරලා අපි යෝජනා කරලා හරි ප්‍රගතිය ඉස්සරහට ගමු. මේ වන විට කාටත් යන්න ඕන කියන මට්ටමට එනවා. දැන් මේක කතා කරන්නේ නැත්නම් ඇත්තටම චමින්ද මන්ත්‍රීතුමා වැඩක් නැහැ. දැන් ඒකට පරිසර වාර්තාවක් නැහැ. එතනින් ගියාම පහත් බිම ගොඩ කරලා ඒ අගල විකුණනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද ඔය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ජල සම්පාදනයට යන පාරේ පල්ලමට යන තැන තියෙන්නේ. මම ඊයෙත් ඔබතුමාට පෙන්නුවේ මෙන්න මේවා.

දැන් එතකොට අර තට්ටු තුනේ ගෙදරට මොකක්ද ගනිපු තීන්දුව. දැන් මෙච්චර කල් ඉඳගෙන ඒක ගැන කියනවා. සහන දෙනවා, අරවා දෙනවා, මේවා දෙනවා, නිවැරදි කරනවා කියලා කියනවා. ඊළඟට ගොඩනැගිල්ලක උසත් එක්ක තියන්න ඕන ප්‍රමාණයත් තියෙනවා. හදන්න පුලුවන් ප්‍රමාණයක් තියෙනවා. ඉඩ තියන්න ඕන ප්‍රමාණයක් තියෙනවා. ඒවා අනුවද දැන් වැඩ කරලා තියෙන්නේ.

ඊළඟට ඇයි දැන් අපි තව කෙනෙකුව අමාරුවේ දාන්නේ. එහෙම හදාගෙන යනවා නම් දැනුවත් කරන්න ඕන. මන්ත්‍රීතුමන්ලා දැන ගන්න තව තට්ටු තුනේ ගෙයක් උඩින්ම හදනවා. ඒකට පහළ ඉඩම් කැල්ලේ

අයිතිය තියෙන්නේ අපිට. එතන ඉඩ තියෙන්නේ මේ හරිය, ඔය හරිය විතර. ඔබතුමන්ලා ඉන්න හරියේ විතර රිටෙන්ෂන් වෝල් එකක් දාලා මේක පුරවනවා. ඊට පහළින් තියෙන ඉඩම් කෑල්ල අපේ. අර මහත්තයාලගේ ටැංකිය කඩලා ගියා වගේ තමයි ඒකත් යන්නේ. උඩ කොච්චර හයියට දැම්මත්, යට මේවා පේන්නේ නැහැ. අනිත් එක මේකෙ වතුර බැහැලා යන්නේ කොහෙන්ද, වතුර බැහැලා යන්න තැනක් කොහේවත් නැහැ. ඉතිං ඒක හින්දා අපිට මේවා ගැන දැනුවත් කරන්න. මම දැන් තුන් හතර පාරක් ඉඳගෙන මේ ගැන කිව්වා. හැබැයි සමාවෙන්න. නමුත් මේක පැහැදිළිව සඳහන් කරන්න. මේ පාරවල් පිළිබඳව සහ කාණු පිළිබඳව. මේවා පිළිබඳව සම්පූර්ණයෙන්ම වගකියන්න ඕන හැම තාක්ෂණ නිලධාරියෙක්ම. මොකද එහෙම නැත්නම් මේක හරියන්නේ නැහැ. මේ අය අඩු ගාණේ මේක බලන්න ඕනනේ. බලන්න බැරි මොකක් හරි තියෙනවා නම් ඒකට මොකක් හරි ක්‍රමයක් හදන්න. එහෙම නැති වුණොත් ඒක ප්‍රශ්නයක්නේ. වරලත් ඉංජිනේරුවෝ ඉන්නවා. මේ අයගේ නම් ටික ගන්න. මම ගුණවර්ධන මහතාට නම් කතා කරලාම මේක කිව්වා. ඇයිද ඇහුවා ඔබතුමා මේ වගේ සහතික දෙන්නේ කියලා. එයා මේක ගැන දැනුවත් නැහැ, දැනුවත් කරපු එක හොඳයි කිව්වා. වරලත් ඉංජිනේරුවරයා මේකට සහතිකයක් දෙනවා. හැබැයි මේ මොන නිර්ණායකය දුන්නත් වැඩක් නැහැ. මම කඩලා පෙන්වන්නම්. අර අලුතෙන් කරන එකේ මම දෙයක් දැක්කා. ඒ අය දැම්මා පොඩි ඇස් බැන්දුමක්. ඒකෙ අඟල් 04 ගල් දාලා නැහැ. අඟල් 04 ගල් දාලා ඕන පාරවල් හදන්න. නැතුව හදන්න දෙන්න එපා. ඒක කියන්න. ඔබතුමන්ලා කියන්න ඕනනේ මෙහෙම හදන්න එපා කියලා. අඩු ගාණේ මේ මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න. එතකොට මේ අය ගිහින් බලනවානේ. එතකොට ඒකෙදී ඒ අය දන්නවා මේක නොකෙරුණොත් වෙන දේ. ඒක හින්දා නැවතත් අහනවා සභාපතිතුමා ඇත්තටම දැන් මේ වාර්තාවල් ටික අපිට කවදද දෙන්නේ. ඇත්තටම මේ නිලධාරී මහත්වරුන් ටිකට දිගින් දිගටම මේක ගැන කියලා තියෙනවා. වෙච්ච දේවලුත් කියලා තියෙනවා. මම ඊයේ ඔබතුමාට ඒවා පින්තූර එක්ක පෙන්නුවේ. දැන් මේකෙ අඩු ගාණේ ගොඩනැගිල්ලක් හදාගෙන එනකොට, රිටෙන්ෂන් වෝල් එකක් දාන්න ඕන නම් කොහොමද ඒක හදන්නේ. හැබැයි ඒකේ විල්බැරෝ එකක්වත් ගෙනියන්න බැහැ. ඉතිං මේකනම් තත්ත්වය සභාපතිතුමා අපි මේකට කෑ ගහලා මේවා කරලා වැඩක් නැහැ. බොහොම පැහැදිළිව අහන්න දැන් මේ සභාවට ඒවා දෙන්න කිව්වා. ඊළඟ සභාවට දෙන්න කිව්වා. නමුත් ඒවා හම්බ වුණේ නැහැ.

(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඒ ඉල්ලුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇයි බොහොම පැහැදිළිව අපි ගියානේ. අපි මන්ත්‍රීවරු හතර පස් දෙනෙක් ගියා. තැන් පෙන්නුවා මේක මෙහෙමයි කියලා. එක වෙලාවක මගෙන් ඉල්ලනවා ඒවායේ ලිපිගොනු හොයා ගන්න බැහැ කියලා. දැන් කරගෙන යන ඒවායේ ලිපිගොනු හොයා ගන්න බැහැ කිව්වොත් ඒක ප්‍රශ්නයක්නේ. ඊළඟට සභාපතිතුමා කරුණාකරලා කොහෙන් හරි පටන් ගන්න. අපේ සභාවට හිමි ඉඩම් කොටස් කොහෙද තියෙන්නේ කියලා බලන්න පරණ ඒවායේ. ඒවා ඉස්සෙල්ලම බලන්න. මේ තියෙන දේවල් හරි සාකච්ඡා කරලා බලන්න. වැටවල් ගහන්න ඒවායේ.

ඊළඟට විශේෂයෙන්ම වික්ලන්ඩ් ටෙරස් එකේ අපිට අයිති වෙච්ච ඉඩම් කොටස් මොකක්ද කියන එක බලන්න. වික්ලන්ඩ් ටෙරස් එකේ ලිපිගොනුව සභාවට ඉදිරිපත් කරන්න අපිට බලන්න. ඒ ලිපිගොනුව මෙහේද තියෙන්නේ. ඒක මතක් කරන්න තාක්ෂණ නිලධාරියාට. සභාපතිතුමා මෙතුමන්ලාගෙන් අහන්න අපිට ඒ වාර්තාව කවදද දෙන්න පුලුවන් කියලා. දැන් ඒකේ ප්‍රගතිය පිළිබඳව අපිට කියන්න. මොකක්ද දැන් ඒ තට්ටු තුනේ ගොඩනැගිල්ලට කරන්නේ. මොකක්ද ඒකට වෙලා තියෙන්නේ. හැබැයි ඒ මිනිස්සුන්ව අමාරුවේ දැම්මේ මේ නිලධාරීන්. මොකද ඒක හදන කොට ආශිර්වාද කරලා සද්ද නැතුව හිටියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා මෙම ගැටළු පිළිබඳව තාක්ෂණ නිලධාරිණි අයි. ඩී. කමණී චන්ද්‍රලතා මහත්මියට සභාව දැනුවත් කිරීම සඳහා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>කාරක සභා අවස්ථාව</u>**

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරිණි අයි. ඩී. කමණී චන්ද්‍රලතා මහත්මිය පහත අදහස් දක්වා සිටින ලදී.

- බටුවන්තුඩාව පාරේ ඇති තට්ටු තුනේ නිවසේ හිමිකරු විසින් නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුකූලතා සහතිකය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති බව සහ ඒ සඳහා අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇති බව.

- එම නිවසේ පිටුපස අවකාශය නිවැරදි කරන ලෙසත්, ඉන් පසු අනුකූලතා සහතිකය ලබා දීමට හැකි බව දැන් වූ බව.
- මේ සම්බන්ධව නිවසේ හිමිකරු වෙත පළමු සිහිකැඳවීම යොමුකර ඇති බව.
- සිහිකැඳවීම් තුනක් යොමු නොකර අධිකරණ ක්‍රියාමාර්ග ගත නොහැකි බව.
- නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුකූලතා සහතිකය ලබා ගැනීමට ඉල්ලා ඇති බැවින්, මේ සඳහා ක්‍රියාමාර්ග ගත නොහැකි බව.
- නාගරික සංවර්ධන අධිකාරියෙන් අදාළ නිවසේ හිමිකරු වෙත ලබා දුන් උපදෙස් සභාවට ගෙන්වා ගත් බව.

- මීට අමතරව මන්ත්‍රීවරුන්ට මෙම අනවසර ඉදිකිරීම සම්බන්ධව ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුදල් කමිටුවේ සාමාජික මන්ත්‍රීවරු රැඳී ඉන්න. මෙහෙමම අපි විනාඩි 15 ක් ආදාහනාගාරයේ ඉදිකිරීමේ යෝජනාව පිළිබඳව තීරණයක් ගන්න ඕන. ඒක නිසා කමිටුවේ සාමාජිකයන් විනාඩි 15 ක් රැඳී ඉන්න.

**සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

මීළඟ මහා සභා රැස්වීම 2021-04-09 වන සිකුරාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,<br>
සභාපති,<br>
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.